වවුනියා විශ්වවිද්‍යාලය



වාර්ෂික වාර්තාව

2022

වවුනියාව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව මඟින් 2022 වසරේ විශ්වවිද්‍යාල කාර්ය සාධනය පිළිබඳ ආයතනික දළ විශ්ලේෂණයක් සපයයි. මෙම වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශය (උසස් අධ්‍යාපන), විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ වවුනියාව විශ්වවිද්‍යාලය විසින් නියම කරන ලද සම්මත ආකෘතිය සහ මාර්ගෝපදේශ අනුගමනය කරයි.

දැක්ම

"තිරසාර වෙනසක් උදෙසා දැනුම වර්ධනය කිරීම සහ බෙදා හැරීම තුළින් විශිෂ්ඨත්වයේ ප්‍රමුඛතම මධ්‍යස්ථානයක් වීම."

මෙහෙවර

"ප්‍රාදේශීය හා ජාතික තිරසාර සංවර්ධනයක් උදෙසා උපාධිධාරීන් සවිබලගැන්වීමේ අභිමතාර්ථයෙන් අධ්‍යාපනික ගුණාත්මකභාවයෙන්, නව පර්යේෂණවලින් සහ ක්‍රියාකාරී සහයෝගීතාවයෙන් විශිෂ්ඨත්වය දැක්වීම."

අරමුණු

- උසස් අධ්‍යාපනයේ ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගැනීම සඳහා සියලුම අධ්‍යාපනික වැඩසටහන්වල අදාළත්වය සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- ජාත්‍යන්තරව සේවය කළ හැකි උපාධිධාරීන්ගේ සංඛ්‍යාව ඉහළ දැමීම .
- සම්පත් සහ පද්ධතීන්ගේ කාර්යක්ෂම සහ ඵලදායී කළමනාකරණය තුලින් යහපාලන බලය වැඩි දියුණු කිරීම.
- භෞතික සහ මානව සම්පත් සඵලදායී අධ්‍යාපනයක් සහ ඉගෙනුම් පරිසරයක් ලබා දෙන බවට සහතික කිරීම .
- ප්‍රාදේශීය සහ ජාතික සංවර්ධනයක් උදෙසා දැනුම ව්‍යාප්ත කිරීම .
- ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගිකත්වය, සහ ආගමික විවිධත්වය පිළිබඳ යුක්තිය සහ සාධාරණත්වය සහතික කිරීම .

පරමාර්ථ

- අධ්‍යාපනික වැඩසටහන්වල ගුණත්වය ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම සහතික වීම.
- උපාධි පාඨමාලාවල ජාතික සහ ජාත්‍යන්තර පිළිගැනීම ලබා ගැනීම.
- විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි භාෂාව, ආකල්පමය කුසලතා, තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණ කුසලතා වර්ධනය කිරීම.
- සියලුම උපාධි පාඨමාලාවල ශිෂ්‍ය කේන්ද්‍රීය හා සම්මිශ්‍රිත අධ්‍යයනය සහ අවසන් නිමැවුම පදනම් කරගත් අධ්‍යාපන ක්‍රම වැඩි දියුණු කිරීම.
- කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.
- කාර්ය මණ්ඩලයේ නිපුණත්වය වර්ධනය කිරීම .
- මූලික යටිතල පහසුකම් සහ මානව සම්පත් සැපයීම සහතික කිරීම .
- සියලුම කාර්ය මණ්ඩලයට සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට ඩිජිටල් සහ විද්‍යුත් සම්පත් ලබා දීම.
- ගුණාත්මක පර්යේෂණ සිදු කිරීමට අවශ්‍ය උනන්දුව සහ අභිප්‍රේරණය ඇති කිරීම .
- ජාතික හා ජාත්‍යන්තර සම්මේලන සංවිධානය කිරීම.
- ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, වාර්ගිකත්වය සහ ආගම නොසලකමින් සමාන අවස්ථා ලබා දීම සහතික කිරීම .
- විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් අතර සමගිය වර්ධනය කිරීම .

වටිනාකම්

- **විශිෂ්ඨත්වය:** අපගේ කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ සම්පූර්ණ හැකියාවන් ප්‍රයෝජනයට ගැනීම සඳහා ඔවුන්ගේ ඉහළම ප්‍රමිතීන් කරා ළඟා වීමට අපි අපේක්ෂා කරමු.
- **අවංක බව:** ඉටු කරන සෑම කාර්යයක්ම වෘත්තිමය සහ සදාචාරාත්මක ප්‍රමිතීන් මාලාවකට අනුව පවත්වා ගනිමු.
- **සාධාරණත්වය සහ සමානාත්මතාව:** සෑම අංශයකම සාධාරණත්වය හා සමානාත්මතාව සහතික කරන අතර විවිධත්වය ප්‍රවර්ධනය කරමු.
- **ප්‍රතිචාර්යතාව:** නවීකරණය සහ නිර්මාණශීලි වීමට කැපවීමෙන් කටයුතු කරන අතර ප්‍රාදේශීය සහ ජාතික සංවර්ධනයට දායක වෙමු.
- **විසරණය:** අධ්‍යයනය, අධ්‍යාපනය සහ පර්යේෂණය හරහා දැනුම බෙදාහරින්නෙමු.


උපකුලපතිවරයාගේ සමාලෝචනය

වවුනියා විශ්වවිද්‍යාලය වෙනුවෙන්, 2022 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව මෙහි දී ඉදිරිපත් කරමි. එය විශ්වවිද්‍යාලයේ ජයග්‍රහණ, ආවර්ජනය සහ ඉදිරි චින්තනයේ වසරක් විය. විශ්වවිද්‍යාලය 2021 අගෝස්තු 01 වන දින සිට ශ්‍රී ලංකාවේ 17 වන රාජ්‍ය විශ්වවිද්‍යාලය බවට පත් විය. කොවිඩ් - 19 වසංගතයෙන් ඇති වූ අභියෝග සහ ආර්ථික අර්බුදය සමඟ පසුගිය වර්ෂය තුළ අපගේ විශ්ව විද්‍යාල සභාව, කාර්යය මණ්ඩලය, ශිෂ්‍යයන් සහ අනෙකුත් ප්‍රජාවගේ සහයෝගය ඇතිව අපි බොහෝ දේ සාක්ෂාත් කර ඇත්තෙමු.

වවුනියා විශ්වවිද්‍යාලය දැනට පවතින ව්‍යවහාරික විද්‍යාව, ව්‍යාපාර අධ්‍යයනය සහ තාක්ෂණික අධ්‍යයනය යන පීඨ තුනකින් සිය අධ්‍යයන විශිෂ්ඨත්වය පවත්වාගෙන යයි. වවුනියා විශ්වවිද්‍යාලය පිහිටුවීමත් සමඟ ප්‍රාදේශීය සහ ජාතික සංවර්ධන අවශ්‍යතා මත පදනම්ව ප්‍රමුඛතා අනුපිළිවෙලින් පහත සඳහන් පීඨ යෝජනා කෙරේ: මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා; වෛද්‍ය; සෞඛ්‍ය විද්‍යාව; සංචාරක හා හෝටල් කළමනාකරණය; ජලජීවී වගාව; ධීවර හා සමුද්‍ර අධ්‍යයනය; පරිසර විද්‍යාව; පශු සම්පත් සහ උපාධි අධ්‍යයනය. ප්‍රමුඛතාවයක් ලෙස, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සහ වෛද්‍ය පීඨය පිහිටුවීමට කැමැත්තෙමු.

දේශීය හා ගෝලීය වශයෙන් අප මුහුණ දෙන අභියෝගවලට අප ප්‍රවේශ වන ආකාරය සහ ඒවාට මුහුණ දෙන ආකාරය පරිවර්තනය කරමින් විශිෂ්ඨ ගුණාත්මක පර්යේෂණ, ඉහළ ගුණාත්මක ඉගැන්වීම් සහ ප්‍රබල හවුල්කාරිත්වයන් මත අපි අපගේ කීර්තිනාමය ගොඩනඟා ඇත.

පසුගිය වසරේ දී විශ්වවිද්‍යාලය දේශීය හා ජාතික කර්මාන්ත සමඟ අවබෝධතා ගිවිසුම් 20ක් අත්සන් කරන ලදී. එය ශාස්ත්‍රීය හා කර්මාන්තය අතර ජාලයක් සහ සහයෝගීතාවයක් නිර්මාණය කළේ ය. මුඛ සෞඛ්‍ය සේවා ඒකකය සහ දැනට පවතින සෞඛ්‍ය මධ්‍යස්ථානය විවෘත කිරීමෙන් අපි අපගේ ආයතනික සෞඛ්‍ය සේවාව වැඩිදියුණු කර තිබේ. තව ද, විශ්ව විද්‍යාලය මඟින් සහයෝගිතා මධ්‍යස්ථානය, ආබාධ සහිත පුද්ගලයන් සඳහා සහාය මධ්‍යස්ථානය, ජාත්‍යන්තර කටයුතු අංශය, ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය, මහජන සම්බන්ධතා ඒකකය, සංස්කෘතික මධ්‍යස්ථානය, යහපැවැත්ම පිළිබඳ මධ්‍යස්ථානය සහ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය වැනි මධ්‍යස්ථාන සහ ඒකක ස්ථාපිත කරන ලදී.



අප විශ්වවිද්‍යාලය ව්‍යවසායකයන්ට, කර්මාන්තකරුවන්ට සහ ගොවීන්ට ව්‍යාපාර සායනය සහ කර්මාන්ත ප්‍රජා අන්තර්ක්‍රියාකාරී කණ්ඩායම් හරහා සහාය දක්වයි. අපගේ විද්වතුන් ශ්‍රී ලංකා ඇගයීම් ආයතනය හරහා පාර්ලිමේන්තුවට ප්‍රතිපත්ති සංවර්ධනයට සහාය දක්වයි.

ඉගැන්වීම ජීවිතය වෙනස් කරයි. අපගේ සිසුන් ද අපගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය 'විශිෂ්ඨ' ලෙස හඳුනාගෙන ඇත. අපගේ උපාධිධාරීන් ඉහළ නිපුණතා සහිත රැකියා සහ වැඩිදුර අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වේ. අපගේ උපාධිධාරීන් ඔවුන්ගේ වෘත්තීන්හි නවෝත්පාදනයන් පෙන්නුම් කරයි. සියලුම උපාධි වැඩසටහන්වල සීමාවාසික/කාර්මික පුහුණුව අදාළ කර්මාන්ත සමඟ සහයෝගයෙන් සිදු කරයි. එසේ ම විශ්ව විද්‍යාලය ඉන්දියානු සහ රුසියානු විශ්වවිද්‍යාල සමඟ නව හවුල්කාරිත්වයක් ආරම්භ කරන ලදී.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ නව හවුල්කාරිත්වයකට අප එළඹුණෙමු. එල්ලේ අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවලිය සහ අන්තර් විශ්වවිද්‍යාල හා අභ්‍යන්තර විශ්වවිද්‍යාල ක්‍රීඩා ඉසව් රැසකට සත්කාරකත්වය සැපයීමට අප විශ්වවිද්‍යාලය කටයුතු කළේ ය.
වසරේ සමාප්තිය සනිටුහන් කරන මේ මොහොතේ අපගේ කවුන්සිලයේ දායකත්වය සහ කැපවීම කෘතඥපූර්වකව පිළිගැනීමට කැමැත්තෙමි.

අනාගතයේ දී විශ්වවිද්‍යාලය ශාස්ත්‍රීය විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් ලෙස බැබළීමට සලස්වමු.

මහාචාර්ය ටී. මංගලේශ්වරන්
උප කුලපති

කාර්යසාධන සහ සිදුවීම්වල විශේෂ අවස්ථා 2022

- වවුනියා විශ්වවිද්‍යාලයේ සමාරම්භක උළෙල පෙබරවාරි මස 11 වන දින පැවැත්වී ය. මෙම අධ්‍යාපන ආයතනය ස්වාධීන විශ්ව විශ්වවිද්‍යාලයක් ලෙස ප්‍රථම වරට හඳුන්වාදීමේ අවස්ථාවේ ප්‍රධාන ආරාධිතයා වූයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හිටපු ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතා ය.
- සමාරම්භක දිනයේ දී අතිගරු ජනාධිපතිතුමා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සහ සහජීවනය ගොඩනැගීමේ මධ්‍යස්ථානය විවෘත කළේ ය.
- වවුනියා විශ්වවිද්‍යාලය සිය ප්‍රථම සංවත්සරය අගෝස්තු 01 දින සමරන ලදී.
- ඕස්ට්‍රේලියානු වෛද්‍ය ආධාර පදනමේ සහාය ඇතිව මුඛ සෞඛ්‍ය ප්‍රතිකාර ඒකකය ජූලි 18 වන දින පිහිටුවන ලදී.
- යාපනයේ ඉන්දියානු තානාපති, විශ්විද්‍යාල සංවර්ධන කටයුතු සහ ද්විපාර්ශවික සහයෝගීතාව පිළිබඳ සාකච්ඡා කිරීමට වවුනියා විශ්වවිද්‍යාලයට සැප්තැම්බර් මස 13 වන දින පැමිණියේ ය.
- බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් අතිගරු සාරා හල්ටන් මහත්මිය විශ්වවිද්‍යාල සංවර්ධන කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීමට ඔක්තෝම්බර් 4 වන දින වවුනියා විශ්ව විද්‍යාලයට පැමිණියා ය.
- ව්‍යවහාරික විද්‍යා පීඨය සිය තෙවන වාර්ෂික පර්යේෂණ සැසිය (FARS 2022) පවත්වන ලද අතර එහි රිදී ජුබිලිය නොවැම්බර් 2 වන දින සමරන ලදී.
- ව්‍යාපාර අධ්‍යයන පීඨය සිය සිව්වන ව්‍යාපාර අධ්‍යයන පර්යේෂණ සැසිය - 2022 (RCBS) පවත්වන ලද අතර එහි රිදී ජුබිලිය ජූලි මස 4 - 6 වැනි දින දක්වා සමරන ලදී.
- තාක්ෂණික අධ්‍යයන පීඨය තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ ප්‍රගමනය පිළිබඳ ප්‍රථම පර්යේෂණ සැසිය (RCAICT- 2022) ඔක්තෝබර් 4 වන දින පවත්වන ලදී.
- අධ්‍යයන සඟරා දෙකක්, වවුනියා විද්‍යා සඟරාව (අගෝස්තු, 2022), වවුනියා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ සඟරාව (නොවැම්බර්, 2022) එළි දක්වන ලදී.
- SLASSCOM විසින් ශිෂ්‍යයන් සහ මහජනතාව උදෙසා තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය පිළිබඳ වෘත්තීය ප්‍රදර්ශනයක් නොවැම්බර් 17 වැනි දින සංවිධානය කරන ලදී.
- ක්ෂුද්‍ර, කුඩා, මධ්‍ය පරිමාණ ව්‍යවසාය පහසුකම් මධ්‍යස්ථානය දෙසැම්බර් මස 20 වන දින ආරම්භ කරන ලදී.
- මහජන බැංකුවේ ස්වයං බැංකුකරණ ඒකකයක් නොවැම්බර් මස 17 දහහත් වන දින වවුනියා විශ්ව විද්‍යාලයේ දී විවෘත කරන ලදී.
- පාරිසරික විද්‍යා උපාධි පාඨමාලාවේ මිනුම් විද්‍යා පාඨමාලා ඒකකය හඳුන්වා දීම සඳහා ජර්මානු ජාතික මිනුම් විද්‍යා ආයතනයේ විදේශීය නියෝජිත කණ්ඩායම සහ ශ්‍රී ලංකා MUSSD ආයතනය නොවැම්බර් මස 22 වසි දෙවැනි දින විශ්වවිද්‍යාලයට පැමිණියහ.
- ජාත්‍යන්තර ආයතන හතරක්, වෘත්තීයමය සංවිධාන හයක් සහ වෙනත් ආයතන දහඅටක් එක්ව අප ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබී ය.

පටුන

උපකුලපතිවරයාගේ සමාලෝචනය v
කාර්යසාධන සහ සිදුවීම්වල විශේෂ අවස්ථා 2022 vi
විශ්වවිද්‍යාලය පිළිබඳව සැකෙවින් x
1 හැඳින්වීම 1
1.1 පසුබිම 1
1.2 සංවිධාන ව්‍යුහය 2
1.3 පාලන අධිකාරිය 3
1.3.1 පාලක සභාව 3
1.3.2 සනාතන සභාව 4
1.3.3 පාලන කමිටු රැස්වීම් 5
1.4 ශිෂ්‍ය සංගමය 5
1.5 මානව සම්පත 10
1.5.1 අනුමත සේවක සංඛ්‍යාව සහ දැනට සිටින කාර්යය මණ්ඩලය 11
1.5.2 **අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලය** 13
1.5.3 පරිපාලන හා මූල්‍ය කාර්ය මණ්ඩලය 15
1.5.4 අනධ්‍යයන කාර්ය මණ්ඩලය 16
1.6 අනෙකුත් සංවිධාන සමඟ සහයෝගිතාවය 16
1.7 ප්‍රජා ව්‍යාප්තිය 17
2 උපායමාර්ගික සමාලෝචනය 19
2.1 SWOT විශ්ලේෂණය 19
2.2 **අනාගත ක්‍රියාකාරී සැලැස්ම** 20
3 පීඨ, මධ්‍යස්ථාන සහ අංශ 24
3.1 ව්‍යවහාරික විද්‍යා පීඨය 24
3.2 ව්‍යාපාර අධ්‍යයන පීඨය 27
3.3 තාක්ෂණ අධ්‍යයන පීඨය 30
3.4 පුස්තකාලය 33
3.5 තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය 34
3.6 විශ්වවිද්‍යාල පර්යේෂණ හා ආචාර ධර්ම කමිටුව (UREC) 35
3.7 සෞඛ්‍ය මධ්‍යස්ථානය 36
3.8 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 37
3.9 ජාත්‍යන්තර අංශය 37
3.10 සහජීවන මධ්‍යස්ථානය 39
3.11 ආබාධ සහිත පුද්ගලයන් සඳහා උපකාරක මධ්‍යස්ථානය 40
3.12 සංස්කෘතික මධ්‍යස්ථානය 40
3.13 විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධය (UBL) 41
3.14 ශාරීරික අධ්‍යාපන ඒකකය 42
3.15 වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය (CGU) 43
3.16 ස්ත්‍රී පුරුෂ සමානතා සහ සමානාත්මතා සඳහා වන මධ්‍යස්ථානය (CGEE) 43
3.17 ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය 44
3.18 මහජන සම්බන්ධතා ඒකකය (PRU) 45

4 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන 46
4.1 හැඳින්වීම 46
4.2 සහරා/ප්‍රකාශන 47
4.2.1 ව්‍යවහාරික විද්‍යා පීඨය 47
4.2.2 ව්‍යාපාර අධ්‍යයන පීඨය 50
4.2.3 තාක්ෂණ අධ්‍යයන පීඨය 53
5 ප්‍රාග්ධන කටයුතු සහ සැලසුම්කරණය 55
5.1 හැඳින්වීම 55
5.2 ප්‍රධාන පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ කටයුතු 56
6 ශිෂ්‍ය සුභසාධනය 57
6.1 හැඳින්වීම 57
6.1.1 පීඨ ශිෂ්‍ය සංගම් 57
6.2 මූල්‍ය ආධාර 57
6.2.1 මහපොළ ශිෂ්‍යත්ව 57
6.2.2 ශිෂ්‍යාධාර 58
6.2.3 උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර 58
7 විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව 59
8 තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) 61
9 මූල්‍ය වාර්තා 64
9.1 දළ විශ්ලේෂණය 64
9.2 මූල්‍ය ප්‍රකාශනය 66
10 විගණකාධිපති වාර්තාව 85
10.1 වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් පාලන අධිකාරියේ නිරීක්ෂණය. 90

වගු නාමාවලිය

වගුව 1.1 බලධාරීන්ගේ රැස්වීම් 5
වගුව 1.2 උපාධිය අවසන් කළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විස්තර 6
වගුව 1.3: පීඨ මගින් ලබා දෙනු ලබන උපාධි පාඨමාලා 6
වගුව 1.4: උපාධි පාඨමාලා සඳහා නවකයන් - දේශීය ප්‍රවේශය 7
වගුව 1.5: විවිධ අධ්‍යයන මට්ටම් මත පදනම්ව මුළු බඳවා ගැනීම් 8
වගුව 1.6: උපාධි අපේක්ෂකයන් - අභ්‍යන්තර උපාධිධාරීන් 2022 9
වගුව 1.7: අනුමත සේවක සංඛ්‍යාව සහ දැනට සිටින කාර්යය මණ්ඩලය 11
වගුව 1.8: පීඨවල සහ පුස්තකාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය 14
වගුව 1.9: පරිපාලන හා මූල්‍ය කාර්යය මණ්ඩලය 15
වගුව 1.10: අනධ්‍යයන කාර්යය මණ්ඩලය 16
වගුව 4.1 ප්‍රකාශන සංඛ්‍යාව -ජාතික/ජාත්‍යන්තර, 2022 46
වගුව 7.1 පූර්ව විගණන කටයුතු 60


රූප සටහන් ලැයිස්තුව

රූප සටහන 1.1 සංවිධාන ව්‍යුහය 2
රූප සටහන 1.2 උපාධිය අවසන් කළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් - 2022 5
රූප සටහන 1.3 සිසුන් බඳවා ගැනීම 7
රූප සටහන 1.4 මානව සම්පත් 10
රූප සටහන 1.5 සේවක වර්ගීකරණය අනුව මුළු විශ්ව විද්‍යාල කාර්යය මණ්ඩලය (177) 13
රූප සටහන 1.6 අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලය 13
රූප සටහන 2.1 SWOT විශ්ලේෂණය 19
රූප සටහන 3.1 සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ලබන රෝගීන් සංඛ්‍යාව (රෝග අනුව) 36

විශ්වවිද්‍යාලය පිළිබඳව සැකෙවින්

උසස් අධ්‍යාපනය සඳහා ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා අවට පදිංචිකරුවන්ට අවස්ථා සලසා දීම අරමුණු කර ගනිමින් වර්ෂ 1990 ගණන්වල දී සියලුම පළාත්වල අනුබද්ධ විශ්වවිද්‍යාල (AUC) පිහිටුවන ලදී. උතුරු පළාත් අනුබද්ධ විශ්වවිද්‍යාලය (NPAUC) වර්ෂ 1991 දී වවුනියාවේ ස්ථාපනය කරන ලදී.

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 22 වැනි වගන්තිය යටතේ ව්‍යාපාර අධ්‍යයන පීඨය සහ ව්‍යවහාරික විද්‍යා පීඨය යන පීඨ දෙකකින් යුක්තව 1997 වර්ෂයේ අප්‍රේල් (01) වන දින උතුරු පළාත් අනුබද්ධ විශ්වවිද්‍යාලය (NPAUC) යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා මණ්ඩපය ලෙස උසස් කරන ලදී. තාක්ෂණ අධ්‍යයන පීඨය 2020 වර්ෂයේ දී පිහිටුවන ලදී.



මෙම උසස් අධ්‍යාපන ආයතනය කලාපයේ සියලුම ගැටුම් සහ ගැටුම් නොවන අභියෝගවලට මුහුණ දෙමින් දශක තුනක් මුලුල්ලෙහි ජාතියට මහඟු සේවයක් ඉටු කළේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වවුනියා මණ්ඩපය 2021 වර්ෂයේ අගෝස්තු (01) වන දින සිට වවුනියාව විශ්වවිද්‍යාලය ලෙස උසස් කරන ලදී. යාපනය විශ්වවිද්‍යාලයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාවට වවුනියා මණ්ඩපයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ තොරතුරු ද අන්තර්ගත වේ. 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව වවුනියා විශ්වවිද්‍යාලයේ ප්‍රථම වාර්ෂික වාර්තාවයි.

1 හැඳින්වීම

1.1 පසුබිම

වවුනියා විශ්වවිද්‍යාලයේ සමාරම්භක උළෙල පෙබරවාරි මස එකළොස් (11) වන දින පැවැත්වී ය. මෙම අධ්‍යාපන ආයතනය ස්වාධීන විශ්ව විශ්වවිද්‍යාලයක් ලෙස ප්‍රථම වරට හැඳින්වීමේ අවස්ථාවේ ප්‍රධාන ආරාධිතයා වූයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හිටපු ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතා ය.



සමාරම්භක උළෙල

වවුනියාව විශ්ව විද්‍යාලයේ ස්ථිර ස්ථානය වවුනියාවේ සිට මන්නාරම පාර ඔස්සේ පම්පයිමඩු සෝපාලපුලියන්කුලමේ කිලෝමීටර් (10) ක් පමණ දුරින් පිහිටා ඇත. ඉඩම් අක්කර (160) ක් අත්පත් කර ගන්නා ලදී.

කෙසේ වෙතත්, වවුනියා විශ්වවිද්‍යාලය ලෙස උසස් කිරීමට පෙර වවුනියා මණ්ඩපය 2010 වර්ෂය දක්වා නගර පරිශ්‍රයේ සිය කටයුතු පවත්වාගෙන ගියේ ය. ව්‍යාපාර අධ්‍යයන පීඨය එම ස්ථානයට මාරු කරන ලද අතර ව්‍යවහාරික විද්‍යා පීඨය සහ අනෙකුත් අධ්‍යයන හා පරිපාලන ශාඛා ද සමඟ 2011 වර්ෂයේ අගෝස්තු 01 වන දින සිට පවතින පහසුකම් මත තම කටයුතු සිදු කරගෙන ගියේ ය. පසුව, 2020 වර්ෂයේ දී පම්පයිමඩුහි තාක්ෂණ අධ්‍යයන පීඨය පිහිටුවන ලදී.


වවුනියා විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ පර්යන්ත කලාපයේ පිහිටා ඇති ජාතික විශ්වවිද්‍යාලයක් ලෙස සංවර්ධනය කිරීමේ අභියෝගයන්ට මුහුණ දෙමින් සිටියි. ක්‍රමක්‍රමයෙන් විශ්වවිද්‍යාලය ස්වකීය නවීන සහ ජාත්‍යන්තරික ස්වරූපය ගොඩනඟා ගනියි.

ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකින් ම පැමිණෙන ශිෂ්‍යයන්ට සහ කාර්යය මණ්ඩලයට විශ්වවිද්‍යාලය පිහිටි ස්ථානය පහසුවෙන් ප්‍රවේශ විය හැකි ලෙස පිහිටා තිබේ. විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ පරිසරය මඟින් ජාත්‍යන්තර තොරතුරු, සම්පත් මධ්‍යස්ථාන සහ පුස්තකාල වෙත පහසුවෙන් පිවිසීමට හැකියාව තිබේ. තව ද, වනය ආශ්‍රිත පරිසරය මඟින් ස්වභාව ධර්මය මත පදනම් වූ අධ්‍යාපනික පරිසරයකට පහසු මාවතක් නිර්මාණය කරයි. ඉගැන්වීම්, පර්යේෂණ සහ සමාජ සේවය කිරීම හරහා ආර්ථිකමය වශයෙන් ශක්‍ය නව ප්‍රවේශයන් වැලඳ ගනිමින් විශ්වවිද්‍යාලය සිය අරමුණු කරා සෙමින් ගමන් කරයි. සමාජ සංහිඳියාව, සංස්කෘතික විවිධත්වය, සමාන අවස්ථා සහ එකමුතුභාවය පෝෂණය කරන බහු සංස්කෘතික, බහු - වාර්ගික සහ බහු ආගමික ශිෂ්‍ය සහ කාර්යය මණ්ඩල ජනගහනයක් වවුනියා විශ්වවිද්‍යාලය සතු ය. ඉගැන්වීම්, ඉගෙනීම සහ පර්යේෂණ සඳහා බාධාවකින් තොර සන්නායක පරිසරයක් තුළ පීඨ සහ අනෙකුත් මධ්‍යස්ථාන සුමටව ක්‍රියාත්මක විය. කිසිදු බාධාවකින් තොර ඉගැන්වීම්, අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා මෙහෙයුම් පරිසරයක් තුළ පීඨ සහ අනෙකුත් මධ්‍යස්ථාන ඉතා මැනවින් කටයුතු කරයි.

2022 වර්ෂය තුළ අධ්‍යාපනය, පර්යේෂණ, සංස්කෘතිය, සුභසාධනය සහ වාණිජකරණය සඳහා පහසුකම් සැලසීමට විශ්වවිද්‍යාලය සහයෝගිතා මධ්‍යස්ථාන, ආබාධ සහිත පුද්ගලයන් සඳහා උපකාරක මධ්‍යස්ථානය, සංස්කෘතික මධ්‍යස්ථාන, ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය, මහජන සම්බන්ධතා ඒකකය, ජාත්‍යන්තර අංශය සහ විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධකය ස්ථාපිත කරන ලදී. පුළුල් කිරීමේ ව්‍යාපෘතිවල කොටසක් ලෙස ඉදිරි අනාගතයේ දී වෛද්‍ය පීඨය, සමුද්‍ර, ජලජීවී වගා හා ධීවර පීඨය, සෞඛ්‍ය විද්‍යා පීඨය, සංචාරක හා සත්කාරක පීඨය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, පාරිසරික විද්‍යා පීඨය, සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය යන පීඨ ස්ථාපිත කිරීමට විශ්වවිද්‍යාලය යෝජනා කළේ ය.

වර්තමානයේ, දෙපාර්තමේන්තු දහයකින් සමන්විත පීඨ තුනක් තුන්වන වසරේදී විකල්ප තේරීමක් ලෙස උපාධිය ලබා ගැනීමේ ක්‍රමයක් සමඟ වසර හතරක විශේෂ (ගෞරව) උපාධි පාඨමාලා අටක් පිරිනමයි. වවුනියා විශ්වවිද්‍යාලය දිවයිනේ සෑම ප්‍රදේශයකින් ම ශිෂ්‍යයන් බඳවා ගනිමින් තම ප්‍රජාව තුළ සමාජ සංහිඳියාව සහ සංස්කෘතික විවිධත්වය සාර්ථකව ප්‍රවර්ධනය කර ඇත.

1.2 සංවිධාන ව්‍යුහය



රූප සටහන 1.1 සංවිධාන ව්‍යුහය

1.3 පාලන අධිකාරිය

1.3.1 පාලක සභාව

1985 අංක 07 දරණ විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 24 වැනි වගන්තිය මගින් සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 44 වැනි වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල පාලක සභාව පිහිටුවන ලද අතර එය 2022 වර්ෂය තුළ පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

සභාපති	මහාචාර්ය ටී. මංගලේශ්වරන්	උපකුලපති
ලේකම්	එන්. රාජවිසාහන් මයා	ලේඛකාධිකාරී
පීඨාධිපතිවරුන්	මහාචාර්ය (මිය) ඒ. නන්දකුමරන් (ජුනි 16 දක්වා) ආචාර්ය (මිය) ජේ. නිමලන් (ජුනි 17 සිට)	පීඨාධිපති / ව්‍යවහාරික විද්‍යා පීඨය
	ආචාර්ය වයි. නන්දගෝපන්	පීඨාධිපති / ව්‍යාපාර අධ්‍යයන පීඨය
	එස්. එස්. එස්. සුදාහරන් මයා	පීඨාධිපති / තාක්ෂණ අධ්‍යයන පීඨය
සනාතන සභාවේ නියෝජිතයන්	ආචාර්ය එස්. විජේමෝහන්	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය Gr.II / ජීව විද්‍යා දෙපාර්තමේන්තුව
	මහාචාර්ය ඒ. පුෂ්පනාදන්	කළමනාකරණය පිළිබඳ මහාචාර්ය, ව්‍යවසායකත්ව සහ කළමනාකරණ දෙපාර්තමේන්තුව
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පත්කළ සාමාජිකයන්	ඉංජිනේරු, ඥානසේන ගෝනපීනුවල මයා	හිටපු දිස්ත්‍රික් ආණ්ඩුකාර, ජාත්‍යන්තර සිංහ සමාජ
	එච්. එම්. දමයන්ති හේරත් මෙනවිය (සැප්තැම්බර් 29 දක්වා)	නීතිඥ
	ආචාර්ය එස්. එන්. තනිගාසලම්පිල්ලෙ (සැප්තැම්බර් 30 සිට)	විශ්‍රාමික පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, උතුරු පළාත
	කේ.ජී.බ්‍රිටෝ මයා	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු ලේඛකාධිකාරී
	මහාචාර්ය ගාමිණී සේනානායක	සම්මානිත මහාචාර්ය, රුහුණු විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති
	වෛද්‍ය එම්. මලරාවන්	උපදේශක අක්ෂි විශේෂඥ, ශික්ෂණ රෝහල, යාපනය
	බී.එම්.හිෂාම් මයා	නීතීඥ / දිවුරුම් නොතාරිස් මහජන කොමසාරිස්
	ඉංජිනේරු එන්.ශ්‍රීස්කන්දරාසා මයා	හිටපු අධ්‍යක්ෂ/ වාරිමාර්ග

1.3.2 සනාතන සභාව

1985 අංක 7 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 46 (2) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල සෙනෙට් සභාව පිහිටුන ලද අතර 2022 වර්ෂය තුළ එය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

උපකුලපති	මහාචාර්ය ටී. මංගලේෂ්වරන්
පීඨාධිපතිවරුන්	
ව්‍යවහාරික විද්‍යා	මහාචාර්ය ඒ. නන්දකුමරන් මෙනවිය (ජුනි 16 දක්වා)
	ආචාර්ය ජේ. නිමලන් මෙනවිය (ජුනි 17 සිට)
ව්‍යාපාර අධ්‍යයනය	ආචාර්ය වයි. නන්දගෝපන්
තාක්ෂණ අධ්‍යයනය	එස්. එස්. සුදාහරන් මයා
පුස්තකාලාධිපති	එස්. සන්මුගදාසන් මයා (වැඩබලන)
දෙපාර්තමේන්තු ප්‍රධානීන්	
ජීව විද්‍යා දෙපාර්තමේන්තුව	ආචාර්ය ජේ. නිමලන් මිය (ජුනි 16 දක්වා)
	ආචාර්ය එස්. විජයමෝහන් (ජුනි 17 සිට)
භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව	ආචාර්ය එස් කිරුෂාන්ත්
ව්‍යාපාර ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව	පී. එම්. ගොඩ්වින් පිලිප් මිය
ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් දෙපාර්තමේන්තුව	ආචාර්ය ජී. ජෙයසීලන්
මුදල් හා ගණකාධිකරණ දෙපාර්තමේන්තුව	ආචාර්ය කේ. කලයිනාදන්
මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව	එස් හරිකරන් මයා
කළමනාකරණ සහ ව්‍යවසායකත්ව දෙපාර්තමේන්තුව	ආචාර්ය ඒ. රුක්ෂාන්
අලෙවි කළමනාකරණ දෙපාර්තමේන්තුව	ජූඩ් ලියෝන් මයා
ව්‍යාපෘති කළමනාකරණ දෙපාර්තමේන්තුව	එස්. තිරුඥානසම්පන්දර් මයා
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දෙපාර්තමේන්තුව	වී. සෙන්තූරන් මයා
මහාචාර්යවරු	
ව්‍යවහාරික විද්‍යාව	මහාචාර්ය ඒ. නන්දකුමරන් මිය (සැප්තැම්බර් 05 සිට)
තේරී පත් වූ සාමාජිකයන්	
ව්‍යවහාරික විද්‍යාව	ආචාර්ය ආර්. නගුලන්
	ආචාර්ය එස්. විජයමෝහන් (ජුනි 16 දක්වා)
	මහාචාර්ය ඒ. නන්තකුමාරන් මිය (අගෝස්තු 01 සිට සැප්තැම්බර් 04 දක්වා)
	බී. යෝගරාජා මයා (සැප්තැම්බර් 05 සිට)
ව්‍යාපාර අධ්‍යයනය	මහාචාර්ය ඒ. පුෂ්පනාදන්
	ජේ. එස්. දේවරුබන් මෙනවිය
තාක්ෂණ අධ්‍යයනය	පී. රුක්ෂානි මිය
	වී. විනෝහරන් මයා (මාර්තු 15 සිට)
ලේඛකාධිකාරී - සනාතන සභාවේ ලේකම්	එන්. රාජවිසාහන් මයා

1.3.3 පාලන කමිටු රැස්වීම්


සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාල බලධාරීන් සහ අනෙකුත් කණ්ඩායම් නිතිපතා රැස් විය. එක් එක් බලධාරීන්ගේ සහ කණ්ඩායම් සඳහා පවත්වන ලද රැස්වීම් ගණන පහත පරිදි වේ.

වගුව 1.1 බලධාරීන්ගේ රැස්වීම්

රැස්වීම්	නිතිපතා	විශේෂ
පාලක සභාව	11	1
සෙනෙට් සභාව	12	1
මූල්‍ය කමිටුව	12	
නිවාඩු සහ දීමනා කමිටුව	12	
විගණන සහ කළමනාකරණ කමිටුව	3	
පීඨ මණ්ඩල		
• ව්‍යවහාරික විද්‍යා පීඨය	12	9
• ව්‍යාපාර අධ්‍යයන පීඨය	9	1
• තාක්ෂණ අධ්‍යයන පීඨය	12	1

1.4 ශිෂ්‍ය සංගමය

2022 වර්ෂයේ දී ශිෂ්‍ය ජනගහනය 2326ක් විය. විශ්වවිද්‍යාලය ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධි පාඨමාලා 14ක් සඳහා පීඨ තුනෙහි ම ශිෂ්‍යයන් 708ක් ඇතුළත් කර ගත් අතර එම වසරේ ම ශිෂ්‍යයන් 307ක් උපාධි ලබා ගත්හ.




රූප සටහන 1.2 උපාධිය අවසන් කළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 2022

වගුව 1. 2 උපාධිය අවසන් කළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විස්තර

අධ්‍යයන පීඨය	දෙපාර්තමේන්තු	2021	2022
ව්‍යවහාරික විද්‍යා පීඨය	භෞතික විද්‍යාව (AMC and IT)	97	90
	ජීව විද්‍යාව	19	31
ව්‍යාපාර අධ්‍යයන පීඨය	ගණකාධිකරණය	42	48
	මානව සම්පත් කළමනාකරණය	12	10
	ව්‍යාපාර ආර්ථික විද්‍යාව	24	03
	අලෙවි කළමනාකරණය	02	17
	ව්‍යාපෘති කළමනාකරණය	34	38
	කළමනාකරණය සහ ව්‍යවසායකත්වය	25	18
තාක්ෂණ අධ්‍යයන පීඨය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පීඨය	--	52
එකතුව		255	307

වගුව 1.3 පීඨ මගින් ලබා දෙනු ලබන උපාධි පාඨමාලා

මණ්ඩපය / අධ්‍යයන පීඨය	උපාධි පාඨමාලාව	SLQF මට්ටම	භාෂා මාධ්‍යය
උපාධිය			
ව්‍යවහාරික විද්‍යාව	තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය	5	ඉංග්‍රීසි
	තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	ඉංග්‍රීසි
	ව්‍යවහාරික ගණිතය සහ පරිගණකකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය	5	ඉංග්‍රීසි
	පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	ඉංග්‍රීසි
	පාරිසරික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය	5	ඉංග්‍රීසි
	පාරිසරික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	6	ඉංග්‍රීසි
ව්‍යාපාර අධ්‍යයන	ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධිය	5	ඉංග්‍රීසි
	ගණකාධිකරණය සහ මූල්‍ය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය	6	ඉංග්‍රීසි
	ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය	6	ඉංග්‍රීසි
	මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය	6	ඉංග්‍රීසි
	අලෙවි කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය	6	ඉංග්‍රීසි
	ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය	5	ඉංග්‍රීසි
	ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය	6	ඉංග්‍රීසි
තාක්ෂණ අධ්‍යයන	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය	6	ඉංග්‍රීසි



රූප සටහන 1.3 සිසුන් බඳවා ගැනීම

වගුව 1.4: උපාධි පාඨමාලා සඳහා නවකයන් - දේශීය ප්‍රවේශය

අධ්‍යයන පීඨය	උපාධි පාඨමාලාව	බඳවා ගත හැකි සංඛ්‍යාව	බඳවා ගැනීම
ව්‍යවහාරික විද්‍යාව	ව්‍යවහාරික විද්‍යාව (භෞතික විද්‍යාව)	117	76
	ව්‍යවහාරික විද්‍යාව (ජීව විද්‍යාව)	121	67
	තොරතුරු තාක්ෂණ	143	112
ව්‍යාපාර අධ්‍යයන	කළමනාකරණ අධ්‍යයන (TV)	216	194
	ව්‍යාපෘති කළමනාකරණය	101	108
තාක්ෂණ අධ්‍යයන	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය	175	151
නව බඳවා ගැනීම්වල මුළු එකතුව– උපාධි අපේක්ෂකයන් – දේශීය ප්‍රවේශය		**873**	**708**

වගුව 1.5: විවිධ අධ්‍යයන මට්ටම් මත පදනම්ව මුළු බඳවා ගැනීම්

අධ්‍යයන පීඨය	උපාධි පාඨමාලාව	1 (2020/2021)		2 (2019/2020)		3 (2018/2019)		4 (2017/2018)		එකතුව		මුළු එකතුව
		පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	
ව්‍යවහාරික විද්‍යාව	ව්‍යවහාරික විද්‍යාව (භෞතික විද්‍යාව)	42	34	45	54	26	26	03	12	116	126	242
	ව්‍යවහාරික විද්‍යාව (ජීව විද්‍යාව)	06	61	21	66	14	36	12	18	53	181	234
	තොරතුරු තාක්ෂණය	53	59	46	77	38	52	--	17	137	205	342
ව්‍යාපාර අධ්‍යයන	කළමනාකරණ අධ්‍යයන (TV)	57	137	54	159	55	79	40	82	206	457	663
	ව්‍යාපෘති කළමනාකරණය	23	85	20	76	16	55	34	18	93	234	327
තාක්ෂණ අධ්‍යයන	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය	98	53	125	59	63	29	61	30	347	171	518
මුළු එකතුව		**279**	**429**	**311**	**491**	**212**	**277**	**150**	**177**	**952**	**1374**	**2326**


ස්ත්‍රී පුරුෂ භාවය අනුව, උපාධිය අවසන් කළ ශිෂ්‍යයන් 307 දෙනාගෙන් 58%ක් ස්ත්‍රී වේ. උපාධිය අවසන් කළ මුළු ශිෂ්‍යයන්ගෙන් 48%ක් පන්ති සාමාර්ථ ලබා ගෙන ඇත.

වගුව 1.6: උපාධි අපේක්ෂකයන් - අභ්‍යන්තර උපාධිධාරීන් 2022

අධ්‍යයන පීඨය	උපාධි පාඨමාලාව	උපාධිය ලබා ගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව									
		පළමු පන්ති සාමාර්ථ		දෙවන පන්ති ඉහළ සාමාර්ථ		දෙවන පන්ති පහළ සාමාර්ථ		සමත්		මුළු එකතුව	
		පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී
ව්‍යවහාරික විද්‍යාව	තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය	--	02	02	04	--	07	04	05	06	18
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධිය							03	01	03	01
	තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	--	01	01	08	02	08	01	--	04	17
	ව්‍යවහාරික ගණිතය සහ පරිගණකකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය	--	01	--	06	01	01	16	03	17	11
	පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	--	03	02	04	02	--	02	--	06	07
	පරිසර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය	--	--	--	04	01	02	07	10	08	16
	පාරිසරික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	01	04	01	--	--	01	--	--	02	05
ව්‍යාපාර අධ්‍යයන	ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය	01	01	03	07	02	10	03	11	09	29
	ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධිය	--	--	--	--	02	02	12	02	14	04
	අලෙවි කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය	--	02	03	02	--	02	05	03	08	09
	ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය	--	--	02	11	02	08	14	11	18	30
	මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය	--	--	01	01	--	05	02	01	03	07
	ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය	--	--	--	02	--	--	--	01	--	03
තාක්ෂණ අධ්‍යයන	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය	--	01	01	02	04	03	27	14	32	20
මුළු එකතුව		**02**	**15**	**16**	**51**	**16**	**49**	**96**	**62**	**130**	**177**

1.5 මානව සම්පත

2022 වර්ෂයේ දී, විශ්වවිද්‍යාලය අධ්‍යයන දෙපාර්තමේන්තු දහයකින් සමන්විත පීඨ තුනක අධ්‍යයන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. අධ්‍යයන කාර්යය මණ්ඩලය 70ක්, පරිපාලන කාර්යය මණ්ඩලය 14ක්, අධ්‍යයන සහාය කාර්යය මණ්ඩලය 9ක් සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලය සාමාජිකයන් 83කින් සමන්විත කාර්යය මණ්ඩල සාමාජිකයන්ගේ සහාය ඇතිව වවුනියා විශ්වවිද්‍යාලය සිය අරමුණු කරා ගමන් කරයි. වවුනියා මණ්ඩපය වවුනියාව විශ්වවිද්‍යාලය බවට පත්වන විට නව සේවක සංඛ්‍යාව 240ක් ඉල්ලුම් කළ ද සේවක සංඛ්‍යාව 23ක් පමණක් අනුමත කර තිබුණි.



රූප සටහන 1.4 මානව සම්පත්


1.5.1 අනුමත සේවක සංඛ්‍යාව සහ දැනට සිටින කාර්යය මණ්ඩලය

අනුමත සේවක සංඛ්‍යාව 342න් 177ක් ස්ථිරව පුරවා ඇත; 54ක් තාවකාලිකව පුරවා ඇති අතර 111ක් පුරප්පාඩු වී ඇත. අලුතින් පිහිටුවන ලද විශ්ව විද්‍යාලයක් ලෙස, අවශ්‍ය කාර්යය මණ්ඩලයෙන් 68%ක ප්‍රමාණයක් පමණක් සේවය කිරීමෙන් අවශ්‍ය සේවා සැපයීමේ අවශ්‍යතාවල සම්පූර්ණ ධාරිතාව සපුරාලීමේ අභියෝගයන්ට මුහුණ දෙයි.

වගුව 1.7: අනුමත සේවක සංඛ්‍යාව සහ දැනට සිටින කාර්යය මණ්ඩලය

සේවා කාණ්ඩය	මාණ්ඩලික කාණ්ඩය	වැටුප් කේතය	අනුමත සේවක සංඛ්‍යාව	වත්මන් කාර්යය මණ්ඩලය												ස්ථිර සේවක පුරප්පාඩු
				ස්ථිර			තාවකාලික			කොන්ත්‍රාත්			පැවරුම්			
				පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	
ප්‍රාථමික ශ්‍රේණිය	ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු	U – PL 1	75	09	04	13	02	01	03	-	-	-	-	-	-	62
	ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ පුහුණු	U – PL 2	13	08	-	08	-	-	-	-	-	-	-	-	-	05
	ප්‍රාථමික ශ්‍රේණිය - පුහුණු	U – PL 3	09	08	-	08	01	-	01	-	-	-	-	-	-	01
ද්විතීයික මට්ටම	කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන	U – MN 1	55	15	22	37	-	-	-	-	-	-	-	-	-	18
	කළමනාකරණ සහකාර - තාක්ෂණික	U – MT 1	12	05	01	06	-	-	-	-	-	-	-	-	-	06
	සහකාර නිලධාරීන් - 2 වන ඛාණ්ඩය	U – MN 2	02	01	01	02	-	-	-	-	-	-	-	-	-	-
	සහකාර නිලධාරීන් - 1 වන ඛාණ්ඩය	U – MN 3	05	02	02	04	-	-	-	-	-	-	-	-	-	01


	මාණ්ඩලික සහකාර/ අධි ජ්‍යෙෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර	U – MN 4	05	03	02	05	-	-	-	-	-	-	-	-	-	-
තෘතීයික මට්ටම	අධ්‍යයන සහායක - 2 වන ඛාණ්ඩය	U – AS 1	08	02	02	04	01	02	03	-	-	-	-	-	-	04
	කනිෂ්ඨ විධායක/ කළමනාකරුවන්	U – EX 1	13	05	03	08	-	-	-	-	-	-	-	-	-	05
	අධ්‍යයන සහායක - 1 වන ඛාණ්ඩය	U – AS 2	09	05	-	05	02	-	02	-	-	-	-	-	-	04
ජ්‍යෙෂ්ඨ මට්ටම	වෛද්‍ය නිලධාරී	U – MO 1	01	01	-	01	-	-	-	-	-	-	-	-	-	-
	ප්‍රධාන වෛද්‍ය නිලධාරී	U – MO 2	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
	මධ්‍යම මට්ටමේ විධායක	U – EX 2	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
	මධ්‍යම මට්ටමේ විධායක	U – EX 2(a)	06	03	-	03	-	-	-	-	-	-	01	-	01	03
	ජ්‍යෙෂ්ඨ විධායකවරු	U – EX 3	02	02	-	02	-	-	-	-	-	-	-	-	-	-
	කථිකාචාර්යය (පරිවාස)/කථිකාචාර්යය/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය	U – AC 3	86	36	33	69							03	-	03	17
	සහකාර මහාචාර්යවරු	U – AC 4														
	මහාචාර්යවරු/ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු	U – AC 5														
	මහාචාර්යවරු	U – AC 5	05	-	-	-	-	-	-	-	-	-	-	-	-	05
	උපකුලපති	U – AC 5	01	01	-	01	-	-	-	-	-	-	-	-	-	-
	ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති/ සහකාර පුස්තකාලයාධිපති	U – AC 3	02	01	-	01	-	-	-	-	-	-	-	-	-	01
	පුස්තකාලයාධිපති	U – AC 5	01	-	-	-	-	-	-	-	-	-	-	-	-	01
මුළු එකතුව			**310**	**107**	**70**	**177**	**06**	**03**	**09**	**-**	**-**	**-**	**04**	**-**	**04**	**133**



රූප සටහන 1.5 සේවක වර්ගීකරණය අනුව මුළු විශ්ව විද්‍යාල කාර්යය මණ්ඩලය (177)

1.5.2 අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලය

විශ්වවිද්‍යාලයට අනුයුක්තව අනුමත අධ්‍යයන කාර්යය මණ්ඩල සේවකයන් 95ක් සිටින අතර ඉන් 70ක් පුරවා ඇති අතර ඉතිරිය තාවකාලික පදනමින් බඳවා ගන්නා ලදී. පුරවන ලද සේවක සංඛ්‍යාව 70 න් 54% ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්යය මණ්ඩලය විය. තව ද, අනුමත තාවකාලික සේවක සංඛ්‍යාව 32ක් විශ්වවිද්‍යාලයේ සේවයේ යෙදෙයි.



රූප සටහන 1.6 අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලය

වගුව 1.8: පීඨවල සහ පුස්තකාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය

කාණ්ඩ		වැටුප් පරිමාණය	අනුමත කාර්යය මණ්ඩල සේවක සංඛ්‍යාව	පවතින පුරප්පාඩු			පුරප්පාඩු
				ස්ත්‍රී	පුරුෂ	මූළු එකතුව	
ජ්‍යෙෂ්ඨ මහාචාර්යය (සභාපති)		U AC 5 (I)	5	-	-	-	5
මහාචාර්යය (සභාපති)		U AC 5 (II)		-	-	-	
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය		U AC 5 (I)		-	-	-	
මහාචාර්යය		U AC 5 (II)	86	1	2	3	17
සහකාර මහාචාර්යය		U AC 4		-	-	-	
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය (I ශ්‍රේණිය)		U AC 3 (I)		6	6	12	
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)		U AC 3 (II)		4	19	23	
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (තාවකාලික)/ කථිකාචාර්ය (තහවුරු නොකළ)		U AC 3 (III)		-	2	2	
කථිකාචාර්යය		U AC 3 (IV)		3	2	5	
කථිකාචාර්යය (පරිවාස)		U AC 3 (IV)		19	5	24	
පුස්තකාලයාධිපති		U AC 5 (I)	1	-	-	-	1
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති (I ශ්‍රේණිය)		U AC 3 (I)	1	-	1	1	-
සහකාර පුස්තකාලයාධිපති		U AC 3 (IV)	1	-	-	-	1
එකතුව			**94**	**33**	**37**	**70**	**24**
අධ්‍යයන සහාකය කාර්යය මණ්ඩලය		U AS 2	9	-	5	5	4
		U AS 1	8	2	2	4	4
එකතුව			**17**	**2**	**7**	**9**	**8**
තාවකාලික සහකාර කථිකාචාර්යය	U AC 2 (ස්ථාවර)		7	18	3	21	-
තාවකාලික උප ආචාර්යය	U AC 1 (ස්ථාවර)		24	13	6	19	-
තාවකාලික උපදේශක	U AC 1 (ස්ථාවර)		1	-	-	-	1
එකතුව			**32**	**31**	**9**	**40**	**1**

1.5.3 පරිපාලන හා මූල්‍ය කාර්ය මණ්ඩලය

ස්ථිර සේවක සංඛ්‍යාව 22න් 14ක් පුරවා ඇති අතර, 4ක් කොන්ත්‍රාත් පදනම මත පුරවා ඇත. ස්ථිර සේවක සංඛ්‍යාව අටක පුරප්පාඩු පවතී.

වගුව 1.9 පරිපාලන සහ මූල්‍ය කාර්ය මණ්ඩලය

කාර්ය මණ්ඩලය	වැටුප් පරිමාණය	සේවක සංඛ්‍යාව	වත්මන් කාර්යය මණ්ඩලය						ස්ථිර සේවක පුරප්පාඩු
			ස්ථිර			තාවකාලික /අර්ධ කාලීන) ශ්‍රේණිවාර්ෂික නිවාඩුව(			
			පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	
ලේඛකාධිකාරී	U-EX 3 (I)	1	1	-	1	-	-	-	-
ශිෂ්‍යාධාර මුදල් භාරකරු	U-EX 3	1	1	-	1	-	-	-	-
නියෝජ්‍ය ලේඛකාධිකාරී /ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	U-EX 2	4	3	-	3	1	-	1	1
නියෝජ්‍ය ශිෂ්‍යාධාර මුදල් භාරකරු/ජ්‍යෙෂ්ඨ සහකාර ශිෂ්‍යාධාර මුදල් භාරකරු	U-EX 2	1	-	-	-	-	-	-	1
අධ්‍යක්ෂ/ භෞතික අධ්‍යාපන ඒකකය	U-EX 2	1	-	-	-	1	-	1	1
සහකාර ලේඛකාධිකාරී	U-EX 1	6	1	3	4	-	-	-	2
සහකාර ලේඛකාධිකාරී (නීති සහ ලේඛන)		1	-	-	-	-	1	1	1
සහකාර ශිෂ්‍යාධාර මුදල් භාරකරු	U-EX1	2	2	-	2	-	-	-	-
සහකාර අභ්‍යන්තර විගණක	U-EX 1	1	-	-	-	-	1	1	1
වැඩ ඉංජිනේරු	U-EX 1	1	1	-	1	-	-	-	-
ප්‍රධාන ආරක්ෂක නිලධාරී	U-EX 1	1	-	-	-	-	-	-	1
භාරකරු	U-EX 1	1	1	-	1	-	-	-	-
විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරී	U-MO 1	1	1	-	1	-	-	-	-
මුළු එකතුව		**22**	**11**	**3**	**14**	**2**	**2**	**4**	**8**

1.5.4 අනධ්‍යයන කාර්ය මණ්ඩලය

අනුමත සේවක සංඛ්‍යාව 176න් 83ක් පුරවා ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) 876 දරණ වක්‍රලේඛය සහ වර්තමාන මුදල් අමාත්‍යාංශ වක්‍රලේඛය හේතුවෙන් ශේෂය පිරවිය නොහැකි විය. එබැවින්, එදිනෙදා කටයුතු පහසුවෙන් ඉටු කර ගැනීමේ දී විශ්වවිද්‍යාලය ඇතැම් අභියෝගයන්ට මුහුණ දෙමින් පවතී.

වගුව 1.10: අනධ්‍යයන කාර්යය මණ්ඩලය

පීඨය/ ශාඛාව/ කොට්ඨාශය/ ඒකකය/ මධ්‍යස්ථානය	ලිපිකාර සහ අනුබද්ධ කාර්යය මණ්ඩලය	තාක්ෂණික කාර්යය මණ්ඩලය	ප්‍රාථමික කාර්යය මණ්ඩලය
ප්‍රධාන පරිපාලනය	23	-	16
මූල්‍ය පරිපාලනය	8	-	1
අභ්‍යන්තර විගණන ඒකකය	1	-	-
ව්‍යාපාර අධ්‍යයන පීඨය	5	1	2
ව්‍යවහාරික විද්‍යා පීඨය	4	4	4
තාක්ෂණ අධ්‍යයන පීඨය	-	1	1
පුස්තකාලය	4	-	3
භෞතික අධ්‍යාපනය	-	-	1
වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය	-	-	-
කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය	1	-	-
සෞඛ්‍ය මධ්‍යස්ථානය	1	1	-
තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය	-	-	1
එකතුව	**47**	**7**	**29**

1.6 අනෙකුත් සංවිධාන සමඟ සහයෝගිතාවය

විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර ආයතන, වෘත්තීය සංවිධාන සහ ආයතනික සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කර ඇත. මෙම සහයෝගිතාවය ශිෂ්‍යයන් සහ කාර්යය මණ්ඩල අතර සංහිඳියාව, පර්යේෂණ සහයෝගිතා සහ රැකියා අවස්ථා සඳහා අත්වැලක් විය.

ජාත්‍යන්තර ආයතන	• චත්‍රපති ෂාහූ ව්‍යාපාර සහ පර්යේෂණ ආයතනය • එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන • යන්කා කුපාල රාජ්‍ය විශ්වවිද්‍යාලය - ග්‍රොඩ්නෝ (බෙලාරුස් ජනරජය) • Ul.Y. යාකොව්ලෙව් චුවාෂ් රාජ්‍ය ශාස්ත්‍රීය විශ්වවිද්‍යාලය
වෘත්තීය සංවිධාන	• පුද්ගල කළමනාකරණ වරලත් ආයතනය (CIPM) • ව්‍යාපෘති කළමනාකරණ ආයතනය (PMI) • ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CMA) • ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM) • ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL) • සීමාසහිත ශ්‍රී ලංකා මෘදුකාංග සහ සේවා සමාගම් සංගමය- SLASSCOM (සහතිකලත්)
ආයතනික සංවිධාන	• සීමාසහිත hSenid ව්‍යාපාරික විසඳුම් පොදු සමාගම • Eighteen ප්‍රජා සහ කාර්මික සංවිධාන • සීමාසහිත Blue Lotus 360 පුද්ගලික සමාගම

1.7 ප්‍රජා ව්‍යාප්තිය

විශ්වවිද්‍යාල ප්‍රජාව ආයතනයෙන් පරිබාහිර මහජනයාට සහ සමාජයන්ට ප්‍රතිලාභ අත් කර දෙමින් නොයෙක් ආකාරයෙන් ප්‍රජා මට්ටමින් දායක විය.

- උතුරු පළාත් සමුපකාර මණ්ඩලය විසින් ඔක්තෝබර් (23) වන දින සංවිධානය කරන ලද "සමුපකාර සංවර්ධන නිලධාරීන් සඳහා වූ ව්‍යාපාර සහ ව්‍යාපෘති කළමනාකරණ අභියෝග" වැඩමුළුව
- අධ්‍යාපන අමාත්‍යාංශය, වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව විසින් ඔක්තෝබර් මස සිට නොවැම්බර් මස දක්වා සංවිධානය කරන ලද ගුරු සිසු දැනුම් බැංකු සම්මන්ත්‍රණ වැඩසටහන (ගුරු සිසු නැණ පවුරු සම්මන්ත්‍රණ වැඩසටහන)
- 2D/3D Virtual Navigation සහ Gamification හරහා සංචාරක ප්‍රවර්ධනය පිළිබඳ වැඩමුළුව මැයි 11 සහ 19 යන දිනවල පැවැත්විණි. එය සංචාරක හා පළාත් පාලන ආයතන, කර්මාන්ත සහ ප්‍රජා සංවිධාන විසින් පැවැත්වීම.
- කාන්තා දිනය වෙනුවෙන් වවුනියා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මාර්තු (11) වන දින සමුපකාර ශාලාවේ දී "තිරසාර අනාගතයක් උදෙසා වත්මන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය" යන මැයෙන් වැඩසටහනක් සංවිධානය කිරීම.
- වවුනියා විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් සංවිධානය කරන ලද "විශ්වවිද්‍යාල ප්‍රවේශය පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක්" සැප්තැම්බර් 13 වන දින පවත්වන ලද අතර ලාභ නොලබන සංවිධාන සඳහා ගිණුම්කරණය සහ කළමනාකරණ ගිණුම්කරණය පිළිබඳ සම්මන්ත්‍රණයක් වවුනියාව රම්බයිකුලම් බාලිකා මහා විද්‍යාලයේ අ.පො.ස (උසස් පෙළ) වාණිජ විෂය ධාරාව හදාරන (ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍ය) ශිෂ්‍යයන් සඳහා ඔක්තෝබර් 07 වන දින පැවැත්වීම.
- වවුනියා විශ්වවිද්‍යාලයේ විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධීකරන ඒකකය සහ වෙළෙඳ සංගමය එක්ව ඔක්තෝබර් (12) වන දින සංවිධානය කරන ලද වවුනියාව දිස්ත්‍රික්කයේ වෙළෙන්දන් සඳහා පවතින බදු අයකිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- සැප්තැම්බර් 13 වන දින පවත්වන ලද විශ්වවිද්‍යාල ප්‍රවේශ පත්‍රය පිරවීම, මාර්ගගත ලියාපදිංචිය, විශ්වවිද්‍යාල පාඨමාලා සහ වෘත්තීමය අවස්ථාවන් පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ වවුනියාව දිස්ත්‍රික්කයේ අ.පො.ස. උසස් පෙළ 2021 කණ්ඩායමේ ශිෂ්‍යයන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය.
- මන්නාරම, මාන්තෙයි බටහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු කළමනාකරණ කාර්යය මණ්ඩලය සඳහා ඇඩ්වෙන්ටිස්ට් සංවර්ධන සහ සහන නියෝජිතායතනය, ශ්‍රී ලංකාව (ADRA) මඟින් නොවැම්බර් 17 සහ 18 යන දිනයන්හිදී සංවිධානය කරන ලද දේශීය ආර්ථිකය හා සමාජය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය - අදියර II යටතේ "ඉංග්‍රීසි භාෂාවෙන් විද්‍යුත් තැපැල් සන්නිවේදනය සහ ලිපි ලිවීමේ කුසලතා" පිළිබඳ දෙදින වැඩමුළුව.
- මඩු කලාප අධ්‍යාපන බල ප්‍රදේශයේ ඉංග්‍රීසි ගුරුවරුන් සඳහා නොවැම්බර් 19 වැනිදා පවත්වන ලද "සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම" පිළිබඳ එක්දින වැඩමුළුව.
- වවුනියාව උතුරු කොට්ඨාශයේ කලාප අධ්‍යාපන කාර්යාලය විසින් නොවැම්බර් 11 වන දින වවුනියාව නෙල්ලුක්කුලම් කලෙයිමහල් මහා විද්‍යාල සිසුන් සඳහා සංවිධානය කරන ලද "අනාගත වෘත්තීන් සඳහා ඉලක්ක කිරීම" පිළිබඳ වැඩසටහන.
- ආබාධ සහිත පුද්ගලයින්ගේ ජාත්‍යන්තර දිනය වෙනුවෙන් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන්නි පුනරුත්ථාපන සංවිධානය (VAROD) විසින් දෙසැම්බර් 03 වන දින සංවිධානය කරන ලද "ආබාධිත පුද්ගලයන් සඳහා සංවර්ධන උපායමාර්ග සහ ප්‍රජා පාදක ව්‍යාපෘතීන්" යන මැයෙන් සිදු කරන ලද ආරාධිත කථාව.

- වවුනියාව රම්බයිකුලම් බාලිකා මහා විද්‍යාලයේ අ.පොෙ.ස (උසස් පෙළ) වාණිජ විෂය ධාරාව හදාරන සිසුන් (ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍ය) සඳහා ඔක්තෝබර් මස හත් වන දින 07 පවත්වන ලද ගිණුම්කරණ ප්‍රමිති (SLFRS 15 සහ 16) පිළිබඳ සම්මන්ත්‍රණය.
- ප්‍රජා ස්වේච්ඡා සේවකයන් සඳහා අප්‍රේල් 06 වන දින මුලතිව්, අමයිති තෙන්ඩ්‍රල් විසින් සංවිධානය කරන ලද "වෙළඳපල විශ්ලේෂණය" සහ "අලෙවිකරණ සැලැස්ම" පිළිබඳ පුහුණු වැඩසටහන.
- ලෝක සංචාරක දින සැමරුමේ දී "වව්නියාව සහ මන්නාරමේ සංචාරක අවස්ථා" යන මැයෙන් සැප්තැම්බර් 30 වන දින අනුරාධපුරයේ පැවති වැඩසටහන.
- උසස් පෙළ සමත් සිසුන් සඳහා සැප්තැම්බර් 13 වන දින පවත්වන ලද "විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රියා පිළිවෙළ - 2021/2022" පිළිබඳ සම්මන්ත්‍රණය
- වවුනියා විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් සැප්තැම්බර් 14 වන දින සංවිධානය කරන ලද "ගුරුවරුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන උපදේශන කුසලතා" පිළිබඳ සම්මන්ත්‍රණය
- ජාතික කම්කරු අධ්‍යයන ආයතනය විසින් අගෝස්තු 22 වන දින සංවිධානය කරන ලද "ඩිජිටල් පරිසරය සහ මානව ප්‍රාග්ධනය" පිළිබඳ වැඩසටහන
- කලාප අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සැප්තැම්බර් 30 වන දින සංවිධානය කරන ලද කලාප මට්ටමේ ඉංග්‍රීසි භාෂා නාට්‍ය තරඟාවලිය.
- වඩමාරච්චි අධ්‍යාපන කලාපයේ තාක්ෂණ විෂය ධාරාව හදාරන උසස් පෙළ සිසුන් ඉලක්ක කර ගනිමින් ඔක්තෝබර් මස 14 - 15 දිනවල පවත්වන ලද වැඩමුළු මාලාව.
- ව්‍යවහාරික විද්‍යා පීඨයේ AHEAD මෙහෙයුම යටතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ උසස් පෙළ ජීව විද්‍යා සිසුන් සඳහා ජූනි 04 වන දින වවුනියා විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ ජීව විද්‍යා අංශයේ රසායන විද්‍යා/ජීව විද්‍යා විද්‍යාගාරවල දී පවත්වන ලද විද්‍යාගාර ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රජා වැඩමුළුව
- වවු/අල් අක්සා මහා විද්‍යාලයේ ප්‍රාථමික පාසල් සිසුන් සඳහා සැප්තැම්බර් 01 වන දින පවත්වන ලද පාරිසරික සංචාරක ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන
- 11 වන ශ්‍රේණියේ අ.පොෙ.ස. (සා.පෙළ) සිසුන් සඳහා ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සම්බන්ධයෙන් සැප්තැම්බර් 03 වන දින පවත්වන ලද පරිසර විද්‍යා උපාධි පාඨමාලාව
- වවුනියාව දිස්ත්‍රික්කයේ මහජනතාව උදෙසා විද්‍යුත් අපද්‍රව්‍ය එකතු කිරීම සහ වැලැක්වීම පිළිබඳ සමාජ අධ්‍යාපන වැඩසටහන මඟින් පවත්වන ලද වවුනියාව ගාමිණී ජාතික පාසලේ 9 සහ 10 ශ්‍රේණි සිසුන් (සිංහල සහ දෙමළ මාධ්‍ය) සඳහා විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ලඳු කැලෑ තුළ අධ්‍යාපන චාරිකාවක් සමඟින් පරිසර පද්ධති සමතුලිතතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- වවුනියාව ගාමිණී ජාතික පාසලේ සහ අල් අක්සා මහා විද්‍යාලයේ 6 වන ශ්‍රේණියේ පාසල් සිසුන් සඳහා ඔක්තෝබර් 3 සහ 7 යන දෙදින තුළ පවත්වන ලද "පරිසරය" යන තේමාව යටතේ චිත්‍ර තරඟය.
- තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය විසින් වඩමාරච්චි අධ්‍යාපන කලාපයේ උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාව හදාරන සිසුන් ඉලක්ක කර ගනිමින් එක් වැඩමුළුවක් 2021 වර්ෂයේ දෙසැම්බර් මස සහ අනෙක් වැඩමුළුව 2022 වර්ෂයේ ඔක්තෝම්බර් මස ලෙස අඛණ්ඩව දෙවරක් සංවිධානය කරන ලද මාර්ගෝපදේශන වැඩමුළු.

2 උපායමාර්ගික සමාලෝචනය

විශ්වවිද්‍යාලය විසින් 2022 - 2026 වර්ෂ සඳහා පස් අවුරුදු උපායමාර්ගික කළමනාකරණ සැලැස්ම සහ 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත. කෙසේ වුව ද, කෝවිඩ් - 19 වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් 2022 ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී විශ්වවිද්‍යාලයට දැඩි පීඩාකාරී අභියෝගයන්ට මුහුණ දීමට සිදු විය.

2.1 SWOT විශ්ලේෂණය

ශක්තීන්
- ස්ථානය වෙනත් පළාත්වලට ප්‍රවේශ විය හැකි වීම.
- බහු සංස්කෘතික සහ බහු භාෂා.
- වෘක්ෂලතා සහ සත්ත්ව විශේෂ සහිත භූමිය.
- ස්වභාවික සම්පත් - වනාන්තර, වැව්, ගොවිපළ.
- අපගේ උපාධිධාරීන්ගේ ඉහළ රැකියා අනුපාතය.
- ඉංග්‍රීසි භාෂා මාධ්‍ය පාඨමාලා.
- කර්මාන්ත සහ ප්‍රජාවන් සමඟ ඇති සහයෝගීතාවය.
- තරුණ කැප වූ කාර්යය මණ්ඩලය.

දුර්වලතා
- ජ්‍යෂ්ඨ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම.
- ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම් සහ අනෙකුත් පහසුකම්.
- විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට සහ කාර්යය මණ්ඩලයට සපයන අවම නේවාසික පහසුකම්.
- කලාපීය සංවර්ධනයට දායක වීමට ඇති සීමිත හැකියාව.
- පශ්චාත් උපාධි සහ බාහිර පාඨමාලාවන්ගේ පවතින හිඟය.
- ආදායම් උත්පාදන කාර්යයන්වල යෙදීමේ හිඟය.
- ඉහළ දර්ශක සඟරා ප්‍රකාශන සිදු කිරීම අවම වීම.
- ප්‍රමාණවත් නොවන මූල්‍ය ප්‍රතිපාදන.

SWOT

අවස්ථා
- ඵලදායී සහයක් ලබා දෙන කාර්මික ප්‍රජාවන්.
- ප්‍රාදේශීය සංවර්ධනයේ අවශ්‍යතා.
- කලාපීය ස්වභාවික සම්පත්.
- කලාපීය මානව සම්පත් ධාරිතාව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය.
- කලාපීය පර්යේෂණ සඳහා පවතින අවශ්‍යතාවය.
- වන්නි ප්‍රදේශය අවට වෘත්තීය ආයතනවල අවශ්‍යතාවය.
- විශ්වවිද්‍යාලයට ඩයස්පෝරාවේ සහය.

තර්ජන
- වෙනත් අධ්‍යාපන ආයතනවලින් ඇති තරඟය.
- රාජ්‍ය නොවන සහ විදේශීය විශ්වවිද්‍යාලවලින් ඇති තරඟය.
- අස්ථාවර දේශපාලන හා ආර්ථික තත්ත්වය.
- භාණ්ඩාගාර අරමුදල් වෙන්කිරීමේ හිඟකම.
- කෝවිඩ් - 19 වසංගත බලපෑම.

රූප සටහන 2.1 SWOT විශ්ලේෂණය

2.2 අනාගත ක්‍රියාකාරී සැලැස්ම

ඉලක්ක 01: උසස් අධ්‍යාපනය තුළ ජාත්‍යන්තර පිළිගැනීමක් අත්කර ගැනීම සඳහා සෑම අධ්‍යයන වැඩසටහනකම ගුණාත්මකභාවය සහ අදාළත්වය වර්ධනය කිරීම.

සියලුම අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහතික කිරීම සහ වර්ධනය කිරීම සඳහා තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) විශ්වවිද්‍යාලය විසින් ස්ථාපිත කරන ලදී. අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ගුණත්වය අවසානයේ අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මක තත්ත්වය නිර්ණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, විදේශීය විශ්වවිද්‍යාලයන්හි ආචාර්ය උපාධි පාඨමාලාවන් (PhDs) හැදෑරීමට සහ ඔවුන්ගේ පවතින උපාධි පාඨමාලාවන් සඳහා ජාත්‍යන්තර පිළිගැනීම ලබා ගැනීමට විශ්වවිද්‍යාලය එහි කාර්යය මණ්ඩලය දිරිමත් කළේ ය. එහෙයින්, උසස් ගුණාත්මක තත්ත්වයේ අධ්‍යයන අවස්ථා ලබා ගැනීමේ දී සහ ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය කර ගැනීමේ දී කාර්යය මණ්ඩලයට සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට අත්වැලක් වීමට විශ්වවිද්‍යාලය විසින් විදේශීය විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් (MOUs) අත්සන් කරන ලදී.

තාක්ෂණික ප්‍රගතිය සහ නව සාමාන්‍ය තත්ත්වයන්ගේ පෙළඹවීමෙන් ඩිජිටල් වේදිකාව මත පදනම් වීමේ ප්‍රතිඵලයක් ලෙස සියලුම කාර්යය මණ්ඩලය සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා ඩිජිටල් සහ විද්‍යුත් සම්පත් ලබා ගැනීමේ හැකියාව විශ්වවිද්‍යාලය විසින් සහතික කරන ලදී. එසේ ම, දැනුම තවදුරටත් වර්ධනය කර ගැනීමේ දී ශිෂ්‍යයන්ගේ උනන්දුව වැඩි දියුණු කිරීම සඳහා කාලීන අවශ්‍යතා සහිත පොත්පත් සහ විද්‍යුත් සම්පත් මිලදී ගැනීමට පුස්තකාල නිලධාරීන් දිරිමත් කරන ලදී. තව ද, ශිෂ්‍යයන්ගේ ප්‍රායෝගික කුසලතා සහ සමාජ සංහිඳියාව සංවර්ධනය කිරීමට විෂය මාලාව සංශෝධනය කරන ලදී.

රටේ සමාජ හා අධ්‍යාපනික ප්‍රමිතීන් වර්ධනය කිරීම සඳහා ශිෂ්‍යයන් සහ කාර්යය මණ්ඩලය අතර සමාජ සුපෝෂණය සහ උසස් තත්ත්වයේ පර්යේෂණ කටයුතු විශ්වවිද්‍යාලය දැඩි ලෙස අවධාරණය කළේ ය. මෙම ඉලක්කය කරා ළඟා වීම සඳහා විශ්වවිද්‍යාලය ජාතික හා ජාත්‍යන්තර වෘත්තීය සංවිධාන සමඟ සහයෝගී පර්යේෂණ සම්මන්ත්‍රණ පැවැත්වී ය. එසේ ම, කාර්ය මණ්ඩල සහ ශිෂ්‍ය පර්යේෂණ සම්මාන යෝජනා ක්‍රමය තුළින් කාර්යය මණ්ඩලය සහ ශිෂ්‍යයන්ට තම පර්යේෂණ දර්ශක ජර්නලයන්හි පළ කිරීමට දිරිමත් කෙරිණි.**අරමුණු**

- 2026 වර්ෂය වන විට ආචාර්ය උපාධියක් (PhD) හෝ ඊට සමාන අධ්‍යාපන සුදුසුකම් සහිත අධ්‍යයන කාර්යය මණ්ඩලයක් ඇති කිරීම.
- උපාධි පාඨමාලාවන් සඳහා ජාතික/ජාත්‍යන්තර පිළිගැනීම් ලබා ගැනීම.
- සියලුම කාර්යය මණ්ඩලයට සහ ශිෂ්‍යයන්ට ඩිජිටල් සහ විද්‍යුත් සම්පත් වෙත ප්‍රවේශ වීමට හැකි පරිසරයක් උදා කර දීම.
- පුස්තකාලයේ පොත්පත්, ලේඛන එකතුව සහ පුස්තකාල භාවිතය වැඩි කිරීම.
- සියලුම ශිෂ්‍යයන් සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පහසුකම් සඳහා ප්‍රවේශය ලබා දීම.
- කාර්යය මණ්ඩලය සහ ශිෂ්‍යයන් අතර LMS සහ VLE භාවිතය වැඩි දියුණු කිරීම.
- විෂය සමගාමී ක්‍රියාකාරකම් ලෙස ප්‍රායෝගික කුසලතා සංවර්ධනය සහ සමාජ සංහිඳියාව ශක්තිමත් කිරීම ඇතුළත් කිරීම.
- විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා පවතින පහසුකම් වැඩිදියුණු කිරීම.
- කලාපීය සහ ජාතික අවශ්‍යතා සහ ගැටළු සපුරාලීම උදෙසා පර්යේෂණ සිදු කිරීමට අධ්‍යයන කාර්යය මණ්ඩලය සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් පෙළඹවීම.
- ජාතික හා විදේශීය විශ්වවිද්‍යාල සහ ආයතන සමඟ අන්තර් සහයෝගීතා වැඩසටහන් හඳුන්වා දීම.
- විදේශීය උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහළ දැමීමට කටයුතු කිරීම.
- උපාධි පාඨමාලාවන්ගේ තත්ත්ව ආරක්ෂණය සහ වැඩිදියුණු කිරීම යනාදිය සහතික කිරීම.

ඉලක්ක 02: ගෝලීය වශයෙන් රැකියා කළ හැකි උපාධිධාරීන් සංඛ්‍යාව ඉහළ දැමීම

උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය, විශ්වවිද්‍යාලයේ සාර්ථකත්වය මැන බැලීම සඳහා යොදා ගෙන ඇත. උපාධිධාරීන්ට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් රැකියා සොයාගත හැකි වුව ද, එම උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය තවමත් අභියෝගයක් වී ඇත. ජාතික හා ජාත්‍යන්තර රැකියා වෙළෙඳපොළ අවශ්‍යතා සපුරාලීම සඳහා විශ්වවිද්‍යාලය විසින් නව උපාධි පාඨමාලාවන් හඳුන්වා දෙන ලදී. එසේ ම,

උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය සහතික කිරීම සඳහා ඔවුහු රැකියා ආයතන/ සංවිධාන සමඟ අවබෝධතා ගිවිසුම් (MOUs) ද අත්සන් කළහ.

සමස්ත රැකියා නියුක්තිය වර්ධනය කිරීම සඳහා පවතින විෂයමාලා කාලානුරූපව සමාලෝචනය කර සංශෝධනය කරන ලදී. තව ද, ගෝලීය රැකියා වෙළඳපොල ඉල්ලීම් මත පදනම්ව, නව උපාධි පාඨමාලාවන්, පශ්චාත් උපාධි පාඨමාලාවන් සහ දුරස්ථ අධ්‍යයන පාඨමාලාවන් සඳහා විශ්වවිද්‍යාලය විසින් නව යෝජනා ඉදිරිපත් කරන ලදී.

අධ්‍යාපනික පසුබිම පරයමින් වර්තමානයේ බොහෝ සේවා යෝජකයෝ ආකල්ප, ප්‍රායෝගික අත්දැකීම් ප්‍රායෝගික කුසලතා කෙරෙහි අවධානය යොමු කරති. එහි ප්‍රතිඵලයක් ලෙස භාෂාව, ප්‍රායෝගික කුසලතා සහ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යයනය වැඩිදියුණු කිරීමට පියවර ගන්නා ලදී. බොහෝ අධ්‍යයන පාඨමාලා විෂයමාලාවේ සීමාවාසික පුහුණුව සහ අදාළ ප්‍රායෝගික අංශයට සීමා වූ චාරිකා ඇතුළත් විය. එපමණක් නොව තත්ත්ව සහතිකය තුළින් විශ්වවිද්‍යාලයේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු විය. එය උපාධි අපේක්ෂකයින්ට අවස්ථා ලබා ගැනීමට උපකාර විය.

අරමුණු

- නැගී එන දැනුම අවශ්‍යතා සපුරාලීම සඳහා විශ්වවිද්‍යාලය තුළ නව පීඨ ඇති කිරීම.
- පීඨ තුළ නව උපාධි පාඨමාලාවන් හඳුන්වා දීම
- පීඨවල නව අංශ පිහිටුවීම.
- ජාතික හා ගෝලීය අවශ්‍යතා සපුරාලීමට සහ සමස්ත රැකියා නියුක්තිය ඉහළ නැංවීම සඳහා සියලුම අභ්‍යන්තර හා බාහිර උපාධි පාඨමාලාවන්හි විෂය මාලාව සංශෝධනය කිරීම.
- පශ්චාත් උපාධි පාඨමාලාවන් සහ වෘත්තීය මධ්‍යස්ථාන පිහිටුවීම.
- පශ්චාත් උපාධි පාඨමාලාවන් හඳුන්වා දීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන පාඨමාලා හඳුන්වා දීම.
- ප්‍රායෝගික කුසලතා පිළිබඳ ශිෂ්‍යයන්ගේ නිපුණත්වය වර්ධනය කිරීම.
- සියලුම උපාධි පාඨමාලාවන්හි ශිෂ්‍ය කේන්ද්‍ර කරගත් සහ සම්මිශ්‍රිත අධ්‍යයන හෙවත් නිමැවුම පදනම් කරගත් අධ්‍යාපන ක්‍රම (OBE) වැඩි දියුණු කිරීම.
- උපාධි පාඨමාලාවන් හදාරන ශිෂ්‍යයන්ගෙන් අවම වශයෙන් 85% ක උපාධි අපේක්ෂකයන් ප්‍රමාණයකගේ සීමාවාසික පුහුණුව වැඩි කිරීම.
- ආයතනය සහ පාඨමාලාවන් සමාලෝචනය හරහා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම (IR සහ PR මඟින් ලබා දී ඇති නිර්දේශ අනුගමනය කිරීම)
- අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන් බඳවා ගැනීම වසරකට 20%කින් ඉහළ දැමීම.

ඉලක්ක 03: සම්පත්වල සහ පද්ධතීනිගේ ඵලදායී හා කාර්යක්ෂම කළමනාකරණයක් තුළින් යහපාලනය වර්ධනය කිරීම.

යහපාලනය තුළින් විනිවිදභාවය, නීති පිළිපැදීම, සහභාගීත්වය සහ වගවීම යනාදිය පාර්ශ්වකරුවෝ අපේක්ෂා කරති. විශ්වවිද්‍යාලය මෙම ඉලක්කයට සහය වීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) යෝජනා කළේ ය. සංවර්ධනය කරමින් පවතින කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) මගින් යහපාලනයක් ක්‍රියාත්මක වීම සහතික කිරීම උදෙසා විශ්වවිද්‍යාලය තුළ තීරණ ගැනීම, සම්බන්ධීකරණය සහ ඒකාබද්ධ කිරීම, ඇගයීම සහ පාලනය සහ තොරතුරු දෘෂ්‍යකරණය සඳහා භාවිත කරනු ඇත.

තව ද, සම්පත් සහ පද්ධතීන් කළමනාකරණය කිරීමේ දී පරිපාලන සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලය අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පශ්චාත් උපාධි පාඨමාලාවන් සහ වෘත්තීය පාඨමාලාවන්හි නිරත වීමට පරිපාලන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය දිරිමත් කරමින් ඔවුන්ගේ අධ්‍යාපනික සහ වෘත්තීය සංවර්ධනය කෙරෙහි විශ්වවිද්‍යාලය අවධානය යොමු කළේ ය. මීට අමතරව, විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) හරහා සුදුසු පුහුණුවක් සහ වැඩමුළු ද පවත්වන ලදී. එසේ ම, කාර්යය මණ්ඩලය සහ ශිෂ්‍යයන් අතර යහපාලනය වර්ධනය කිරීම සඳහා ආයතනයේ සම්පත් ධාරිතාව ඉහළ දැමීම කෙරෙහිද විශ්වවිද්‍යාලය අවධානය යොමු කර තිබේ.

- සියලුම පීඨවල, පුස්තකාලයේ සහ පරිපාලනයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.
- පරිපාලන කාර්ය මණ්ඩලයෙන් 90%කට පශ්චාත් උපාධි/වෘත්තීය සුදුසුකම් තිබීම සහතික කිරීම.
- SDC පුහුණුව/වැඩමුළු අන්තර් විශ්වවිද්‍යාල නිරාවරණ චාරිකා හරහා පුහුණු කළ පරිපාලන කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය ඉහළ දැමීම.
- SDC පුහුණු/වැඩමුළු හරහා පුහුණු කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය වැඩි කිරීම

- ප්‍රමාණවත් භෞතික සම්පත් සැපයීම හරහා පරිපාලන මෙහෙයුම්වල කාර්යක්ෂමතාව වර්ධනය කිරීම.

ඉලක්ක 04: හිතකර අධ්‍යයන සහ අධ්‍යාපන පරිසරයක් ලබා ගැනීමට දායක වන භෞතික හා මානව සම්පත් සපයන බවට සහතික කිරීම.

ඵලදායී අධ්‍යයන සහ අධ්‍යාපන කටයුතු සිදු කිරීම සඳහා ප්‍රමාණවත් භෞතික හා මානව සම්පත් අවශ්‍ය වේ. විශ්වවිද්‍යාලය ඉදිරි වසරවල දී අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන සේවක මණ්ඩල තනතුරු වැඩි කරන ලදී. වසංගතය හේතුවෙන් ශිෂ්‍යයන් නේවාසිකාගාරයෙන් පිටත රැඳී සිටීමට අපහසුතා ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස, විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරය සහ යටිතල පහසුකම් පුළුල් කිරීමට විශ්වවිද්‍යාලය අවශ්‍ය පියවර ගන්නා ලදී.

තව ද, ශිෂ්‍යයන්ට සහ කාර්යය මණ්ඩලයට මාර්ගගත දේශනවලට සහභාගී වීමට සහ දේශන පැවැත්වීම දුෂ්කර විය. ඊට විසඳුමක් ලෙස, විශ්වවිද්‍යාලය විසින් පීඨවල නවීන පහසුකම් සහිත පරිපූර්ණ දේශන ශාලා පිහිටුවන ලදී. නවීන පහසුකම් සහිත දේශන ශාලා සහ ශ්‍රවණාගාරයක් ඉදිකිරීමට සහ සියලුම දේශන ශාලා නවීන ඉගැන්වීම් මෙවලම්වලින් පරිපූර්ණ කිරීමට විශ්වවිද්‍යාලය සැලසුම් කර ඇත. එසේ ම, ඉන් ප්‍රවාහන හා නඩත්තු පහසුකම් වර්ධනය විය. තව ද, විශ්වවිද්‍යාල පරිශ්‍රය හරිත පරිසරයක් බවට පත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමය සහ අනෙකුත් ශිෂ්‍ය සමාජ හරහා ක්‍රියා කරන ලදී.

අරමුණු

- 2026 වර්ෂය වන විට අවශ්‍යතා මත පදනම්ව අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන සේවක තනතුරු වැඩි කිරීම.
- සියලුම ශිෂ්‍යයන්ට 2026 වර්ෂය වන විට නේවාසිකාගාර පහසුකම් ලබා දීම.
- එක් එක් පීඨ සඳහා නවීන පහසුකම් සහිත නව දේශන ශාලා පිහිටුවීම.
- 2026 වර්ෂය වන විට සියලුම දේශන ශාලා නවීන ඉගැන්වීම් පහසුකම්වලින් පරිපූර්ණ කිරීම.
- විශ්වවිද්‍යාලය සඳහා ශ්‍රවණාගාරයක් ඉදිකිරීම
- 2026වර්ෂය වන විට නව විද්‍යාගාර පිහිටුවීම සහ පවතින විද්‍යාගාර වැඩිදියුණු කිරීම.
- සියලුම පහසුකම් සහිත පශ්චාත් උපාධි ආයතන සහ පර්යේෂණ මධ්‍යස්ථාන ඉදිකිරීම.
- සෑම වසරක ම අමතර ගොඩනැගිලි සහ අනෙකුත් යටිතල පහසුකම් සැපයීම.
- ප්‍රමාණවත් ප්‍රවාහනය සහ අනෙකුත් ප්‍රධාන යන්ත්‍රෝපකරණ සහ උපකරණ ලබා දීම.
- විශ්වවිද්‍යාල පරිශ්‍රය හරිත පරිසරයක් බවට ප්‍රවර්ධනය කිරීම.
- 2026 වර්ෂය වන විට දැනට පවතින ගොඩනැගිලිවලින් 80%ක් සඳහා ආබාධිත පුද්ගලයන් වෙනුවෙන් මූලික යටිතල පහසුකම් සැපයීම සහතික කිරීම.

ඉලක්ක 05: ප්‍රාදේශීය සහ ජාතික සංවර්ධනය සඳහා දැනුම ව්‍යාප්ත කිරීම.

කලාපයේ සහ ජාතීන්ගේ සංවර්ධනය විශ්වවිද්‍යාලයේ වගකීමකි; එය ප්‍රජා සත්කාරක ව්‍යාපෘති, ප්‍රජා සංවර්ධන පර්යේෂණ සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලට සහභාගී වීමට විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සහ කාර්යය මණ්ඩලය දිරිමත් කරයි. එසේ ම, විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩලය සහ ශිෂ්‍යයන් විසින් පාසල් සිසුන් සඳහා ඔවුන්ගේ වෘත්තීය මඟ වැඩිදියුණු කර ගැනීමට උපකාර කිරීම සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ පවත්වන ලදී.

තව ද, සමාජ අභිවෘද්ධිය උදෙසා ප්‍රජා සත්කාරක වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට විශ්වවිද්‍යාලය ප්‍රජා මූලික සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කළේ ය. තව ද, ශිෂ්‍ය සමාජ සහ අනෙකුත් ශිෂ්‍ය සංගම් විසින් කලාපීය සහ ජාතික සංවර්ධනය සඳහා විවිධ ප්‍රජා සත්කාරක ක්‍රියාකාරකම් ද යෝජනා කරන ලදී.

අරමුණු

- කලාපීය සහ ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා සුවිගත කළ සහ සම-සමාලෝචනය කරන ලද ප්‍රකාශන වැඩි කිරීම
- කර්මාන්ත/ ජාතික සංවර්ධන වැඩසටහන් සඳහා දායක වීම
- පුහුණු වැඩසටහන් හරහා පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතනවල සේවක කුසලතා වැඩි දියුණු කිරීම.
- ප්‍රජා අන්තර්ක්‍රියා සෛල හරහා ප්‍රජා මූලික ක්‍රියාකාරකම් සංඛ්‍යාව වැඩි කිරීම.

ඉලක්ක 06: ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගිකත්වය සහ ආගම සම්බන්ධයෙන් යුක්තිය සහ සාධාරණත්වය සහතික කිරීම

සාධාරණත්වය සහ සමානාත්මතාවය හේතුවෙන් විවිධ ජනවාර්ගික, ආගමික සහ ස්ත්‍රී පුරුෂ කණ්ඩායම්වලට අයත් කාර්යය මණ්ඩලය සහ ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලය තුළ මහත් වූ ප්‍රබෝධයෙන් එකමුතුව රැකියාවෙහි යෙදුණහ. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සහ කාර්යය මණ්ඩලය අතර යුක්තිය සහ සාධාරණත්වය සහතික කිරීම සඳහා, විශ්වවිද්‍යාල මට්ටමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආයතනයක් සහ සහයෝගීතා මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී. එසේ ම, සියලුම ආගමික හා සංස්කෘතික උත්සව ශිෂ්‍යයන් සහ කාර්යය මණ්ඩලය සමඟ සමරනු ලැබූ අතර එය ඔවුන් අතර සාධාරණත්වය සහ සමානාත්මතාවය පිළිබඳ සාක්ෂියක් වනු ඇත.

තව ද, දමිළ, සිංහල සහ මුස්ලිම් ශිෂ්‍යයන් අතර භාෂාමය බාධක පවතින අතර, එය සන්නිවේදනයට සහ සහයෝගීතාවයට ඇති සැලකිය යුතු බාධාවක් ලෙස හඳුනාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඒකාබද්ධ පාඨමාලා මොඩියුලය සඳහා භාෂාවක් ඉදිරිපත් කරන ලදී. එය සිංහල ශිෂ්‍යයන්ට දමිළ භාෂාව ඉගෙන ගැනීමට සහ දමිළ ශිෂ්‍යයන්ට සිංහල භාෂාව ඉගෙන ගැනීමට සහය විය. එමඟින්, ශිෂ්‍යයන් අතර සන්නිවේදන පරතරය අවම විය.

අරමුණු

- 2026 වර්ෂය වන විට ආර්ථික හා සමාජීය අවශ්‍යතා ඇති ශිෂ්‍යයන් සඳහා මූල්‍ය හා සමාජීය ආධාර සැපයීම.
- සියලුම වාර්ගික ආගමික ප්‍රජාවන්ට අධ්‍යයනය කිරීමට සහ සමගියෙන් ජීවත් වීමට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.
- ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගික හා ආගම් භේදයකින් තොරව සියලුම ක්‍රියාකාරකම්වල සමාන අවස්ථා සහතික කිරීම.
- පීඨවල ශිෂ්‍යයන්ගේ සහයෝගීතාව වර්ධනය කිරීම.
- දමිළ ශිෂ්‍යයන්ට සිංහල භාෂාවත් සිංහල ශිෂ්‍යයන්ට දමිළ භාෂාවත් ඉගැන්වීම සහ සහතිකපත්‍ර පාඨමාලා පිරිනැමීම.
- ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය සහ සමානාත්මතාවය ඇති කිරීම සඳහා යටිතල පහසුකම් සැපයීම.

3 පීඨ, මධ්‍යස්ථාන සහ අංශ

3.1 ව්‍යවහාරික විද්‍යා පීඨය



ආචාර්ය ජෙයගෞරි නිමලන්
පීඨාධිපති

හැඳින්වීම

ව්‍යවහාරික විද්‍යා පීඨය (FAS) 1997 වර්ෂයේ දී පිහිටුවන ලදී. මෙම පීඨය ජීව විද්‍යා සහ භෞතික විද්‍යා අංශ ලෙස අංශ දෙකකින් සමන්විත වේ.

ව්‍යවහාරික විද්‍යා පීඨය (FAS) පිහිටා ඇත්තේ වවුනියාවේ පම්පයිමඩු ප්‍රදේශයේ වන අතර එය වනාන්තරයකින්, වැවකින් සහ කුඹුරුවලින් ස්වාභාවිකව වට වී ඇත. ව්‍යවහාරික විද්‍යා පීඨය (FAS) විසින් නම්‍යශීලී, මිත්‍රශීලී සහ හිතකර අභ්‍යන්තර පරිසරයක් ලබා දෙන අතර එමඟින් ඵලදායී ඉගැන්වීම්, අධ්‍යයනය සහ පර්යේෂණ සඳහා ඉඩ ලබා දෙන අතර වවුනියා විශ්වවිද්‍යාලයෙහි මධ්‍යස්ථාන සහ ඒකකවල සහය ඇතිව ක්‍රීඩා, විනෝදාත්මක, ආගමික, සංස්කෘතික සහ සිවිල් කටයුතු සඳහා ශිෂ්‍යයන් සම්බන්ධ කෙරේ. ශිෂ්‍යයෝ තම උපාධි පාඨමාලා මොඩියුල ඉගෙනීමෙන් දැනුම හා කුසලතා වර්ධනය කර ගනිති. තව ද, ඔවුන්ගේ අධ්‍යයන පාඨමාලාවන් නොසලකමින් අවශ්‍ය ප්‍රායෝගික, සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ කුසලතා වර්ධනය කර ගැනීමට ඔවුහු උත්සුක වෙති.

ආචාර්ය මණ්ඩලය විසින් ශිෂ්‍යයන් වෙත එක් ශිෂ්‍යයාගෙන් එක් ශිෂ්‍යයාට අවධානය යොමු කරන ශිෂ්‍ය හා කාර්යය මණ්ඩල අන්තර්ක්‍රියා සම්බන්ධතාවය ප්‍රශස්ත, ඉහළ මට්ටමක පවතින අද්විතීය සංස්කෘතියක් පීඨය සතුව ඇත. තව ද, පීඨය වවුනියාවේ ප්‍රජාව සමඟ දැඩි සබඳතා පවත්වන අතර ප්‍රදේශයේ සිදුවන සියලුම සංවර්ධන කටයුතුවල උපදේශන හැකියාවන්හි ප්‍රධාන සහ ප්‍රමුඛ ආයතනයක් ලෙස සැලකේ.

පීඨය සඳහා අනුමත මුළු අධ්‍යයන සේවක තනතුරු සංඛ්‍යාව 39ක් වන අතර, ඉන් තනතුරු 31ක් දැනටමත් පුරවා ඇත. තව ද, අනධ්‍යයන කාර්යය මණ්ඩල අනුමත සේවක තනතුරු 18න් 10ක් පුරවා ඇති අතර පරිපාලන සේවක තනතුරු 01ක් පමණක් පුරවා ඇත. මෙම පීඨය සතුව ආසන්න වශයෙන් වර්ග අඩි 34,000ක ප්‍රධාන ගොඩනැගිලි තුනක් ඇත. මෙම ගොඩනැගිලි ත්‍රිත්වයෙහි සම්පූර්ණ ධාරිතාව අධ්‍යයන හා පරිපාලන කටයුතු සඳහා භාවිතා කර ඇත.

දැක්ම සහ මෙහෙවර ඵලදායීව සාක්ෂාත් කර ගැනීම උදෙසා පීඨයේ අධ්‍යයන, අනධ්‍යයන හා පරිපාලන කාර්යය මණ්ඩලයේ සහ ශිෂ්‍යයන් යන ප්‍රධාන ආධාරකරුවන්ගේ අපරිමිත සහයෝගය සහ කැප වූ රාජකාරී ඉටු කිරීමේ ගුණය ඇතිව පීඨය විසින් උපාධිධාරී කණ්ඩායම් 20කට ආසන්න සංඛ්‍යාවක් බිහි කර ඇත.

රිදී ජුබිලි මාර්ගගත සිහිවටන එළිදැක්වීම, විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය සහ ශිෂ්‍යයන් සඳහා සුහද ක්‍රිකට තරඟයක්, පාසල් සිසුන් සඳහා පරිසර දැනුවත් කිරීමේ වැඩසටහනක්, පාසල් සිසුන් හා විශ්වවිද්‍යාලීය අධ්‍යයන පීඨ ශිෂ්‍යයන් සඳහා චිත්‍ර තරඟයක්, පාසල් සිසුන් සඳහා ප්‍රදර්ශනයක්, පීඨ ශිෂ්‍යයන් සඳහා පර්යේෂණ සිදු කිරීම උනන්දු කිරීමට සාකච්ඡා මාලාවක් සහ අවට ප්‍රජාව උදෙසා පැල බෙදා හැරීමේ වැඩසටහනක් ඇතුළු වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සමූහයක් පවත්වමින් පීඨය රිදී ජුබිලිය සමරන ලදී.

ජයග්‍රහණ

2022 වර්ෂයේ දී AHEAD ප්‍රදානය හරහා පහත කාර්යයන් සඳහා පහසුකම් සපයන ලදී.

- නිමැවුම් පදනම් කරගත් අධ්‍යාපනය සහ ශිෂ්‍ය කේන්ද්‍ර කරගත් ඉගැන්වීම් සඳහා පහසුකම් සැලසීමට උසස් තොරතුරු තාක්ෂණයන් සහිත දේශන ශාලාවක් ස්ථාපිත කරන ලදී.
- පාරිසරික ජීව විද්‍යාගාරයේ අණුක ජීව විද්‍යාගාරයක් ස්ථාපිත කරන ලදී.
- ශිෂ්‍යයන් සඳහා ස්වයං රැකියා, ව්‍යාපාර බීජෝෂණය සහ ව්‍යවසායකත්වය දිරිමත් කිරීම සඳහා සයිලෝ ආහාර සහ බිම්මල් නිෂ්පාදන ඒකක සහ මී මැසි වගා ඒකක
- නව 250KVA ජනක යන්ත්‍රයක් ස්ථාපනය කරන ලද අතර, ව්‍යවහාරික විද්‍යා පීඨයට අයත් සියලුම ගොඩනැගිලි තනි විදුලි රැහැන් පද්ධතියකට ගෙන එන ලදී.

අධ්‍යයන පාඨමාලා:

- පරිසර විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාව සඳහා ශ්‍රී ලංකාවේ මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව (MUSSD) සමඟ එක්ව මිනුම් විද්‍යාව පිළිබඳ නව පාඨමාලා ඒකකයක් හඳුන්වා දෙන ලදී.
- පාරිසරික සංචාරක සහ Python Essentials පිළිබඳ කෙටි පාඨමාලාව සඳහා යෝජනා අනුමත කරන ලදී.

අධ්‍යයන ජයග්‍රහණ:

- ආචාර්ය ඒ. නන්දකුමරන් මහත්මිය පරිසර විද්‍යාව පිළිබඳ මහාචාර්ය තනතුරට උසස් කරන ලදී.
- ආචාර්ය කේ. අර්ජුනන් මහතා ඕස්ට්‍රේලියාවේ බටහිර සිඩ්නි විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය සම්පූර්ණ කළේ ය.
- ස්විට්සර්ලන්තයේ ජිනීවා විශ්වවිද්‍යාලය විසින් සමූහ ව්‍යාපෘති සඳහා "හොඳම නවකතාවට හිමි සම්මානය වී. ශාරණියා මහත්මියට ප්‍රදානය කරන ලදී.

පුහුණු හා වැඩමුළු සඳහා සම්පත් දායකත්වය

FASහි කාර්යය මණ්ඩලය අන්තර්ජාල සම්මන්ත්‍රණ මාර්ගගත සැසි (04), වැඩමුළු (01), දැනුවත් කිරීමේ වැඩසටහන්/ සම්මන්ත්‍රණ (02), ප්‍රායෝගික සැසි (01) සහ පර්යේෂණ ඇගයීම් සැසි (05) පැවැත්වීම සඳහා සම්පත් දායකයන් ලෙස කටයුතු කළහ.

පුහුණු වැඩසටහන්/ වැඩමුළු/ සම්මන්ත්‍රණ:

පීඨය විසින් ගව ආහාර නිෂ්පාදනය, මී මැසි වගා තාක්ෂණය සහ බිම්මල් වගාව පිළිබඳ පුහුණු සැසි 03ක් සහ ව්‍යවහාරික විද්‍යා පීඨ කාර්යය මණ්ඩලයට සහ ශිෂ්‍යයන්ට අදාළ වන්නා වූ වැඩමුළු 08ක් සංවිධානය කරන ලදී.

පීඨය සිය තෙවන පීඨ වාර්ෂික පර්යේෂණ සැසිය (FARS 2022) පවත්වන ලද අතර එහි රිදී ජුබිලිය සමරන ලදී.

කලාපීය, ජාතික සහ ජාත්‍යන්තර සංවිධාන අතර සහයෝගිතාව:

- වවුනියා විශ්වවිද්‍යාලය සහ Blue Lotus 360 අතර අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.
- VIRTUSA පුද්ගලික සමාගම සහ මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව (MUSSD) සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට අවශ්‍ය ලියකියවිලි සභාව විසින් අනුමත කරන ලදී.

ශිෂ්‍යයන්ගේ ජයග්‍රහණ:

- පීඨයේ රිදී ජුබිලි සැමරුම් මගින් පවත්වන ලද තරඟවලදී සිසුන් ත්‍යාග දිනා ගත්හ.
- නිර්ණායක මත පදනම්ව සිසුන් තිදෙනෙකු සඳහා පීඨ සම්මානය පිරිනමන ලදී.
- 2022 Cisco කේතීකරණ තරඟයෙන් ජයග්‍රහණය කළ සිසුන් සඳහා ඩිජිටල් සහතික පත්‍ර නිකුත් කරන ලදී.
- පාසල් සිසුන් සඳහා විද්‍යාගාර ප්‍රායෝගික පර්යේෂණ පිළිබඳ පාරිසරික සංචාරක ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ වැඩමුළුවක් පවත්වන ලදී.

පාඨමාලාවන් සමාලෝචනය කිරීම සඳහා පීඨයට පැමිණීම :2020 -

පාඨමාලාවන් සමාලෝචන කණ්ඩායම පරිසර විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ව්‍යවහාරික ගණිතය සහ පරිගණකකරණය පිළිබඳ උපාධි පාඨමාලාවන් සමාලෝචනය කිරීම සඳහා පීඨයට පැමිණියහ.



FARS 2022 **සමුළුව**

අසාර්ථකවීම් සහ සාධාරණීකරණය:

- අරමුදල් නොමැතිකම හේතුවෙන් අර්ධ ස්ථීර දෙමහල් දේශන ශාලා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වීම.
- භෞතික විද්‍යා අංශයේ පළමු මහලේ ඉදිකිරීම් අවසන් කිරීමට ඉන්දීය රජයෙන් ප්‍රදානය ලැබීම තහවුරු කිරීම ප්‍රමාද විය.

අනාගත සැලසුම්

- පාරිසරික විද්‍යා ක්ෂේත්‍රයේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සංවර්ධනය කිරීම.
- නව ප්‍රථම උපාධි පාඨමාලාවක් සංවර්ධනය කිරීම.
- පවතින උපාධි පාඨමාලාවන් සඳහා විශේෂීකරණයන් හඳුන්වා දීම.
- ඩිප්ලෝමා/ කෙටි/ සහතික පාඨමාලා ආරම්භ කිරීමට විෂයමාලා සකස් කිරීම.
- දේශීය හා ජාත්‍යන්තර ආයතන සහ කර්මාන්ත සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- පරිසර හිතකාමී දේශන ශාලාවක් පිහිටුවීමට යෝජනාවක් සකස් කිරීම.

3.2 ව්‍යාපාර අධ්‍යයන පීඨය



ආචාර්ය වයි. නන්දගෝපන්/ පීඨාධිපති

හැදින්වීම

ව්‍යාපාර අධ්‍යයන පීඨය 1997 වර්ෂයේ දී ආර්ථික හා කළමනාකරණ අංශය සහ ගණකාධිකරණ හා මූල්‍ය අංශය පිහිටුවීමෙන් සිය අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. පසුව, 2021 වර්ෂයේ මාර්තු 21 දිනැති ගැසට් නිවේදනය මඟින් පීඨයට තවත් අංශ ස්ථාපිත කර ගැනීමට අවසර දෙන ලදී.

පීඨය අංශ හතකින් සමන්විත වේ. ව්‍යාපාර ආර්ථික විද්‍යාව, අලෙවි කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය, කළමනාකරණය සහ ව්‍යවසායකත්වය, මානව සම්පත් කළමනාකරණය, ගණකාධිකරණය සහ මූල්‍ය සහ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම යනාදියයි.

මෙම පීඨය ශිෂ්‍යයන් 1000ක් ඉලක්ක කර ගනිමින් විවිධ උපාධි පාඨමාලා ඉදිරිපත් කරයි. අ. පො. ස. (උසස් පෙළ) විභාගය වාණිජ හා කලා විෂය ධාරාවෙන් සමත්ව ව්‍යාපාර අධ්‍යයන පීඨයට ඇතුළත් වන ශිෂ්‍යයන් සඳහා ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය (BBM) පිරිනමනු ලැබේ.

මෙම පාඨමාලාව සඳහා වාර්ෂිකව ශිෂ්‍යයන් 216ක කණ්ඩායමක් විශේෂීකරණය වූ විෂය පථ හතරක් සඳහා ඇතුළත් කර ගනු ලැබේ. ගිණුම්කරණය සහ මූල්‍ය, අලෙවි කළමනාකරණය, ව්‍යාපාර ආර්ථික විද්‍යාව සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධි පාඨමාලාවන් එම විෂය පථ හතර වේ.

තව ද, පීඨය විසින් 2014/15 අධ්‍යයන වර්ෂයේ දී ආරම්භ වූ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය (BBM in PM) නමින් නව උපාධි පාඨමාලාවක් හඳුන්වා දෙන ලදී. එම උපාධි පාඨමාලාව 2017/2018 අධ්‍යයන වර්ෂයේ දී ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ගෞරව උපාධිය දක්වා උසස් කරන ලදී. වර්තමානයේ දී සියලුම විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ සමත් ශිෂ්‍යයන් 101ක් මෙම උපාධි පාඨමාලාවට ඇතුළත් කර ගැනේ. අපගේ උපාධි පාඨමාලාවන් උපාධි අපේක්ෂකයන්ට වෘත්තීය විභාග සඳහා සුදුසුකම් ලැබීමට සහ තරඟ කිරීමට සහ ධනාත්මක ආකල්ප, දක්ෂතාවය සහ ආත්ම විශ්වාසය ඇති කිරීමට ද සාර්ථක පදනමක් සපයයි.

මෙම පීඨය අධ්‍යයන, අනධ්‍යයන හා පරිපාලන කාර්යය මණ්ඩලය 32ක ඉතා දක්ෂ පිරිසකින් යුක්ත වේ. එසේ ම, පීඨයට ගොඩනැගිලි හතරක් සහ එක් තොරතුරු තාක්ෂණ විද්‍යාගාරයක් ඇත. මෙම ගොඩනැගිලිවල සම්පූර්ණ ධාරිතාවය අධ්‍යයන හා පරිපාලන කටයුතු සඳහා භාවිතා කෙරේ.

ජයග්‍රහණ

- ස්මා(ර්)ට් පුවරු සහ ස්මා(ර්)ට්/ ගතික කුඩා චේදිකාවන් සමඟ නවීකරණය කරන ලද පන්තිකාමර හරහා නිමැවුම පදනම් කර ගත් අධ්‍යාපනය සහ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම සඳහා පහසුකම් සලසා ඇත.
- පීඨ ශිෂ්‍යයන්ට කර්මාන්ත ආශ්‍රිත පුහුණුව, රැකියා ලබා ගැනීම සඳහා සහය වීමට සියලුම අංශ සඳහා පුහුණු සහ ස්ථානගත කිරීමේ ආයතන ස්ථාපිත කිරීම සහ පිළිගත් ආයතන හා කර්මාන්ත ආයතන ජාලය හරහා උපාධි අපේක්ෂකයන් සහ උපාධිධාරීන් සඳහා රැකියා අවස්ථා සොයා ගැනීම සඳහා සහය වීම.
- CIPM, සීමා සහිත hSenid Business Solution පුද්ගලික සමාගම, ව්‍යාපෘති කළමනාකරණ ආයතනය, SLIM, ACCA, IBSL සහ CMA ඇතුළු වෘත්තීය සහ කර්මාන්ත හා සම්බන්ධ ආයතන 30කට අධික සංඛ්‍යාවක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇත.
- අනාගත පරපුර සමාජ සවිඥානික වීමටත් ප්‍රජාතන්ත්‍රවාදීව කලාපීය සංවර්ධනයට සම්බන්ධ වීමටත් අවශ්‍ය තරුණ නායකත්ව වැඩසටහන (YLD) උතුරු හා නැගෙනහිර පළාත්වල පැවැත්වීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමඟ ගිවිසුමක් අත්සන් කරන ලදී.
- 1997 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වසර 25ක විශිෂ්ඨත්වයේ රිදී ජුබිලි සැමරුම් 2022 වර්ෂයේ ජූලි මස 4, 5 සහ 6 යන දිනවල සමරන ලද අතර PRANA මූල්‍ය ආධාර දියත් කිරීම, ශිෂ්‍ය සමාජ සඳහා සහරා නිකුත් කිරීම, රිදී ජුබිලි සමරු පොත එළිදැක්වීම, සංස්කෘතික උත්සව සඳහා සත්කාරකත්වය දැක්වීම ඇතුළු වැඩසටහන් රැසක් එහි දී පවත්වන ලදී.

- ඖෂධීය හා සංස්කෘතිකමය වශයෙන් වැදගත් වන විවිධ ඇල්පයින් විශේෂ සංරක්ෂණය කිරීම සඳහා ඔසු උයනක් ආරම්භ කිරීම සහ මෙම විශේෂවල ප්‍රචාරණය සහ ඒවායේ පරිසර විද්‍යාව පිළිබඳ අධ්‍යයන පරීක්ෂණයකට පහසුකම් සැලසීම.

අධ්‍යයන වැඩසටහන්:

- බැංකුකරණය හා රක්ෂණය සහ ව්‍යවසායකත්වය යන නව ගෞරව උපාධි පාඨමාලාවන් දෙකක් හඳුන්වා දෙන ලදී. පාඨමාලාවන් ද්විත්වයම 2021/2022 ශිෂ්‍ය බඳවා ගැනීමේ ක්‍රියාවලියෙන් ආරම්භ වේ.
- භෞතිකව සහ මාර්ගගත ක්‍රම යන දෙක හරහා ව්‍යාපාර අධ්‍යයනය (RCBS) පිළිබඳ එහි සිව් වැනි පර්යේෂණ සමුළුව පවත්වන ලදී. පර්යේෂණ ලේඛන 43කින් සමන්විත වෙන වෙන ම තාක්ෂණික සැසි පහක් සමාන්තරව පවත්වන ලද අතර එක් එක් ධාවන සැසියේ හොඳම ඉදිරිපත් කරන්නන් සඳහා සම්මාන ප්‍රදානය කරන ලදී.
- විශ්වවිද්‍යාල කවුන්සිලය විසින් අනුමත කරන ලද ව්‍යාපාර පරිපාලන ආචාර්යය උපාධියෙහි විෂය මාලාව සංවර්ධනය කරන ලදී.

අධ්‍යයන ජයග්‍රහණ:

පහත අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයන් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලවල ඔවුන්ගේ පශ්චාත් උපාධි පාඨමාලාවන් සම්පූර්ණ කර ඇත.

කජෙත්ති වෙනුජන් මහත්මිය - ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය, යාපනය විශ්වවිද්‍යාලය

සම්මන්ත්‍රණ/වැඩමුළු සහ පුහුණු වැඩසටහන්:

පීඨ සහ අංශ සාමාජිකයන් විසින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් (උදා: පර්යේෂණ, සීමාවාසික පුහුණුව, විෂයයන්) සහ කාර්යය මණ්ඩලය සහ බාහිර සමාජයේ පුද්ගලයන් (උදා: සමුපකාර සංවර්ධන නිලධාරීන්, පාසල් සිසුන් සහ ගුරුවරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලය) ඉලක්ක කර ගනිමින් වැඩමුළු විස්සක් පවත්වන ලදී.

විදේශීය සහයෝගිතා:

වගකිය හැකි ව්‍යාපෘති කළමනාකරණය (එක්සත් රාජධානිය) සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර ඉන්දියාවේ අයෝධ්‍යා පර්යේෂණ ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් ආරම්භ කරන ලදී.



එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමඟ ගිවිසුම අත්සන් කිරීම

විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ ජයග්‍රහණ:

- පීඨයේ රිදී ජුබිලි සැමරුම් මගින් පවත්වන ලද තරඟවල දී ශිෂ්‍ය සමාජ ත්‍යාග හිමි කර ගන්නා ලදී.
- ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ සිව් වැනි පර්යේෂණ සමුළුවේ දී (RCBS) අවසන් වසරේ ශිෂ්‍යයන්ට ඔවුන්ගේ පර්යේෂණ කටයුතු වෙනුවෙන් සම්මාන ප්‍රදානය කරන ලදී.

අසාර්ථකවීම් සහ සාධාරණීකරණයන්

- රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් ජාතික සැලසුම් යටතේ අනුමත පීඨ ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමට පීඨය අසමත් විය.
- භාණ්ඩාගාර අරමුදල් සුළු අගයක් වෙන් කිරීම හේතුවෙන් අධ්‍යයනය හා ඉගැන්වීමට ප්‍රමාණවත් ශිෂ්‍ය පහසුකම් සැපයීමට පීඨය අපොහොසත් විය.

අනාගත සැලසුම්

- ව්‍යාපාර තොරතුරු පද්ධති පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) උපාධිය සහ සංචාරක සහ සත්කාරක කළමනාකරණ පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) උපාධිය පිරිනැමීම සඳහා විෂයමාලාවන් දෙකක් සංවර්ධනය කිරීම.
- යාවත්කාලීන දැනුම සහ කුසලතා සමඟ විෂයමාලා සංශෝධනය කිරීමෙන් පසු පවතින උපාධි පාඨමාලාවන් පිරිනැමීමට අනුමැතිය ලබා ගැනීම.
- ඉංග්‍රීසි භාෂා ව්‍යාප්ති වැඩසටහනක් වන ඉංග්‍රීසි භාෂා උසස් ඩිප්ලෝමා වැඩසටහන ආරම්භ කිරීම.
- පර්යේෂණ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා අංශ මට්ටමින් සම්මන්ත්‍රණ සහ ජර්නල් හඳුන්වා දීම.

3.3 තාක්ෂණ අධ්‍යයන පීඨය

හැඳින්වීම

යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා මණ්ඩපයේ ව්‍යවහාරික විද්‍යා පීඨය යටතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් උපාධි පාඨමාලාව 2016 වර්ෂයේ දී ප්‍රථම කණ්ඩායමේ උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාව හදාරන ලද ශිෂ්‍යයන් සඳහා පහසුකම් සැලසීමේ ඒකකයක් ලෙස ස්ථාපිත කරන ලදී. පසුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සහ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 27(1) වගන්තිය යටතේ අංක 2160/43 දරණ ආඥාව ප්‍රකාරව සහ ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශයේ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ ප්‍රකාශයට පත් කිරීම මත 2020 වර්ෂයේ පෙබරවාරි මාසයේ දී තාක්ෂණ අධ්‍යයන පීඨය පිහිටුවන ලදී. තාක්ෂණ අධ්‍යයන පීඨය උතුරු පළාතේ වවුනියාව, පම්පයිමඩුහි පිහිටා ඇත.

ජාතික ප්‍රමිතීන්ට අනුව පුළුල් පරාසයක පරිගණක විද්‍යාව සහ තොරතුරු තාක්ෂණය විෂය පථයක් ආවරණය කරමින් වරකට සිසුන් 530ක් ඉලක්ක කර ගනිමින් උපාධි අපේක්ෂකයන් උදෙසා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධිය පිළිබඳ උසස් න්‍යායාත්මක සහ ප්‍රායෝගික-නැඹුරු උපාධි පාඨමාලාවක් පිරිනමන තාක්ෂණ අධ්‍යයන පීඨය එක් අධ්‍යයන අංශයකින් සමන්විත වේ. තාක්ෂණ විෂය ධාරාවෙන් අ. පො.ස. (උසස් පෙළ) විභාගය සමත් වී තාක්ෂණ අධ්‍යයන පීඨයට ඇතුළත් වන ශිෂ්‍යයන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලාව පිරිනමනු ලැබේ. ඉහත අංශය මඟින් වාර්ෂිකව ශිෂ්‍යයන් 175ක් පමණ මෙම පාඨමාලාවට ඇතුළත් කරගනු ලැබේ. අනාගතයේදී තාක්ෂණය පදනම් කරගත් වෙනත් උපාධි පාඨමාලාවන් සඳහා ශිෂ්‍යයන් බඳවා



ගැනීමට ද පීඨය සැලසුම් කර ඇත. පෙව පද්ධති තාක්ෂණ අංශයේ හරිත බලශක්ති තාක්ෂණය සහ ඉංජිනේරු තාක්ෂණ අංශයේ භූ තාක්ෂණය ඒවා වේ. පීඨය මානව සම්පත් සහ භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය තුළ විශේෂ උපාධි පාඨමාලාවන් ආරම්භ කිරීමට නියමිත ය. පසුගිය වසරේ අධ්‍යයන සේවක තනතුරු කිහිපයක් පුරවා ඇත; අනධ්‍යයන සේවක සංඛ්‍යාව දෙදෙනෙකු සමඟ මුළු ප්‍රමාණය වූ 07න් අනෙක් පුරප්පාඩු දැනටමත් පුරවා ඇත. මෙම පීඨය සතුව දළ වශයෙන් වර්ග මීටර් 2734 ක ගොඩනැගිලි දෙකක් ඇති අතර ඒවායේ සම්පූර්ණ ධාරිතාවය අධ්‍යයන හා පරිපාලන කටයුතු සඳහා භාවිත කරන ලදී.

අලුතින් සංවර්ධනය කරන ලද යටිතල පහසුකම් සහ උසස් විද්‍යාගාර පහසුකම් සමඟින්, පීඨය පෙර නොවූ ලෙස නැඟී එන අතර අපි සෑම අයෙකුම තාක්ෂණික දැනුමේ විශිෂ්ඨ ගමනක් අපේක්ෂා කරන්නෙමු.

ජයග්‍රහණ

- RCAICT හෙවත් තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ දියුණුව පිළිබඳ පර්යේෂණ සම්මන්ත්‍රණය, සමාන්තර සම්මන්ත්‍රණ තුනක් සහ විවිධ විෂය ක්ෂේත්‍ර නියෝජනය කරන ප්‍රධාන ආරාධිතයන් විසින් පවත්වන කථිකයන්ගෙන් සුපෝෂිත විය.
- වවුනියා විශ්වවිද්‍යාලයේ මොසිල්ලා විශ්වවිද්‍යාල සමාජය විවෘත කිරීම.

- එන්. ලොජීනා මෙනවිය සහ ඩබ්. ඒ. එස්. සී. පෙරේරා මෙනවිය අධ්‍යයන අවශ්‍යතා සපුරාලීම හේතුවෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට අනුයුක්ත අධ්‍යයන කාර්යමණ්ඩලය මෙම වසරේ කථිකාචාර්යවරයන් ලෙස නම් කර ඇත.
- තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයට අනුයුක්ත අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ සේවකයෙක් වන එස්. ශිරාජන් මහතා තාක්ෂණික නිලධාරි (II ශ්‍රේණිය, B ඛණ්ඩය) ලෙස ස්ථිර කරන ලදී.

අධ්‍යයන පාඨමාලා:

මෘදුකාංග සැලසුම් සහ සංවර්ධනය, ජාල පරිපාලනය සහ කළමනාකරණය, සයිබර් ආරක්ෂාව, බහුමාධ්‍ය සහ ක්‍රීඩා තාක්ෂණය, ඩිජිටල් සහ කාවැද්දූ පද්ධති තාක්ෂණ සහ දත්ත තාක්ෂණය යන විශේෂිත නව උපාධි පාඨමාලාවන් හයක් හඳුන්වා දීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මූලිකත්වය ගෙන ඇත.

අධ්‍යයන ජයග්‍රහණ:

තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව (BICT) පළමු කණ්ඩායමේ ශිෂ්‍යයන් පනස් දෙදෙනක් සමත් වූහ.

පහත අධ්‍යයන කාර්යය මණ්ඩලය පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා බඳවා ගන්නා ලදී.

- එන්. ලොජීනා මහත්මිය - කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යාලයෙන් පිරිනමන ලද ආචාර්ය උපාධිය
- ඩබ්. ඒ. එස්. සී. පෙරේරා මෙනවිය - කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යාලයෙන් පිරිනමන ලද දර්ශනවේදී ආචාර්ය උපාධිය

සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩමුළු /වැඩසටහන්:

- වඩමාරඩ්වි අධ්‍යාපන කලාපයේ තාක්ෂණ විෂය ධාරාව හදාරන උසස් පෙළ සිසුන් ඉලක්ක කර ගනිමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය විසින් පසුගිය වර්ෂවල ප්‍රශ්න පත්‍ර පුනරීක්ෂණ වැඩමුළුව පවත්වන ලදී.
- CodeGen, ශ්‍රී ලංකාව තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාවේ (BICT) අවසන් වසර ශිෂ්‍යයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන සැසියක් පවත්වන ලදී.

දැනුම් ව්‍යාප්තිය

- යාපනය විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨය විසින් පිරිනමනු ලබන අධ්‍යාපනය පිළිබඳ ආචාර්ය උපාධිය සඳහා කාර්ය මණ්ඩලය සහ යටිතල පහසුකම් සපයා ඇත.
- යාපනය විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨය විසින් පිරිනමනු ලබන අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා කාර්ය මණ්ඩලය සපයා ඇත.

කර්මාන්ත අතර සහයෝගීතාව:

ශිෂ්‍යයන් සහ මහජනතාව සඳහා තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ වෘත්තීය ප්‍රදර්ශනය SLASSCOM විසින් සංවිධානය කරන ලදී.



SLASSCOM වෘත්තීය ප්‍රදර්ශනය

සිසු ජයග්‍රහණ:

- තෙවන වසරේ ශිෂ්‍ය කණ්ඩායමක් සම්මාන දෙකක් දිනා ගත්හ; MindXtra ජයග්‍රාහකයා සහ මොරටුව විශ්වවිද්‍යාලයේ ලියෝ සමාජය විසින් පවත්වන ලද MindXtra අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවලියේ Best IoT නිර්මාණ ජයග්‍රාහකයන් ඒ අතර විය.
- තෙවන මට්ටමේ ශිෂ්‍යයෙකු වන **ක්‍රිෂ්ණ** ප්‍රසාන්ත් මහතා, AIESEC, Sri Lanka සමඟ එක්ව ඉන්දියාවේ නවදිල්ලියේ Green Asian Voice කවුන්සිලයේ "නායකත්ව සංවර්ධනය පිළිබඳ තරුණ සංවිධානය" යන තේමාව යටතේ ව්‍යාපෘතියක පළමු ස්වේච්ඡා සේවකයා ලෙස තෝරා ගන්නා ලදී.

අසාර්ථකවීම් සහ සාධාරණීකරණය:

- තාක්ෂණික අධ්‍යයන පීඨයේ - අදියර II යටතේ වර්ග මීටර් 7614ක ගොඩනැගිල්ල ඉදිකිරීමේ යෝජනාව ප්‍රමාද විය. මෙය සිසුන් බඳවා ගැනීම ඉහළ දැමීමට සහ විශේෂීකරණය කරන ලද හා නව උපාධි පාඨමාලානන් හඳුන්වා දීමට බාධාවකි.
- රජයේ ප්‍රතිපත්ති හේතුවෙන් අනුමත කාර්යය මණ්ඩල සේවක සංඛ්‍යාව බඳවා ගැනීමට නොහැකි වීම. මෙය විශේෂීකරණය කරන ලද හා නව උපාධි පාඨමාලාවන් හඳුන්වා දීමට බාධාවකි.

අනාගත සැලසුම්:

- පාසල් සිසුන් සහ ආදි සිසුන් සඳහා ඔවුන්ගේ වැඩසටහන්කරණය සහ තොරතුරු තාක්ෂණ ආශ්‍රිත නිපුණතා වැඩිදියුණු කිරීම උදෙසා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කෙටි පාඨමාලා රැසක් හඳුන්වා දීම.
- පාසල් ගුරුවරුන් සහ සිසුන් සඳහා වැඩමුළු පැවැත්වීම.
- තවත් තොරතුරු තාක්ෂණ සමාගම් සහ අදාළ කර්මාන්තය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- නව ශිෂ්‍ය සමාජ සහ සමිති ආරම්භ කිරීම.

3.4 පුස්තකාලය

හැදින්වීම

වවුනියා විශ්වවිද්‍යාලයේ පුස්තකාලය කාර්යය මණ්ඩලයේ සහ ශිෂ්‍යයන්ගේ ඉගැන්වීම්, අධ්‍යයන සහ පර්යේෂණ අත්දැකීම් වර්ධනය කිරීමේ දී ඔවුන්ගේ දැනුම, කුසලතා සහ හැකියාවන් වැඩිදියුණු කිරීමට අවශ්‍ය සියලු තොරතුරු ඔවුන්ට ලබා දෙමින් සුවිශේෂී අගනා කාර්යභාරයක් ඉටු කරයි. 1992 වර්ෂයේ දී උතුරු පළාත් අනුබද්ධ විශ්වවිද්‍යාල විද්‍යාලය ආරම්භ කිරීමත් සමඟ පුස්තකාලය ආරම්භ කරන ලදී. පුස්තකාලය අධ්‍යයන කාර්යය මණ්ඩල ධාරිතාවෙන් එක් ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයෙකු සහ කළමනාකාර සහකාර සේවක කාර්යය මණ්ඩල ධාරිතාවෙන් සේවකයන් හතරක් සමඟින් කටයුතු ආරම්භ කළේ ය.

සේවය

2022 වර්ෂයේ දී, යාවත්කාලීන සහ ගුණාත්මක තොරතුරු සම්පත් වෙත ක්ෂණිකව හා කාලෝචිත ප්‍රවේශයක් ලබා දීමෙන් තම මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රජාව සවිබල ගැන්වීමට පුස්තකාලය කැප වීමෙන් කටයුතු කළේය. පුස්තකාලය පාඨකයන්ට (ආසන්න වශයෙන් 3,600) සිය සේවාවන් සපයන ලදී.

පුස්තකාල එකතුව පොත්, විද්වත් ජර්නල් සහ සඟරා, පුවත්පත්, පත්‍රිකා, විද්‍යුත් සම්පත් (විද්‍යුත් පොත් සහ විද්‍යුත් සඟරා) සහ ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රව්‍ය 16,248කින් සමන්විත වේ. රු.268,705 ක වටිනාකමින් යුත් පොත් 122ක් පුස්තකාලයට සමීප සම්පත් දායකයන් විසින් පිරිනමන ලදී.

සමානතා පරීක්ෂාව සඳහා වූ Ithenticate මෘදුකාංගය ශාස්ත්‍රීය ප්‍රජාවට ප්‍රතිලාභ ලබා දීම සඳහා භාවිතා කරන ලදී. එසේම, නාමික ගාස්තුවකට ඡායා පිටපත් කිරීමේ සේවාවක් ලබා දෙන ලදී.

යටිතල පහසුකම් සංවර්ධනය

සිසුන්ගේ සහ කාර්යය මණ්ඩලයේ අවශ්‍යතා එකවර ඉටු කළ හැකි නව තෙමහල් පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදි වෙමින් පවතී. තවද, එහි සිසුන් 150 දෙනෙකුට එකවර පහසුකම් සැලසෙන විද්‍යුත් සම්පත් ඒකකයක් ද ක්‍රියාත්මක වෙමින් පවතී. තවද, එහි සිසුන් 200කට නවාතැන් ගත හැකි සම්මන්ත්‍රණ කාමරයක්, වීඩියෝ සම්මන්ත්‍රණ කාමරයක්, දුර්ලභ දෑ එකතු කිරීම් සඳහා අංශයක් සහ කෞතුකාගාරයක් ඇත.

විද්‍යුත් සම්පත්

Emerald Insight, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය සහ Taylor & Francis දත්ත සමුදායන් මෙහි පවතී.

ආයතනික ඩිජිටල් පර්යේෂණ ගබඩා

ආයතනයේ දෘශ්‍යතාව වර්ධනය කිරීම සඳහා පීඨ සාමාජිකයන්ගේ විද්වත් ප්‍රකාශන සමඟ ආයතනික ඩිජිටල් පර්යේෂණ ගබඩා ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

ව්‍යවහාරික විද්‍යා පීඨය [268]; ව්‍යාපාර අධ්‍යයන පීඨය [239]; තාක්ෂණ අධ්‍යයන පීඨය [39]; පුස්තකාලය [30]; විශ්වවිද්‍යාල ප්‍රකාශන [342]

සිසුන්ගේ තොරතුරු හැසිරවීමේ කුසලතා වර්ධනය කිරීම සඳහා තොරතුරු සාක්ෂරතා වැඩසටහන් පැවැත්වීම.

ප්‍රජා සත්කාරක වැඩසටහන

ප්‍රාදේශීය මට්ටමින් දැනුවත් කිරීමේ සහ පුස්තකාල කළමනාකරණ වැඩසටහන් දෙකක් පවත්වන ලදී. ඉන් එක් වැඩසටහනක් කිලිනොච්චි මහජන පුස්තකාල පරිශ්‍රයේදීත්, අනෙක් වැඩසටහන වවුනියාව මහජන පුස්තකාලයේදීත් පවත්වන ලදී.

රැස්වීම්

මෙම වසර තුළ පුස්තකාල කමිටු රැස්වීම් පහක් පැවැත්විණි.

3.5 තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය

හැඳින්වීම

වවුනියා විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) 2021 වර්ෂයේ ඔක්තෝම්බර් 01 වන දින අංක 09/2019 දරණ කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාපිත කරන ලදී. වවුනියා විශ්ව විද්‍යාලයේ සනාතන මණ්ඩලයේ (සෙනෙට් සභාව) ස්ථාවර කමිටුවක් විසින් තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයෙහි (CQA) අධ්‍යයන, පරිපාලන සහ මූල්‍ය පාලනයන් කළමනාකරණය කරනු ලබයි. පීඨ මට්ටමේ තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාකාරකම් තත්ත්ව සහතික අතුරු නීතිවලට අනුකූලව පීඨ තත්ත්ව සහතික කිරීමේ ආයතන මඟින් පාලනය කෙරේ.

තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලාවන්හි විශිෂ්ඨත්වය ළඟා කර ගැනීමට අපේක්ෂා කරන අතර උසස් අධ්‍යාපන පද්ධතියේ සියලුම අංගයන් සඳහා ප්‍රත්‍යක්ෂ තත්ත්ව සහතික පද්ධතියක් නිර්මාණය කර සක්‍රීය කිරීමෙහි ලා දායක වෙමින් සියලුම ඉගැන්වීම්, අධ්‍යයන, ශිෂ්‍ය ආධාරක අක්ෂ සහ දේශීය හා ජාත්‍යන්තර අධ්‍යයන ප්‍රමිතීන් මත පදනම් වූ ආයතනික සංවර්ධනය සඳහා අඛණ්ඩ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියක් පවත්වාගෙන යයි.

වැඩමුළු /පුහුණු වැඩසටහන් /ක්‍රියාකාරකම්

- PLO සහ ILO සිතියම්ගත කිරීම පිළිබඳ වැඩමුළුවක්, පීඨ සහ පරිවාස අධ්‍යයන කාර්යය මණ්ඩලයේ විෂයමාලා සංවර්ධන කමිටුවේ සාමාජිකයන් සඳහා ජුනි 22 වන දින පවත්වන ලදී.
- උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතිකය පිළිබඳ ශ්‍රී ලංකාවේ අනාගත දර්ශනය පිළිබඳ වැඩමුළුවක් සැප්තැම්බර් 22 වන දින පවත්වන ලදී.
- QACහි අධ්‍යක්ෂ මහාචාර්ය තිලක් පී.ඩී. ගමගේ මහතා සැප්තැම්බර් 22 වන දින වවුනියා විශ්වවිද්‍යාලයට ගොස් තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) සහ FQACsහි පහසුකම් පිළිබඳව සාකච්ඡා කළේ ය.
- තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) විසින් විෂයමාලා ඇගයීම් කමිටුව සමඟ එක්ව විෂයමාලා සංවර්ධනය සඳහා වූ ප්‍රතිපත්ති සහ ප්‍රායෝගික සංග්‍රහය සකස් කරන ලද අතර එය වවුනියා විශ්වවිද්‍යාලයේ 12 වන සභා රැස්වීමේ දී අනුමත කරන ලදී.
- අධ්‍යයන පීඨ තුනෙහි අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා අධ්‍යයන වගවීම සහ වැඩ ප්‍රමාණය ගණනය කිරීම නොවැම්බර් 26 වන දින පැවති වවුනියා විශ්වවිද්‍යාලයේ 14 වන කවුන්සිලයේ දී අනුමත කරන ලදී.

බාහිර සමාලෝචන සඳහා අදාළ ස්ථාන නිරීක්ෂණ චාරිකාවේ යෙදීම

IR/PR	පාඨමාලාවේ නම	ස්ථාන නිරීක්ෂණ චාරිකාවේ යෙදෙන දිනයන්
වැඩසටහන් සමාලෝචනය	පරිසර විද්‍යාව පිළිබඳ විද්‍යාවේ දී ගෞරව උපාධිය	සැප්තැම්බර් 162
වැඩසටහන් සමාලෝචනය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේ දී ගෞරව උපාධිය	නොවැම්බර් මස 24 - 25
වැඩසටහන් සමාලෝචනය	ව්‍යවහාරික ගණිතය සහ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේ දී ගෞරව උපාධිය	දෙසැම්බර් 20 - 21

3.6 විශ්වවිද්‍යාල පර්යේෂණ හා ආචාර ධර්ම කමිටුව (UREC)

හැදින්වීම

1978 අංක 16දරන විශ්වවිද්‍යාල පනතේ 46 (6) (vii) වගන්තියට අනුව වවුනියාව විශ්වවිද්‍යාලයේ (UoV) පර්යේෂණ හා ආචාර ධර්ම කමිටුව (UREC) 2021 සැප්තැම්බර් මාසයේදී පිහිටුවන ලදී. කමිටුවේ අරමුණ පර්යේෂණ, ශිෂ්‍යත්ව ප්‍රවර්ධනය කිරීම ය. සහ බහුවිධ ක්ෂේත්‍රයේ UoV හි පර්යේෂකයන්ට නවෝත්පාදන, සදාචාරාත්මක ප්‍රමිතීන් සහතික කිරීම සහ පර්යේෂණ ප්‍රතිඵල දේශීය, ජාතික සහ ජාත්‍යන්තරව බෙදා හැරීමට පහසුකම් සපයයි. තවද, තිරසාර සංවර්ධනය සඳහා වඩා හොඳ අවබෝධයකින් දැනුම පදනම් වූ සමාජයක් පෝෂණය කිරීම තුළින් කලාපීය සහ ජාතික සංවර්ධනය සඳහා දායකත්වය ප්‍රවර්ධනය කරයි.

අරමුණු

- ගැටළු මත පදනම් වූ පර්යේෂණ ක්‍රියාකාරකම් හරහා කලාපීය සහ ජාතික අවශ්‍යතා සපුරාලීම
- ගුණාත්මක නව්‍ය පර්යේෂණ සිදුකිරීමට පර්යේෂකයන්ට පහසුකම් සැලසීම
- වෙනත් පිළිගත් විශ්වවිද්‍යාල හෝ පර්යේෂණ ආයතන සමඟ සහයෝගී පර්යේෂණ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම.
- ජාතික/ජාත්‍යන්තර පර්යේෂණ සංසද සහ සම්මන්ත්‍රණ තුළ තම පර්යේෂණ ප්‍රතිඵල බෙදා හැරීමට පර්යේෂකයන්ට හැකි කිරීම
- ධාරිතා සංවර්ධන වැඩසටහන් හරහා කාර්ය මණ්ඩලයේ පර්යේෂණ කුසලතා වැඩි දියුණු කිරීම
- ප්‍රයෝජනවත් ප්‍රතිඵල සඳහා පර්යේෂණවල සදාචාරාත්මක ප්‍රමිතීන් සහතික කිරීම

ක්‍රියාකාරකම්

- පර්යේෂණ දීමනා කොන්දේසි සංශෝධනය කර නිර්දේශ කර ඇත.
- ඉදිරි පර්යේෂණ සම්මන්ත්‍රණ ආදිය පිළිබඳ තොරතුරු බෙදා හැරීම.
- පර්යේෂණ සහ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා අරමුදල් අවස්ථා (පර්යේෂණ පදනම් වූ)
- පීඨ සම්මන්ත්‍රණ සහ සභරා දියත් කිරීම සඳහා නිර්දේශිත අරමුදල් ප්‍රදානය කිරීම.
- 'පර්යේෂණ ප්‍රදාන' ප්‍රතිපත්තිය සහ අයදුම් පත්‍රය සකස් කිරීම ආරම්භ කිරීම.
- STEM සහ HEMS විෂයයන් සඳහා පර්යේෂණ ප්‍රදාන සඳහා අයදුම්පත් කැඳවීම.
- විද්වතුන්ගෙන් පර්යේෂණ යෝජනා හතක් ලැබීම සහ ද්විත්ව අන්ධ සමාලෝචනය.
- අරමුදල් සඳහා නිර්දේශිත පර්යේෂණ යෝජනා පහක්.
- විවිධ ආකාරවලින් පර්යේෂණ පැවැත්වීමේදී සම්මානලාභීන් නිර්මාණය කිරීම.
- 'ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය' පිහිටුවීම සඳහා සංකල්ප පත්‍රිකා සකස් කිරීම.
- සදාචාරාත්මක නිෂ්කාශන ලේඛන සංවර්ධනය කිරීම (සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) සහ අයදුම් පත්‍රය).

වැඩමුළුව

- ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පර්යේෂණ සහ ඇගයීම් භාවිතය පිළිබඳ පාර්ලිමේන්තුව සහ ශාස්ත්‍රාලය අතර සහයෝගීතාව
  - ඔක්තෝබර් 20 වැනිදා

3.7 සෞඛ්‍ය මධ්‍යස්ථානය

හැඳින්වීම

සියලුම විශ්ව විද්‍යාල සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට මෙම මධ්‍යස්ථානයේ නොමිලේ උපදේශන සහ ප්‍රතිකාර ලබා ගැනීමේ අයිතිය ඇත.

සෞඛ්‍ය මධ්‍යස්ථානය මගින් වෛද්‍ය නිලධාරීන්ට පැමිණීමට පහසුකම් සපයන අතර අර්ධකාලීන සෞඛ්‍ය සේවා සහායකයින් සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට රෝග සඳහා ප්‍රතිකාර කරන අතර වැඩිදුර ප්‍රතිකාර සඳහා රෝගීන් වවුනියාව මහ රෝහලට යොමු කරයි. මීට අමතරව, සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමේ වගකීම දරයි.

සෞඛ්‍ය මධ්‍යස්ථානය යනු විශ්ව විද්‍යාලය තුළ සෞඛ්‍ය සේවා සැපයීමේ සේවා ස්ථානය වන අතර එහිදී රෝග නිවාරණ සහ රෝග නිවාරණ සේවා සපයනු ලැබේ.


සෞඛ්‍ය මධ්‍යස්ථානය මගින් රෝගීන් 3481 දෙනෙකුට වෛද්‍ය, සෞඛ්‍ය සේවා සහ උපදේශන සේවා සපයන ලදී.

සපයනු ලබන සේවාවන්:

- සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා සුවදායී සෞඛ්‍ය සේවා
- නිවාරණ සෞඛ්‍ය රැකවරණය: සෞඛ්‍ය අධ්‍යාපනය, එන්නත්, ආදිය.
- වෛද්‍ය උපදේශනය
- සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට වෛද්‍ය සහතික නිකුත් කිරීම
- අවශ්‍ය නම් රෝගීන් රෝහල් වෙත යොමු කිරීම
- සෞඛ්‍ය මධ්‍යස්ථානයේ අවධානය යොමු විය යුතු ගුණාත්මක ආහාර සහ ආපනශාලා සහ අනෙකුත් ප්‍රදේශවල පිරිසිදුකම අධීක්ෂණය කිරීම
- මුඛ සෞඛ්‍ය සේවා
- අක්ෂි සායනය, වර්තන සේවා.

අනාගත සැලසුම්:

- දන්ත සහ මුඛ සත්කාර සේවා
- රසායනාගාර පහසුකම්
- සෞඛ්‍ය ප්‍රවර්ධන සේවාව



රූපය 3.1: සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ලබන රෝගීන් සංඛ්‍යාව (රෝග අනුව)

3.8 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

හැඳින්වීම

මාණ්ඩලික සංවර්ධන මධ්‍යස්ථානය කාර්යමණ්ඩලයේ සියළුම කාණ්ඩවල වර්ධනයට සහ වෘත්තීය සංවර්ධනයට අවස්ථා සපයන ක්‍රියාකාරකම් සිදු කරයි. ඊට අමතරව, එය තහවුරු කිරීම සහ ප්‍රවර්ධනය සඳහා පශ්චාත් බඳවාගත් සුදුසුකම්, සේවා අභ්‍යන්තර පුහුණුව තුළින් සේවා විශේෂිත උසස් දැනුම සහ කුසලතා ලබා ගැනීම සහ ඔවුන්ගේ වෘත්තීය ජීවිතය තුළ ඔවුන්ගේ තිරසාරභාවය සඳහා වර්තමාන ගෝලීය ප්‍රවණතා පිළිබඳ දැනුම ලබා ගැනීමට පහසුකම් සපයයි.

වැඩමුළු

- ජනවාරි 19 වන දින බෝ නොවන රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන.
- බෝ නොවන රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන ජනවාරි 20.
- මාර්තු 11 නිවාඩුවට අදාළ නීතිමය ක්‍රියා පටිපාටි.
- ආචාර්ය උපාධි යෝජනා ලිවීම සහ විදේශයන්හි හොඳම විශ්ව විද්‍යාල තෝරා ගැනීම මැයි 25 වෙනිදා.
- Adobe Photoshop ජූනි 15 වෙනිදා.
- PLO සහ ILO සිතියම්ගත කිරීම ජූනි 22 වන දින.
- ජූලි 27 වන දින විභාගවල පාර්ශවකරුවන්ගේ වගකීම්.
- අධ්‍යයන උපදේශනය අගෝස්තු 24.
- අගෝස්තු 31 වන දින උසස් අධ්‍යාපන ශ්‍රේණිගත කිරීම.
- සැප්තැම්බර් 28 වන දින කාර්යාල සන්නිවේදනය සඳහා ලිවීමේ කුසලතා.
- ඔක්තෝම්බර් 19 වෙනිදා ඵලදායී ශාස්ත්‍රාලිකයෙකු වන්නේ කෙසේද.
- නොවැම්බර් 16ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි.
- නොවැම්බර් 30 වැනි දින "තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI)" පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය.
- "වෘත්තීය උපදේශනය සහ පෞරුෂ සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන දෙසැම්බර් 03 වැනිදා.

3.9 ජාත්‍යන්තර අංශය

හැඳින්වීම

පුද්ගලයන් සහ ආයතන සමඟ ජාත්‍යන්තර සහයෝගීතාවයන් ඇති කර ගනිමින් විශ්ව විද්‍යාලයේ අධ්‍යයන, ආර්ථික සහ සංස්කෘතික මානයන් පොහොසත් කිරීම සඳහා වවුනියාව විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර අංශය 2021 ඔක්තෝම්බර් මාසයේදී පිහිටුවන ලදී. විශ්ව විද්‍යාලයේ සියලුම විෂයයන් සඳහා දිගුකාලීන සහ තිරසාර සහයෝගීතා ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. එය විදේශීය විශ්ව විද්‍යාල, පර්යේෂණ ආයතන, කොන්සල් කාර්යාල/තානාපති කාර්යාල, කර්මාන්ත සහ වෙනත් ජාල සමඟ ජාත්‍යන්තර සබඳතා සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වගකීම දරයි. එසේම, මෙම අංශය ජාත්‍යන්තර සිසුන්, නියෝජිතයින් සහ අමුත්තන් පිළිගැනීම භාරව සිටී.

එහි ක්‍රියාකාරකම් පර්යේෂණ, ඉගැන්වීම් සහ ශිෂ්‍ය ක්‍රියාකාරකම්වල නිරත වේ. පර්යේෂණ සම්බන්ධයෙන්, විදේශීය විශ්වවිද්‍යාල සමඟ සහයෝගී පර්යේෂණ වැඩසටහන් සහ ගෝලීය ශිෂ්‍ය කණ්ඩායම් ව්‍යාපෘති සංවර්ධනය කිරීමට අංශය අපේක්ෂා කරනු ඇත. ඉගැන්වීම සම්බන්ධයෙන්, ජාත්‍යන්තර අංශය ජාත්‍යන්තර සහයෝගීතා පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් හරහා ගෝලීය ආර්ථිකයේ වෘත්තීන් සඳහා සිසුන් සූදානම් කරයි. ශිෂ්‍යයාගේ දෘෂ්ටිකෝණයෙන්, යෝජිත අංශය සිසුන්ගේ දක්ෂතා හෙළිදරව් කරන අතර අනෙකුත් විශ්වවිද්‍යාල සහ කර්මාන්ත සමඟ ඔවුන්ගේ අදහස් ප්‍රවර්ධනය කරයි. මීට අමතරව, වවුනියාව විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර සිසුන්ගේ ක්‍රියාකාරකම් සඳහා අංශය පහසුකම් සපයයි. අනාගතයේදී, යෝජිත ජාත්‍යන්තර

අංශය ඒකාබද්ධ හා බෙදුණු උපාධි සහ පශ්චාත් උපාධි වැඩසටහන් වැනි සහයෝගීතා උපාධි සක්‍රීය කරනු ඇත.

ජාත්‍යන්තර විශ්වවිද්‍යාල/ආයතන සමඟ සහයෝගිතාව

- චත්‍රපති ෂාහු ව්‍යාපාර අධ්‍යාපන හා පර්යේෂණ ආයතනය – **CSIBER, India** වවුනියාව විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් ඔක්තෝබර් 12 වැනි දින අත්සන් කරන ලදී.



චත්‍රපති ෂාහු ව්‍යාපාර හා පර්යේෂණ ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම

- Ankara Yildirim Beyazit **විශ්වවිද්‍යාලය, තුරුකි**, ඇමරිකා එක්සත් ජනපදයේ ඇරිසෝනා විශ්ව විද්‍යාලය, බෙලාරුස්හි ග්‍රොඩ්නෝ හි යන්කා කුපාල රාජ්‍ය විශ්ව විද්‍යාලය**,** සහ චුවාෂ් ප්‍රාන්ත අධ්‍යාපනික විශ්ව විද්‍යාලය, රුසියාව වවුනියාව විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමේ ක්‍රියාපටිපාටිය සකස් කරමින් සිටියහ.
- තවද, අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා වවුනියාව විශ්වවිද්‍යාලය විශ්වවිද්‍යාල 12ක් සමඟ සාකච්ඡාවක් ආරම්භ කළේය.
  - භාරතියාර් විශ්ව විද්‍යාලය, ඉන්දියාව,
  - මැනිටෝබා විශ්ව විද්‍යාලය, කැනඩාව,
  - මැක්ගිල් විශ්ව විද්‍යාලය, කැනඩාව,
  - පොන්ඩිචෙරි විශ්ව විද්‍යාලය, ඉන්දියාව,
  - ඩැගෙස්තාන් රාජ්‍ය විශ්ව විද්යාලය, රුසියාව,
  - රුසියාවේ මිත්‍රත්ව විශ්ව විද්‍යාලය, රුසියාව,
  - ජාතික පර්යේෂණ විශ්ව විද්යාලය, රුසියාව,
  - උතුරු-බටහිර කළමනාකරණ ආයතනය, රුසියාව,
  - යූරල් රාජ්ය ආර්ථික විශ්ව විද්‍යාලය රුසියාව,
  - රුසියානු ජනාධිපති ඇකඩමියේ ව්ලැඩිමීර් ශාඛාව, රුසියාව,
  - කීල් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය,
  - මැලේසියාවේ ඉන්ටි විශ්ව විද්‍යාලය.

පැමිණීම

- මහාචාර්ය ආනන්දරාජා, ගේබ්‍රියල් (යුනිවර්සිටි කොලේජ් ලන්ඩන් බලශක්ති ආයතනය) අගෝස්තු 09 දින වවුනියාව විශ්වවිද්‍යාලයට පැමිණියාය.

3.10 සහජීවන මධ්‍යස්ථානය

හැදින්වීම

විශ්ව විද්‍යාලයේ සහජීවන මධ්‍යස්ථානය සිසුන්ට සාමකාමීව ජීවත් වීමට සහ අන්තර් වාර්ගික, අන්තර් සංස්කෘතික සහ අන්තර් ආගමික අවබෝධය සහ හුවමාරුව වර්ධනය කිරීමට සහාය වීමට උත්සාහ කරයි. ඊට අමතරව, එය පශ්චාත් ගැටුම් ශ්‍රී ලංකාව සඳහා පුළුල් අධ්‍යාපනයක් ලබා දෙයි. වවුනියාව විශ්ව විද්‍යාලයේ සමගිතා මධ්‍යස්ථානයක් නිල වශයෙන් ආරම්භ කෙරුණේ 2021 සැප්තැම්බර් 25 වැනිදාය. අතිගරු ජනාධිපතිතුමා විසින් 2022 පෙබරවාරි 11 වන දින වවුනියාව විශ්වවිද්‍යාලයේ සහජීවන මධ්‍යස්ථානය විවෘත කරන ලදී..

සාමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක සහ බුද්ධිමය ප්‍රයත්නයන් තුළින් සිසුන් සහ පීඨය අතර සාමකාමී සහජීවනය පෝෂණය කිරීමට හාමනි මධ්‍යස්ථානය උත්සාහ කරයි. එය ප්‍රාදේශීය, පොදු සහ ජාතික මට්ටමින් සමගිය සහ සමාජ සහජීවනය සඳහා උත්ප්‍රේරකයක් සහ සම්පත් කේන්ද්‍රස්ථානයක් ලෙස ද ක්‍රියා කරයි..

කණ්ඩායම් සහ ප්‍රජාවන් අතර පාලම් සහ සබඳතා ගොඩනැගීම සහ සමගිය ඇති කිරීම සහ කලාපීය හා ජාතික සංවර්ධනය පවත්වාගෙන යාම (Engagement)

සම්මන්ත්‍රණ/වැඩමුළු/පුහුණුවීම්/ක්‍රියාකාරකම්

සම්මන්ත්‍රණ

- "සමාජ සංහිඳියාව කරා සුසංයෝගී ලෝකයක් නිර්මාණය කිරීම සඳහා මනසේ ප්‍රදේශවලින් ඔබ්බට යාම" පිළිබඳ ලෝක විශ්වවිද්‍යාල මිතුරන් (WUF) සමඟ සහයෝගීතාවයෙන් ජනවාරි 3 වන දින උපාධි අපේක්ෂකයින් සහ කාර්ය මණ්ඩලය සඳහා.
- පෙබරවාරි 28 වන දින කාර්ය මණ්ඩල සාමාජිකයින්, උපාධි අපේක්ෂකයින්, රාජ්‍ය සේවකයින් සහ ප්‍රජා ජනතාව සඳහා "සහජීවන මධ්‍යස්ථානය හරහා ප්‍රජාවන් නැවත ගොඩනැගීම".

පුහුණු වැඩසටහන

- ජනවාරි 22 සහ 23 යන දිනවල පවත්වන ලද කළමනාකරණ කමිටු සාමාජිකයින් වෙත ජාතික ආරක්ෂක අධ්‍යන ආයතනය සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලදී.
- දින පහක නේවාසික පුහුණු වැඩසටහන "අනාගත සූදානම් තරුණ නායකත්ව වැඩසටහන" නමින් සංවිධානය කරන ලද අතර තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ සහාය ඇතිව නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය (NCLD) සමඟ සම්බන්ධ විය.

ආගමික හා සංස්කෘතික වැඩසටහන්

- තෙපොංගල් උත්සවය ජනවාරි 28 වැනිදා.
- 2022 වසර සඳහා අලුත් අවුරුදු උත්සවය.
- රාමසාන් සංස්කෘතික උත්සවය.
- ඔක්තොම්බර් 5 සරස්වතී පූජාවේ වන්නි උත්සවය.
- දෙසැම්බර් 16 වෙනිදා නත්තල් ආගමික උත්සවය.



වැඩමුළු

- පර්යේෂණ යෝජනාවක් සඳහා ගැටළු හඳුනාගැනීම (සංහිඳියාව සහ ප්‍රතිසන්ධානය) ජුනි 8 වැනිදා.
- සමගිය සහ සංහිඳියාව පිළිබඳ පර්යේෂණ මාතෘකා සංවර්ධනය කිරීම ජූනි 10.
- ජුනි **17** වන දින පර්යේෂණ යෝජනාවක් සඳහා ගැටළු හඳුනා ගැනීම.

- අගෝස්තු **31** වන දින සමගි මධ්‍යස්ථානය/සමාජ සංහිඳියා මධ්‍යස්ථාන වෙත මාර්ගගත වේදිකාවක් සාදා ගන්නේ කෙසේද.
- අගෝස්තු **25** සමාජ පර්යේෂණ වල දත්ත රැස් කිරීම.

සැප්තැම්බර් **26** වන දින සමගි දිනය සමරනු ලැබූ අතර, සහජීවන මධ්‍යස්ථානයේ පුවත් පත්‍රිකාව ප්‍රකාශයට පත් කරන ලදී.

යෝජිත ක්‍රියාකාරකම්

- දේශපාලනය තුළ කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ යෝජිත උසස් සහතික පත්‍ර පාඨමාලාව (ACEWP)
- මාධ්‍ය සාක්ෂරතාවය සහ පුවත්පත් කලාව පිළිබඳ යෝජිත උසස් සහතික පත්‍ර පාඨමාලාව (ACMLJ)
- සමගිය සහ සංහිඳියාව පිළිබඳ යෝජිත ජාත්‍යන්තර සමුළුව - (ICHR 2022)

3.11 ආබාධ සහිත පුද්ගලයන් සඳහා උපකාරක මධ්‍යස්ථානය

හැඳින්වීම

ආබාධ සහිත පුද්ගලයන් සඳහා උපකාරක මධ්‍යස්ථානය යනු කාර්ය මණ්ඩලයට සහ ආබාධිත සිසුන්ට විශේෂ සේවාවන් සපයන ස්ථාපිත මධ්‍යස්ථානයකි. කලාපයේ ආබාධ සහිත අනෙකුත් ප්‍රජා සාමාජිකයින් වෙත සිය සේවාවන් පුළුල් කිරීමට එය කැමති වේ.

එය කාර්ය මණ්ඩලය, සිසුන් සහ ආබාධ සහිත ප්‍රජා සාමාජිකයින් සඳහා හොඳින් සන්නද්ධ විශේෂ සේවා මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කරයි.

උපකාරක මධ්‍යස්ථානය අභ්‍යන්තර සමීක්ෂණය, කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුව සහ කාර්ය මණ්ඩලය පත් කිරීම සහ ප්‍රවේශ්‍යතා විගණන කණ්ඩායමක් පිහිටුවීම අවසන් කළේය. වවුනියාව විශ්වවිද්‍යාලයේ අත්පොත ක්‍රියාත්මක වෙමින් පවතී.

වැඩමුළුව

- ආබාධිතයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව අගෝස්තු 26 සහ නොවැම්බර් 25.

3.12 සංස්කෘතික මධ්‍යස්ථානය

හැඳින්වීම

සංස්කෘතික මධ්‍යස්ථානය 2022 අගෝස්තු 01 වන දින වවුනියාව විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කරන ලදී. සංස්කෘතික මධ්‍යස්ථානයක මූලික අරමුණ සිසුන්ට විශේෂ අවස්ථා, උත්සව, වැඩමුළු සහ සංස්කෘතික වැඩසටහන් මගින් සංස්කෘතිය හා කලාව පිළිබඳ ඉගෙනීමට පහසුකම් සැලසීමයි. ඊට අමතරව, අනෙකුත් ප්‍රජාවන් අවබෝධ කර ගැනීමට විශිෂ්ඨ මාර්ගයක් ලෙස සමස්ත ප්‍රජාවටම මධ්‍යස්ථානයෙන් ප්‍රතිලාභ ලැබෙනු ඇත.

එය සෞන්දර්යාත්මක කුසලතා සහ සමාජ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා වාර්ෂික කලා හා සංස්කෘතික ක්‍රියාකාරකම් සහ තරඟ නිර්මාණය හා සැලසුම් කිරීම සිදු කරයි.

ප්‍රධාන කාර්යයන් සහ වගකීම්

සෞන්දර්යාත්මක කුසලතා සහ සමාජ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා වාර්ෂික කලා හා සංස්කෘතික ක්‍රියාකාරකම් සහ තරඟ නිර්මාණය කිරීම සහ සැලසුම් කිරීම.

- වාර්ෂික වැඩසටහන් ඵලදායී ලෙස සංවිධානය කිරීම සඳහා පීඨ මට්ටමින් කලා හා සංස්කෘතික මධ්‍යස්ථානය මෙහෙයවීම.
- බාහිර සම්පත් ඇති කලාව සහ සංස්කෘතිය පිළිබඳ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම.
- විශ්වවිද්‍යාලය තුල, අන්තර් විශ්වවිද්‍යාල සහ සමාජයේ සමාජ නියෝජිතායතනවල සිසුන්ගේ සහභාගීත්වයෙන් සංස්කෘතික වැඩසටහන් සංවිධානය කිරීම සහ වේදිකාගත කිරීම.

- කලා හා සංස්කෘතික වැඩසටහන් සහ තරඟ සඳහා පාසල් සිසුන්ගේ සහභාගීත්වය සංවිධානය කිරීම.
- සංස්කෘතිය, වටිනාකම් සහ අනන්‍යතා ලේඛනගත කිරීම සඳහා සංස්කෘතික කෞතුකාගාරයක් පිහිටුවීම.

මේ කාලය තුළ අපි රැස්වීම් දෙකක් පවත්වා වවුනියාව විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කෞතුකාගාරයක් පිහිටුවීම සඳහා ඉන්දියානු කොන්සල් කාර්යාලයට යෝජනාවක් භාර දුන්නා. ස්වාමි විවේකානන්ද ආයතනයෙන් අපට සංගීත උපකරණ ලැබුණා. අපට ශිෂ්‍ය යෝජනා කිහිපයක් ලැබුණි: සංස්කෘතික මධ්‍යස්ථානය යටතේ නර්තන සමාජය, නාට්‍ය සමාජය, නිර්මාණ සමාජය, සංගීත සමාජය සහ මාධ්‍ය සමාජය. සිසුන් මෙම සමාජ ශාලා ආරම්භ කරන අතර ඒවා ක්‍රියාත්මක වේ.

3.13 විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධය (UBL)

හැදින්වීම

විශ්ව විද්‍යාල යනු දැනුමේ, නව නිපැයුම්වල සහ නවෝත්පාදනයේ මූලාශ්‍රයකි. පර්යේෂණ කළ හැකිය වටිනා භාණ්ඩ හා සේවා නිර්මාණය කිරීම සහ ඔබේ බොහෝ දේ. මේ මත, **UBL**-වවුනියාව කලාපයේ ව්‍යාපාරික ප්‍රජාවට පහසුකම් සැලසීම සඳහා පහසුකම් සපයයි.

වවුනියාව මණ්ඩපය විශ්වවිද්‍යාලයක් ලෙස උසස් කළ පසු උපකුලපතිතුමා 2021 සැප්තැම්බර් 25 වන දින පළමු කවුන්සිලයේදීම අධ්‍යක්ෂවරයකු පත් කරමින් **UBL** හඳුන්වා දෙන ලදී. එතැන් පටන් විශ්වවිද්‍යාලයට **AHEAD** මෙහෙයුම යටතේ කටයුතු කිරීමට අවසරය සහ සහයෝගය ලැබුණි. අදියර හතරක් ඇති අතර **UOV** දැනට තෙවන අදියරේ පවතී.

වැඩමුළු

- නව නිපැයුම් සහ නවෝත්පාදන පිළිබඳ වැඩමුළුව (සිසුන් සඳහා) මාර්තු 02 වන දින.
- UBL ක්‍රියාකාරකම් සහ විශ්වවිද්‍යාල කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ දායකත්වය පිළිබඳ වැඩමුළුව අගෝස්තු 10 වැනිදා.
- වවුනියාව දිස්ත්‍රික්කයේ වෙළඳුන් සඳහා වත්මන් බදු අයකිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන ඔක්තෝබර් 12 වන දින.

ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සහිත)

- ව්‍යාපාර සම්බන්ධ කිරීමේ ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීම සඳහා ලෝක බැංකුව AHEAD ප්‍රදානය යටතේ රු.4,000,000 ක ප්‍රදානයක් ලබා දුන්නේය.
- 2022 ජනවාරි මස අවසානයේ ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව අවශ්‍ය UBL සෛල ව්‍යවස්ථාව, ප්‍රතිපත්ති සහ සියලුම සම්මත ආකෘති සකස් කිරීමෙන් UBL සඳහා ලෝක බැංකුව හරහා අරමුදල් සපයන I අදියර ක්‍රියාකාරකම් මාස හතරක් ඇතුළත සාර්ථකව නිම කරන ලදී.
- I අදියර සම්පූර්ණ කිරීමෙන් පසු විශ්වවිද්‍යාලයට විශ්වවිද්‍යාලය තුළ UBL සෛලයක් පිහිටුවීම සඳහා රුපියල් මිලියන 4ක් පිරිනමන ලදී. UBL AHEAD මෙහෙයුම හරහා පත්කළ කළමණාකරුවෙකු සමඟ විශ්වවිද්‍යාලය තුළ අවශ්‍ය සියලු පහසුකම් සහිතව ක්‍රියාත්මක විය. UBL II අදියර ක්‍රියාකාරකම් 2022 ජූලි මස අවසානයේදී සම්පූර්ණ කර ඇත. අවසන් කිරීමෙන් පසුව, විභව පර්යේෂකයන්ට සහාය වීම සඳහා UBL හට තවත් රුපියල් මිලියන පහක් ප්‍රදානය කරන ලදී.
- UBL III අදියර ක්‍රියාකාරකම් 2022 ඔක්තෝම්බර් මස අවසානයේ සිදු කිරීමට පටන් ගත්තේය. මෙම අදියරේදී UBL අලෙවි කළ හැකි නිෂ්පාදන ආශ්‍රිත පර්යේෂණ සඳහා පහසුකම් සලසා ඇත. දෙසැම්බර් අග වන විට පීඨවලින් ව්‍යාපෘති භයක් හඳුනාගෙන ඇත.

3.14 ශාරීරික අධ්‍යාපන ඒකකය

හැඳින්වීම

ශාරීරික අධ්‍යාපන ඒකකය වවුනියාව විශ්වවිද්‍යාලයේ සිසුන් සහ කාර්ය මණ්ඩලය අතර ක්‍රීඩා සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරන සේවා ඒකකයකි. ශාරීරික අධ්‍යාපන ඒකකයේ සියලුම ක්‍රීඩා සහ විනෝදාත්මක කටයුතු සඳහා පහසුකම් ඇත. එසේම, එය ක්‍රීඩා ස්ථාන ලබා දීමෙන් ප්‍රජාවට සේවා සපයයි.

වැඩමුළුව

- එල්ලේ විනිසුරු වැඩමුළුව මාර්තු 13 වැනිදා.

සංවිධානාත්මක ක්‍රියාකාරකම්

- දිවංගත එස්.ඥානේශ්වරන් මහතා අනුස්මරණ ක්‍රීඩා උළෙල අප්‍රේල් 07.
- අප්‍රේල් 28-31 FBS රිදී ජුබිලිය.
- අන්තර් පීඨ නවක හමුව අප්‍රේල් 28-31.
- මාර්ග ධාවන තරඟය අගෝස්තු 27.
- දිවංගත රෙක්ටර් එන්. බාලක්‍රිෂ්ණන්ගේ අනුස්මරණය සැප්තැම්බර් 04 වැනිදා.
- ට්‍රින්කෝ කැම්පස් සුහද ක්‍රිකට් තරගය සැප්තැම්බර් 21 වැනිදා.
- විවෘත කැරම් තරඟාවලිය සැප්තැම්බර් 23-30.
- විවෘත වෙස් තරඟාවලිය සැප්තැම්බර් 23-30.
- සැප්තැම්බර් 23-30 විවෘත බැඩ්මින්ටන් තරඟාවලිය.
- විවෘත කරාටේ තරඟාවලිය සැප්තැම්බර් 23-30 දක්වා.
- වාර්ෂික මහා ක්‍රිකට් තරගය ඔක්තෝබර් 01-02.
- විවෘත නෙට්බෝල් තරඟාවලිය, 03/10/2022,
- 25 වැනි FAS සංවත්සර ක්‍රිකට් තරගය ඔක්තෝබර් 12 වැනිදා.
- පාස්කු කාර්ය මණ්ඩල මිත්‍ර ක්‍රිකට් තරගය ඔක්තෝබර් 14 වැනිදා.
- අන්තර් පීඨ තරඟාවලිය ඔක්තෝබර් 31 - නොවැම්බර් 10.

සහභාගීත්වය

- සැප්තැම්බර් 17 සහ 18 යන දිනවල ඉලන්තෙන්ඩ්‍රල් පාපන්දු තරඟාවලිය.
- සැප්තැම්බර් 20 වන දින විශ්වවිද්‍යාල ක්‍රීඩා ජාත්‍යන්තර දිනය.
- සබරා 7 රග්බි තරගාවලිය ඔක්තෝම්බර් 14 වැනිදා.
- U 23 කනිෂ්ඨ ජාතික පැසිපන්දු ශූරතාවලිය ඔක්තෝම්බර් 14 වැනිදා.
- ඔක්තෝම්බර් 19 වන දින වවුනියාව දෙමළ මධ්‍ය මහා විද්‍යාලය සමඟ වෙස්-මිත්‍ර තරගය.
- අන්තර් විශ්වවිද්‍යාල රග්බි තරගාවලිය නොවැම්බර් 05 වැනිදා.
- නොවැම්බර් 09 වන දින වවුනියාව දිස්ත්‍රික් කණ්ඩායම සමඟ බැඩ්මින්ටන් සුහද තරගය.
- වාර්ෂික ජූනියර් ප්‍රිමියර් ලීගය 2022 නොවැම්බර් 10-14 දිනවල.
- අන්තර් විශ්වවිද්‍යාල බැඩ්මින්ටන් ශූරතාවලිය නොවැම්බර් 11-13 දිනවල.
- නොවැම්බර් 16 යාපනය විශ්වවිද්‍යාලය සමඟ වොලිබෝල් මිත්‍ර තරගය.
- නොවැම්බර් 16 වන දින වවුනියාව රම්පයිකුලම් බාලිකා මහා විද්‍යාලය සමඟ වෙස් හිතකාමී තරගය.
- අන්තර් විශ්වවිද්‍යාල ජවන හා ක්ෂේත්‍ර ශූරතාවලිය නොවැම්බර් 26-27.
- අන්තර් විශ්වවිද්‍යාල ක්‍රිකට් ශූරතාවලිය නොවැම්බර් 26-27.
- අන්තර් විශ්වවිද්‍යාල කරාටේ ශූරතාවලිය දෙසැම්බර් 02-04.
- අන්තර් විශ්වවිද්‍යාල පාපන්දු ශූරතාවලිය දෙසැම්බර් 02-04.
- අන්තර් විශ්වවිද්‍යාල නෙට්බෝල් ශූරතාවලිය දෙසැම්බර් 07-08.
- අන්තර් විශ්වවිද්‍යාල කැරම් ශූරතාවලිය දෙසැම්බර් 07-08.
- දෙසැම්බර් 12 වැනිදා රජරට විශ්වවිද්‍යාලය සමඟ වෙස්, වොලිබෝල්, සහ මේස පන්දු මිත්‍රශීලී තරගය.
- අන්තර් විශ්වවිද්‍යාල මේසපන්දු ශූරතාවලිය දෙසැම්බර් 17-18.
- අන්තර් විශ්වවිද්‍යාල වොලිබෝල් ශූරතාවලිය දෙසැම්බර් 17-20.

3.15 වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය (CGU)

හැඳින්වීම

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 819 මත පදනම්ව වවුනියාව විශ්ව විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය (CGU) ස්ථාපිත කරන ලදී. ගෝලීය ආර්ථිකය තුළ තරඟකාරීව සිටීමට සහ අර්ථවත් හා ඵලදායී ජීවිතයක් ගත කිරීමට හා මෙහෙයවීමට අවශ්‍ය නිපුණතාවලින් සිසුන් සන්නද්ධ කරමින් රැකියා සඳහා සූදානම් කිරීම විශ්වවිද්‍යාල වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ වැදගත් කාර්යය වේ. එබැවින්, ඒකකයට අපගේ විශ්ව විද්‍යාල සිසුන්ගේ අධ්‍යාපනික සහ වෘත්තීය තීරණ සහ අධ්‍යයන කාර්ය සාධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ හැකිය.
එය ශ්‍රම වෙළඳපොළ සහ අධ්‍යාපන ක්‍රමය අවබෝධ කර ගැනීමටත්, තමන් ගැන ඔවුන් දන්නා දේට මෙය සම්බන්ධ කිරීමටත් උපකාර කරයි. CGU ක්‍රියාකාරකම් තුලින් උපාධි අපේක්ෂකයින්ට වැඩ සහ ඉගෙනීම පිළිබඳව සැලසුම් කිරීමට සහ තීරණය කිරීමට මග පෙන්වයි. CGU මගින් සිසුන්ට වැඩ කරන ලෝකයට සංක්‍රමණය වීමට උපකාර කරයි. CGU අපගේ උපාධිධාරීන්ට පිළිගත් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සමාගම්වල රැකියා සුරක්ෂිත කිරීමටත්, එමඟින් උපාධිධාරීන්ට සහ කර්මාන්තයට අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ලබා ගැනීමටත් අවස්ථාව සලසා දෙයි.

වැඩමුළු

- සංවිධානයේ නිෂ්පාදන කටයුතු කළමනාකරණය කිරීම - පෙබරවාරි 09
- නව සාමාන්‍ය තත්ත්වය තුල තරුණ නිපුණතා සහ රැකියා නියුක්තිය - අප්‍රේල් 06
- නව රැකියාවක් සඳහා ඉල්ලුම් කිරීමට/උසස් අධ්‍යාපනයට නව උපාධිධාරී **CV** එකක් සකස් කරන්නේ කෙසේද සහ සම්මුඛ පරීක්ෂණයකින් සාර්ථක වීමට පෞරුෂ වර්ධනය - අප්‍රේල් 27
- තොරතුරු තාක්ෂණය - නිවැරදි මාවත සඳහා මැයි 24
- තොරතුරු තාක්ෂණය - නිවැරදි මාවත සඳහා මැයි 27
- විශ්වවිද්‍යාල ප්‍රවේශය - සැප්තැම්බර් 13
- වෘත්තීය මාර්ගෝපදේශය - සැප්තැම්බර් 14.

3.16 ස්ත්‍රී පුරුෂ සමානතා සහ සමානාත්මතා සඳහා වන මධ්‍යස්ථානය (CGEE)

හැඳින්වීම

1978 අංක **16** දරන විශ්වවිද්‍යාල පනත යටතේ **CGEE** මධ්‍යස්ථානය පිහිටුවන ලදී. වවුනියාව විශ්වවිද්‍යාලය **6** වැනි සෙනෙට් රැස්වීමේදී **CGEE** සඳහා මධ්‍යස්ථානය පිහිටුවන ලදී. විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සහ සිසුන් අතර ස්ත්‍රී පුරුෂ සමානතාවය සහ සමානාත්මතාවය ගෙන ඒම කෙරෙහි කමිටුව අවධානය යොමු කරයි.

මෙම මධ්‍යස්ථානයේ පරමාර්ථය වන්නේ ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව කාර්ය මණ්ඩලය සහ සිසුන් අතර සමාන අවස්ථා උදාකර දීමයි.

2022 වර්ෂයේ ක්‍රියාකාරකම්

- සාමාජිකයින් **27** දෙනෙකුගෙන් යුත් කමිටුවක් පිහිටුවන ලදී.
- කාර්ය මණ්ඩලයෙන් එක් පැමිණිල්ලක් ලැබී, විමසා වාර්තාව උපකුලපතිවරයා වෙත යවා ඇත.
- නවක වදය පිළිබඳ **UGC** පැමිණිලි ද්වාරයෙන් පැමිණිලි ලැබී, විමසා වාර්තාව **UGC** වෙත යවන ලදී.

අනාගත සැලැසුම්

- **ToT** වැඩමුළුව **2023** මාර්තු **21** දිනට නියමිතයි - විවිධත්වය සමඟ ජීවත් වීමට ඉගෙනීම
- සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළුවක් පැවැත්වීම - දැනුවත් කිරීමේ වැඩසටහන

3.17 ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය

හැඳින්වීම

"ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය" (IRC) යනු ශාස්ත්‍රීය පර්යේෂණ, දැනුම සහ තාක්ෂණ හුවමාරුව සහ විද්වත් හා ව්‍යවසාය ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා චින්තන ටැංකි ක්‍රියාකාරකම්වල විශිෂ්ටත්වයේ ප්‍රමුඛ මධ්‍යස්ථානයයි.

තිරසාර වෙනසක් ඇති කිරීම සඳහා කලාපීය, ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ අභිවෘද්ධිය සඳහා පර්යේෂණ අවස්ථා වැඩි දියුණු කිරීම වෙනුවෙන් ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සහ කර්මාන්ත අතර සහයෝගීතාව පුළුල් කිරීම සඳහා බහුවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ සඳහා සහාය වීම, සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මෙමගින් සිදුවේ. වවුනියාව විශ්වවිද්‍යාලය තුළ ඇති අනෙකුත් මධ්‍යස්ථාන සහ පීඨ සමඟ සම්බන්ධීකරණය සහ සහයෝගීතාවය මෙන්ම අනෙකුත් කලාපීය, ජාතික සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් මෙය සාක්ෂාත් කරගනු ඇත.

- **"විවිධත්වය සමඟ ජීවත් වීමට ඉගෙනීම"** පිළිබඳව කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට පුහුණුව ලබා දීම.
- සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා වැඩි පුහුණුවක් ලබා ගැනීමට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂඥයා ලබා ගන්න.

හවුල්කාරිත්වයේ ප්‍රතිලාභ

- සම්බන්ධිත රටවල, සංවිධාන/ආයතන සහ ප්‍රජාවන්ගේ ප්‍රතිපත්ති සහ භාවිතයන්හි ගුණාත්මක භාවය වැඩි කිරීම
- අධ්‍යාපනය, පුහුණුව, පර්යේෂණ, තරුණයින් සඳහා නවෝත්පාදන යන ක්ෂේත්‍රවල පොදු අවශ්‍යතා සහ ප්‍රමුඛතා හඳුනාගෙන අන්තර්ජාතිකව, බහු විනයානුකූලව සහ අංශ/ පාර්ශ්වකරුවන්ගේ ප්‍රජාව හරහා වැඩ කිරීමට ඇති හැකියාව/හැකියාව ගොඩනැගීම,
- එක් එක් සංවිධානයේ සන්දර්භයට සමානුපාතිකව වැඩි දියුණු කිරීම් සහ නව ප්‍රවේශයන් කරා යොමු කරන දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාර වෙනසක් සඳහා (පුද්ගල, ආයතනික හෝ ආංශික මට්ටමින්) සක්‍රීය පරිවර්තනය ඇති කිරීම.

3.18 මහජන සම්බන්ධතා ඒකකය (PRU)

හැඳින්වීම

මහජන සම්බන්ධතා ඒකකය මහජන අපේක්ෂාවන් සහ ආකල්ප තක්සේරු කිරීම සහ විශ්වවිද්‍යාලය සහ එහි මහජනතාව අතර අන්‍යොන්‍ය සබඳතා සහ අවබෝධය පවත්වාගෙන යාම අධීක්ෂණය කරයි.

මෙහි මූලික අරමුණ වන්නේ ආයතනය සහ එහි විවිධ මෙහෙයුම් සහ වැඩසටහන් සහ එහි සියලුම පාර්ශ්වකරුවන් අතර ශක්තිමත් අන්තර්ක්‍රියාකාරීත්වයක් ඇති කිරීම සහ අවශ්‍ය පරිදි මාධ්‍ය /මහජනතාව වෙත තොරතුරු බෙදා හැරීමයි. තවද, PRU මගින් ආයතනයේ ඉගෙනුම් පරිසරයේ ගුණාත්මක භාවය සහ විවිධත්වය, අධ්‍යාපන මට්ටම සහ මහජන ප්‍රතිපෝෂණ සහ අපේක්ෂාවන් ලබා ගැනීම සඳහා වන කැපවීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට කැපවී සිටී.

මහජන සම්බන්ධතා ඒකකයේ කාර්යය

ආයතනය සහ බාහිර ලෝකය අතර සම්බන්ධයක් ලෙස වවුනියාව විශ්ව විද්‍යාලයේ මහජන සම්බන්ධතා ඒකකයේ කටයුතු ක්‍රියාත්මක වනු ඇත. තවද මාධ්‍ය ආයතන සමඟ සම්බන්ධ වීමෙන්, සමාජ මාධ්‍යවල එය ප්‍රවර්ධනය කිරීමෙන් සහ තොරතුරු සැපයීම මගින් පාර්ශවකරුවන්ට සහාය වීමෙන් ආයතනයේ වටිනාකම ඉහළ නැංවීමට මහජන සම්බන්ධතා ඒකකය උත්සාහ කරනු ලබයි.

- මාධ්‍ය නියෝජනය. සමාගමක් හෝ පුද්ගලයෙකු මාධ්‍යයට නියෝජනය කිරීම මහජන සම්බන්ධතා වල වඩාත් ප්‍රසිද්ධ කාර්යයකි.
- අර්බුද සන්නිවේදනය
- අන්තර්ගතයන් සංවර්ධනය
- පාර්ශවකරුවන්ගේ සබඳතා.
- සමාජ මාධ්‍ය කළමනාකරණය.

මහජන සම්බන්ධතා ඒකකයේ කාර්යභාරය

1. විශ්වවිද්‍යාලයේ වැදගත් සිදුවීම් පිළිබඳ තොරතුරු මධ්‍ය වෙත ලබාදීම
2. විදේශීය සහ දේශීය අමුත්තන්ට අදාළ සියලු කාරණා සඳහා සහභාගී වීම - දේශීය හා විදේශීය අමුත්තන් සඳහා විශ්වවිද්‍යාලය තුළ නවාතැන්, ප්‍රවාහනය සහ මාර්ගෝපදේශ චාරිකා සංවිධානය කිරීම
3. මහජන අපේක්ෂාවන්/ ප්‍රතිපෝෂණය දැනගැනීම සඳහා විශ්වවිද්‍යාලය සහ බාහිර සංවිධාන සහ මහජනතාව අතර සමීප සබඳතා සඳහා පහසුකම් සැලසීම
4. අදාළ අංශ සහ කාර්යාල වෙත අමුත්තන් පිළිගැනීම සහ යොමු කිරීම සහ විමර්ශනය කිරීමේදී අමුත්තන්ට විශ්වවිද්‍යාලය පිළිබඳ අදාළ තොරතුරු ලබා දීම.
5. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ විමසීම්/පැහැදිලි කිරීම්වලට ප්‍රතිචාර දැක්වීම

4 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන

4.1 හැඳින්වීම

විශ්වවිද්‍යාල අධ්‍යයන වැඩසටහන් සියල්ල ක්‍රියාත්මක වූයේ රටේ පවතින ආර්ථික අර්බුදය මධ්‍යයේ ය. සේවක සංඛ්‍යාව බඳවා ගැනීම තාවකාලිකව අත්හිටුවා තිබුණත්, මේ වන විටත් අලුතින් පිහිටුවන ලද මෙම විශ්වවිද්‍යාලයට කාර්ය මණ්ඩල හිඟය මධ්‍යයේ ක්‍රියාත්මක වීමට අපහසු වුවද, විශ්වවිද්‍යාලය සියලු අධ්‍යයන, පර්යේෂණ සහ පරිපාලන කටයුතු සම්පූර්ණ කර ඇත. සියලුම ඉගැන්වීම් කටයුතු පෞද්ගලිකව සහ අන්තර්ජාලය හරහා සිදු කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රජාව පොත් පහක් සහ පර්යේෂණ පත්‍රිකා 79ක් සහරා ලිපි ලෙස ප්‍රකාශයට පත් කළ අතර ඒවා දේශීය හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලදී සාරාංශ ලෙස ඉදිරිපත් කර තිබේ. නව සහරා දෙකක් එළිදැක්විණි. වාර්ෂික පර්යේෂණ සමුළු තුනක් පවත්වන ලදී. අධ්‍යයන කාර්ය මණ්ඩලය තිදෙනෙකු පර්යේෂණ ආධාර ලබාගෙන ඇත.

අධ්‍යන කාර්ය මණ්ඩලයට දෙදෙනෙකු බඳවා ගන්නා ලද අතර එක් අයෙකු පශ්චාත් උපාධි අධ්‍යන කටයුතු සම්පූර්ණ කරන ලදී. AHEAD ප්‍රදාන හරහා සැලකිය යුතු ක්‍රියාකාරකම් සංඛ්‍යාවක් සඳහා පහසුකම් සපයන ලදී. ස්විට්සර්ලන්තයේ ජිනීවා විශ්ව විද්‍යාලය විසින් "වඩාත්ම නව්‍ය විසඳුම" සම්මානය එක් අධ්‍යනඥයෙකුට ප්‍රදානය කරන ලදී. අධ්‍යන කාර්ය මණ්ඩලයේ දෙදෙනෙක් පර්යේෂණ ආධාර ලබාගෙන ඇත. සමහර සිසුන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ඔවුන්ගේ පර්යේෂණ සහ නව්‍ය ක්‍රියාකාරකම්වල කාර්ය සාධනය සඳහා ප්‍රදාන ලබා දෙන ලදී.

උපචිත වියදම්	12	8,667,599.39		-	
ස්වයං මූල්‍යන පාඨමාලා සහ ව්‍යාපෘති	13	6,581,915.60		3,233,340.26	
මුළු ජංගම_වගකීම්			**38,027,512.72**		**23,698,134.69**
ජංගම නොවන වගකීම්					
ගෙවිය යුතු මුදල්	14	2,321,493.10		1,857,993.10	
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්		114,589,112.25		99,152,133.14	
සීමිත අරමුදල	15	25,630,299.77		7,872,203.40	
මුළු ජංගම නොවන වගකීම්			**142,540,905.12**		**108,882,329.64**
මුළු වගකීම්			**180,568,417.84**		**132,580,464.33**
මුළු ශුද්ධ වත්කම්/හිමිකම්			**1,877,071,759.26**		**1,846,542,743.43**
වත්කම් / හිමිකම්					
සමුච්චිත අරමුදල (ප්‍රාග්ධන ප්‍රදාන)	16	694,653,297.69		694,653,297.69	
සමුච්චිත අතිරික්තය / හිඟය	16A	27,112,150.78		-	
මුළු වත්කම්/හිමිකම්			**721,765,448.47**		**694,653,297.69**
සංචිත					
පොදු සංචිතය	17	1,137,220,300.52		1,138,568,796.51	
බැඳුම්කර වගකීම් සංචිතය	18	18,086,010.27		13,320,649.23	
ශුද්ධ ප්‍රත්‍යාගණන සංචිතය	18A	-		-	
ප්‍රාග්ධන සංචිතය		-		-	
මුළු සංචිත			**1,155,306,310.79**		**1,151,889,445.74**
මුළු ශුද්ධ වත්කම්/හිමිකම්			**1,877,071,759.26**		**1,846,542,743.43**

මෙම මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත, අදාළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) සහ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවතින අනෙකුත් නීති රීතිවලට අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇති බව සහතික කරමි.

Mr.L.Ram Ramanan
Bursar

L.Ram Ramanan
Bursar
University of Vavuniya
Sri Lanka.

N.Rajavisahan
Registrar
University of Vavuniya
Sri Lanka

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම කවුන්සිලයේ සාමාජිකයින් සතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වවුනියාව විශ්වවිද්‍යාලයේ කවුන්සිලය විසින් අනුමත කරන ලදී.

Prof.T.Mangaleswaran
Accounting Officer
Vice Chancellor

Prof.T.Mangaleswaran
Vice - Chancellor
University of Vavuniya
Vavuniya, Sri Lanka.

Council Member
Signed on behalf
of the Council

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

විස්තර	සටහන	2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර	2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර
ආදායම		රුපියල්.	රුපියල්.
හුවමාරු නොවන ගනුදෙනු වලින් ලද ආදායම - පුනරාවර්තන			
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන	19	544,000,000.00	-
ශිෂ්‍ය ශිෂ්‍යාධාර සඳහා UGC ප්‍රදාන	22	31,916,000.00	-
හුවමාරු_නොවන ගනුදෙනු වලින් මුළු ආදායම - පුනරාවර්තන		**575,916,000.00**	**-**
හුවමාරු ගනුදෙනුවෙන් ලද ආදායම - පුනරාවර්තන			
වෙනත් ආදායම්	21	10,784,457.31	-
වෙනත් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ ආදායම / (වියදම්). (සීමා කළ අරමුදල)	20	-	-
විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල		-	-
හුවමාරු_ගනුදෙනුවලින් ලද මුළු ආදායම - පුනරාවර්තන		**10,784,457.31**	**-**
මුළු ආදායම - පුනරාවර්තන		**586,700,457.31**	**-**
හුවමාරු නොවන ගනුදෙනු වලින් ලද ආදායම - ප්‍රාග්ධන			
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන	19A	146,025,004.20	
තෑගි සහ පරිත්‍යාග	19B	34,369,962.96	-
හුවමාරු_නොවන ගනුදෙනු වලින් ලද මුළු ආදායම - ප්‍රාග්ධන		**180,394,967.16**	**-**
මුළු ආදායම		**767,095,424.47**	**-**
මෙහෙයුම් වියදම් - පුනරාවර්තන			
පුද්ගල වැටුප්	23	434,332,179.32	-
ගමන් වියදම්	23	437,005.41	-
සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය	23	13,944,141.05	-
අලුත්වැඩියා සහ නඩත්තුව	23	7,879,707.30	-
කොන්ත්රාත් සේවා	23	69,413,107.76	-
වෙනත් මෙහෙයුම් වියදම්	23	23,283,642.78	-
ශිෂ්‍ය ශිෂ්‍යාධාර සඳහා මූල්‍ය ආධාර	24	31,916,000.00	-
ශුද්ධ පාඩු සහ කපා හැරීම	25	11,926.86	-
පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම්	23	15,436,979.11	-
මුළු මෙහෙයුම් වියදම්		**596,654,689.59**	**-**
මෙහෙයුම් නොවන වියදම්			
ක්ෂය වීම	23	143,328,584.10	-
මුළු මෙහෙයුම් නොවන වියදම්		**143,328,584.10**	**-**
මුළු වියදම්		**739,983,273.69**	**-**
වර්ෂය සඳහා මුළු අතිරික්තය/(හිඟය)		**27,112,150.78**	**-**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්තය / (හිඟය) - පුනරාවර්තන		**(9,954,232.28)**	**-**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්තය / (හිඟය) - ප්‍රාග්ධන		**37,066,383.06**	**-**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයකි.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විස්තර	සටහන්	2022
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහයන්		රු.
කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය).		**27,112,150.78**
මුදල් නොවන අයිතම සඳහා ගැලපීම		
ක්ෂය වීම	9	143,328,584.10
තෑගි සහ පරිත්‍යාග	19 B	(33,236,092.32)
පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම	23	15,436,979.11
පෙර වර්ෂ ගැලපීම	17	(1,348,495.99)
ශුද්ධ පාඩු සහ කපා හැරීම්	25	11,926.86
ශාක හා උපකරණ බැහැර කිරීමෙ ලාභය/(අලාභය)	25	
සීමිත අරමුදලට මාරු කිරීම්	20	-
තොගයේ (වැඩිවීම)/අඩු වීම	06	(2,706,887.49)
ලැබිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම	05	2,683,461.97
විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලට මාරු කිරීම්		
ගෙවිය යුතු මුදල් වැඩිවීම /(අඩු වීම).	11,12	10,980,802.69
ආපසු ගෙවිය යුතු තැන්පතු වැඩිවීම/(අඩු වීම).	14	463,500.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**162,725,929.71**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහයන්		
බලාගාරය සහ උපකරණ නව එකතු කිරීම	09	(100,217,859.43)
නොනිමි වැඩ (වැඩිවීම)/ අඩුවීම	10	(59,085,647.87)
ආයෝජන	07, 08	(22,553,507.60)
ආයෝජන ක්‍රියාකාරකම්_වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**(181,857,014.90)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහයන්		
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන	16	-
සීමිත අරමුදල්	15	17,758,096.37
ස්වයං මූල්‍යන පාඨමාලා සහ ව්‍යාපෘති	13	3,348,575.34
බැඳුම්කර වගකීම් අරමුදල	18	4,765,361.04
මූල්‍ය ක්‍රියාකාරකම්_වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**25,872,032.75**
මුදල් හා මුදල් සමාන දෑ වැඩිවීම /(අඩු වීම).		6,740,947.56
වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	4	11,195,388.59
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	4	**17,936,336.15**

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්වීම් ප්‍රකාශය

වටිනාකම ශ්‍රී ලංකා රුපියල් වලින්

විස්තරය	ප්‍රාග්ධන දීමනාව	සමුච්චිත අතිරික්තය / ඌණතාවය	පොදු සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	බැඳුම්කර වගකීම් සංචිතය	මුළු වටිනාකම
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	694,653,297.69	-	1,253,923,033.48	(115,354,236.97)	13,320,649.23	1,846,542,743.43
අතිරික්තය / (හිඟය) (සටහන 26)		27,112,150.78				27,112,150.78
සීමා සහිත අරමුදලින් මාරු කිරීම						-
පෙර වර්ෂ ගැලපීම්			(1,348,495.99)			(1,348,495.99)
ක්ෂයවීම් ගැලපීම සඳහා පෙර වර්ෂ ප්‍රතිපාදන						-
බැඳුම්කර වගකීම/අනෙකුත් සංචිතවල වැඩි වීම					4,765,361.04	4,765,361.04
වර්ෂය තුල ප්‍රත්‍යාගණන ගැලපීම						-
ලද ප්‍රාග්ධන ප්‍රදාන						-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**694,653,297.69**	**27,112,150.78**	**1,252,574,537.49**	**(115,354,236.97)**	**18,086,010.27**	**1,877,071,759.26**

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අයවැයගත සහ සත්‍ය වටිනාකම් පිළිබඳ සංසන්දනාත්මක ප්‍රකාශය

විස්තරය	අයවැයගත	සත්‍ය
ආදායම්		
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන	570,000,000.00	544,000,000.00
අභ්‍යන්තර ආදායම්	7,750,000.00	10,784,457.31
මුළු ආදායම්	**577,750,000.00**	**554,784,457.31**
මෙහෙයුම් වියදම්		
පුද්ගලික දීමනා	460,000,000.00	434,332,179.32
ගමන් වියදම්	350,000.00	437,005.41
සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය	20,890,000.00	13,944,141.05
සුළු අලුත්වැඩියාව සහ නඩත්තුව	7,115,000.00	7,879,707.30
ගිවිසුම්ගත සේවා	66,055,000.00	69,413,107.76
වෙනත් පුනරාවර්තන වියදම්	23,340,000.00	23,283,642.78
ක්ෂය කිරීමට පෙර මුළු මෙහෙයුම් වියදම්	**577,750,000.00**	**549,289,783.62**

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. පොදු තොරතුරු

නෛතික සහ පිහිටීම

ශ්‍රී ලංකාවේ වවුනියාව විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 2021 අගෝස්තු 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අංක 2231/5 දරන ගැසට් නිවේදනය මගින් ස්ථාපිත කර ඇති රජයේ විශ්වවිද්‍යාලයක් වන අතර ශ්‍රී ලංකාවේ වවුනියාවේ පම්පයිමඩු හි පිහිටා තිබේ. දැනට විශ්වවිද්‍යාලයට පීඨ 03ක් පිහිටුව ඇත. වවුනියාව විශ්වවිද්‍යාලයේ මූල්‍යමය ක්‍රියාකාරකම් 1997 සිට 2021 දෙසැම්බර් 31 දක්වා යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියාව මණ්ඩපය ලෙස යාපනය විශ්වවිද්‍යාලය යටතේ ගිණුම්ගත කර වාර්තා කරන ලදී. වවුනියාව විශ්වවිද්‍යාලය 2021 අගෝස්තු 01 දින පිහිටුවනු ලැබුවද, 2021 අගෝස්තු 01 සිට 2021 දෙසැම්බර් 31 කාලය සඳහා වන මූල්‍ය ක්‍රියාකාරකම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක UGC/SAA-BF/F4/JFN/2021 හා 2021 ඔක්තෝබර් 04 දිනැති ලිපිය ප්‍රකාරව යාපනය විශ්වවිද්‍යාලය යටතේ වාර්තා කරන ලදී. එබැවින් යාපනය විශ්වවිද්‍යාලය විසින් 2022 ජනවාරි 1 වන දින වවුනියාව විශ්වවිද්‍යාලයට ආරම්භක ශේෂය භාර දෙන ලදී.

අරමුණ

ශ්‍රී ලංකා වවුනියාව විශ්වවිද්‍යාලය පිහිටුවන ලද්දේ ව්‍යාපාර අධ්‍යනය, ව්‍යවහාරික විද්‍යාව සහ තාක්ෂණික අධ්‍යනය යන අංශවල උසස් අධ්‍යාපනය ලබා දීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ය..

සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වවුනියාව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව සකස් කර ඇති අතර යාපනය විශ්වවිද්‍යාලය විසින් භාරදෙන ලද පරිගණකගත ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ස්ථාවර වත්කම් ලේඛන වලට ගෙන ඒමේදී ඓතිහාසික පිරිවැය පදනම මත අඛණ්ඩව භාවිතා කර ඇත. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට (SLPSAS) අනුකූලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇති ආකෘතිවලින් ඉදිරිපත් කෙරේ.

මූල්‍ය කාලය

ශ්‍රී ලංකා වවුනියාව විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාලසීමාව 2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා මාස දොළහක් නියෝජනය කරයි.

නිකුත් කිරීම සඳහා අවසර දුන් දිනය

ශ්‍රී ලංකා වවුනියාව විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2023.02.25 දින පැවති විශ්වවිද්‍යාල කවුන්සිලයේ 17 වැනි රැස්වීමෙන් අනුමත කර නිකුත් කිරීමට අවසර දෙන ලදී.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

ශිෂ්‍ය ගාස්තු සඳහා ගිණුම්කරණය

ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු, උපකාරක පංති ගාස්තු සහ වෛද්‍ය ගාස්තු මුදල් පදනම මත ගිණුම්ගත කෙරේ.

ශිෂ්‍යාධාර සඳහා ප්‍රදානය

ශිෂ්‍යාධාර සඳහා වන ප්‍රදාන පුනරාවර්තන ප්‍රදාන යටතේ ආදායමක් ලෙස පෙන්වා ඇති අතර, ශිෂ්‍යාධාර ගෙවීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1987.10.14 දිනැති එහි අංක UGC/F/BUR/87 දරන ලිපිය මගින් නියම කර ඇති පරිදි සුබසාධන සේවා වියදම් ලෙස දැක්වෙන අතර මූල්‍ය කාර්ය සාධන

ප්‍රකාශයේ සිසුන්ට මූල්‍ය ආධාර ලෙස වෙනම අයිතමයක් ලෙස වර්ගීකරණය කර ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ මහපොළ ශිෂ්‍යත්ව භාර මණ්ඩලය මහපොළ සම්පූර්ණයෙන්ම හසුරවයි.

පාරිතෝෂික සඳහා වෙන්කිරීම

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. බාහිරව ආයෝජනය කිරීමට භාණ්ඩාගාරය මූල්‍ය ප්‍රතිපාදන ලබා නොදෙන බැවින් පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ආයෝජනයෙන් නියෝජනය නොවේ. 2019 ජූනි 4 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 05/2019 අනුව කාර්ය මණ්ඩලය සඳහා ගෙවන ලද අධ්‍යන දීමනාව සහ MCA (මාසික අවදානම් දීමනාව) 2019 ජූනි 01 දින සිට බලපැවැත්වෙන පරිදි 1983 පාරිතෝෂික පනතේ අංක 12 ප්‍රකාරව පාරිතෝෂිත ගණනය කිරීම සඳහා සලකා බලනු ලැබේ.

බඩු තොග

මුලින් පැමිණි මුලින් නිකුතු (FIFO) ක්‍රමය මත පදනම්ව නියමිත ගැලපීම් සිදු කිරීමෙන් පසු පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩුම අගයට තොග දක්වනු ලැබේ. බඩු තොග අත්පත් කර ගැනීම සහ ඒවා පවතින ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමේදී දරන ලද වියදම් පිරිවැයට ඇතුළත් වේ. විශ්වවිද්‍යාලයේ බඩු තොගවලට ලිපි ද්‍රව්‍ය, පරිභෝජන ද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය, නඩත්තු සහ වෛද්‍ය අයිතමයන් ඇතුළත් වේ.

ප්‍රාග්ධන ස්වභාවයේ වියදම්

මෙම විශ්වවිද්‍යාලයේ ස්ථිර ස්වභාවයේ වත්කම් වැඩි කිරීමට හෝ වැඩිදියුණු කිරීමට දරන වියදම ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

ආදායම් හඳුනාගැනීම

වසර තුළ විශ්වවිද්‍යාලයට ලද සහ ලැබිය යුතු ආර්ථික ප්‍රතිලාභ හෝ සේවාවන්හි දළ ගලාඒමෙන් ආදායම සමන්විත වන අතර ශුද්ධ වත්කම්/හිමිකම් වල වැඩි වීමක් ඉන් සිදුවේ. SLPSAS 10 (විනිමය ගනුදෙනු සඳහා ආදායම) සහ SLPSAS 11 (විනිමය නොවන ගනුදෙනු සඳහා ආදායම) හි ස්ථාපිත නිර්ණායක අනුගමනය කරමින් විශ්ව විද්‍යාලය ආදායම හඳුනා ගනී. ස්වයං මූල්‍ය පාඨමාලා වල ආදායම සහ වියදම් මුදල් පදනම මත දක්වා ඇත. අනෙකුත් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ ආදායම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා ඇති අතර, එම ශේෂයන් අදාළ ක්‍රියාකාරකම්වල ආරම්භක ශේෂයට එකතු කර ස්වයං මූල්‍ය පාඨමාලා ලෙස ජංගම වගකීම් යටතේ පෙන්වා ඇත..

වියදම් හඳුනාගැනීම

වැඩසටහනක්/ව්‍යාපෘතියක්/වැයවිෂයක් අනුව වියදම් විශ්ලේෂණය කර ඇති අතර ඔවුන් දරන ලද කාල සීමාව තුළ පොදු වාර්තාකරණ ආකෘතියට අනුකූල වීම සඳහා UGC මාර්ගෝපදේශය මත පදනම්ව විවිධ වියදම් ශීර්ෂයන් යටතේ විශ්ලේෂණය වර්ග කර ඇත. උපාධි අධ්‍යාපනයට අදාළව දරනු ලබන සියලුම වියදම් උපචිත පදනම මත හඳුනාගෙන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

චක්‍ර ක්‍රමය යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය SLPSAS-02 අනුගමනය කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත.

ක්ෂය වීම

දේපලෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය මත සෘජු රේඛීය පදනමක් මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ක්ෂයවීම් හඳුනාගෙන ඇත. පිරියත සහ උපකරණ භාණ්ඩ මිලදී ගත් දින සිට ක්ෂය කරන අතර ඉඩම් ක්ෂය නොකරයි. අංක 649 හා 1995.10.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය සහ අංක 09/2022 දරන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව ක්ෂයවීම් පහත සඳහන් ප්‍රතිශතයන් යටතේ ගණනය කරනු ලැබේ.

ගොඩනැගිල්ල	05%
කාර්යාලීය ගෘහභාණ්ඩ	10%
කාර්යාල උපකරණ සහ ක්‍රීඩා භාණ්ඩ	20%
රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ	20%
පොත් සහ වාර සඟරා	20%
වාහන	20%
උපාධි ලෝගු	20%
දුරකථන	20%
පිරියත සහ යන්ත්‍රෝපකරණ	10%
ක්‍රීඩා උපකරණ/උපකරණ	25% (2022.05.09 දක්වා - 20%)

වගකීම් සහ වෙන්කිරීම්

වාර්තා කරන දිනයේ දී හඳුනාගන්නා ලද සියලු වගකීම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති අතර නිවැරදිව තීරණය කළ නොහැකි ප්‍රමාණය හැර පවතින බව දන්නා වගකීම් සඳහා ප්‍රමාණවත් ලෙස වෙන්කිරීම් සිදු කර ඇත.

3. මූල්‍ය ප්‍රකාශනවලට අදාළ වෙනත් සටහන්

ක්ෂයවීම් සහ පාරිතෝෂික සඳහා වෙන්කිරීම්

රු.15,436,979.11 ක මුදල් නොවන අයිතමයක් වන පාරිතෝෂික ඇතුලත්ව පුනරාවර්තන මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ හිඟය - 2022 වර්ෂය සඳහා රුපියල් 9,954,232.28 ක් වේ. එබැවින්, පුනරාවර්තන මෙහෙයුම් අතිරික්තය - රු.5,482,746.83 කි

රු.37,066,383.06 ක මුදල් නොවන අයිතමයක් වන ක්ෂයවීම් ඇතුලත්ව ප්‍රාග්ධන මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ අතිරික්තය - 2022 වර්ෂය සඳහා රු.37,066,383.06 ක් වේ. එබැවින් ක්ෂයවීම් ප්‍රාග්ධන මෙහෙයුම් අතිරික්තය - රු.180,394,967.16 කි.

පාඩු සහ කපා හැරීම

2022 වර්ෂය තුළ කවුන්සිලයේ අනුමැතිය ඇතිව පහත සඳහන් පාඩු කපා හරින ලදී

පාඩු සහ කපා හැරීම රු.11,926.86

වියදමට ඉක්මවූ ආදායම

පහත සඳහන් මුදල් නොවන අයිතම ඇතුළත් කිරීම හේතුවෙන් රු.27,112,150.78 ක වියදම ඉක්මවූ ආදායමක් ඇති විය.

1) ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම රු. 143,328,584.10
2) පාරිතෝෂික සඳහා වෙන්කිරීම රු. 15,436,979.11

වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම

2014.12.31 දිනට ස්ථාවර වත්කම් ලේඛනය ඔවුන්ගේ සත්‍යාපනය සහ ප්‍රත්‍යාගණනය මත පදනම්ව සකස් කිරීම සඳහා පවරන ලද MIS Carter De Costa Corporate Services (Pvt) Ltd විසින් සිදු කරන ලද වත්කම් සත්‍යාපනය සහ ප්‍රත්‍යාගණනය මත පදනම්ව 2021.12.31 දිනට යාපනය විශ්වවිද්‍යාලයෙන් ලද පොත් සහ වාර ප්‍රකාශ හැර අනෙකුත් සියලුම වත්කම් කාණ්ඩවල ආරම්භක ශේෂය සහ ක්ෂය වෙන්කිරීම් ගලපා සකස් කර ඇත. තවද, 2015, 2016, 2017, 2018, 2019, 2020 සහ 2021 යන වර්ෂවල එකතු කිරීම් යාපනය විශ්වවිද්‍යාලයේ ගිණුම්වලට ගෙන වවුනියාව විශ්වවිද්‍යාලයට භාර දී තිබුණ අතර 2022 වර්ෂය තුළ එකතු කිරීම් ද සැලකිල්ලට ගෙන ඇත.

වාර්තා කළ දිනට පසු සිදුවීම්

මූල්‍ය වර්ෂයෙන් පසුව සිදුවන කිසිදු ප්‍රමාණාත්මක නොවන සිදුවීම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල අමතර අනාවරණයක් අවශ්‍ය නොවේ.

2022 මූල්‍ය වර්ෂය සඳහා තෑගි සහ පරිත්‍යාග

විවිධ පරිත්‍යාගශීලින්ගේ විස්තර පහත දැක්වේ.

පරිත්‍යාගශීලින්	මුදල රු.
ඕස්ට්‍රේලියානු වෛද්‍ය ආධාර පදනම	3,319,397.50
ආචාර්ය එම් මලරාවන්	18,000.00
ටී සෝතිලිංගම් මහතා	50,000.00
පී.උදය ශෂිප්‍රියා එදිරිසිංහ	46,500.00
AHEAD	30,667,360.46
මෙලීසා ග්‍රාෆම් මහත්මිය	184,530.00
ඉංජිනේරු එන්.ශ්‍රීස්කන්ධරාජා	38,780.00
එන්.ධර්මරාජා	3,370.00
A. ගෝබිකා	400.00
ඒ නිරංජනී	450.00
එස්.ජේ.එම්මානුවෙල්	800.00
කේ.ශ්‍රී ගනේෂන්	700.00
ඇන්ටන් අරුල්රාජා	3,000.00
කේ.ශ්‍රී ගනේෂන්	400.00
ඒ පුෂ්පනාදන්	900.00
ටී සතාසිවම්	7,650.00
අයි සාන්තන්	2,000.00
ටී.සතාසිවම් මහත්මිය	1,200.00

පරිත්‍යාගශීලින්	මුදල රු.
S.R.H.Hoole	495.00
ආර් උදයානන්	2,350.00
මංගල ෆොන්සේකා	1,000.00
ඒ විජයකුමාර් මහත්මිය	500.00
අරුණ සෙල්ලතුරෙයි	600.00
එම්.ටීවායින්සි	500.00
ජී.ජෙහනාදන්	1,500.00
එන්.නගුලේෂ්වරන්	1,500.00
එස්.සන්මුගතාසන්	500.00
J. අභිලිනී	680.00
ගනේෂ්කුමාර්	600.00
එම් පද්මනාදන්	900.00
පී.මානික්කවාසකම්	1,200.00
එම්.නිලකරාජා	2,300.00
මහාචාර්ය එස්.සිවේසන්	1,550.00
ඉංජිනේරු (ආචාර්ය) එස්.එස්.සිවකුමාර්	3,850.00
ICASL	4,500.00
මුළු වටිනාකම	**34,369,962.96**

මූල්‍ය තත්ත්වය පිළිබඳ සටහන්	2022	2021
	රු.	රු.
සටහන 04 මුදල් හා මුදල් සමාන දෑ		
බැංකු ශේෂය: සීමිත අරමුදල	16,966,516.96	11,190,078.59
බැංකු ශේෂය: භාණ්ඩාගාර අරමුදල	707,154.19	-
අග්‍රිම ශේෂයන් සහ අතැති මුද්දර	262,665.00	5,310.00
	17,936,336.15	**11,195,388.59**
සටහන 05 වෙළඳාම සහ අනෙකුත් ලැබිය යුතු දෑ		
කාර්ය මණ්ඩලය සඳහා ණය සහ අත්තිකාරම්	16,043,571.97	16,270,575.48
සැපයුම් සහ සේවා සඳහා අත්තිකාරම්	31,988,310.69	40,280,979.15
ගොඩනැගිලි සඳහා අත්තිකාරම්	13,766,994.23	13,766,994.23
වෙනත්	7,764,210.00	1,928,000.00
	69,563,086.89	**72,246,548.86**
සටහන 06 ඉන්වෙන්ටරි / තොග		
ඉන්වෙන්ටරි ප්‍රධාන ගබඩාව	8,291,418.48	5,859,138.03
දෙපාර්තමේන්තු ඉන්වෙන්ටරි	943,782.31	669,175.27
	9,235,200.79	**6,528,313.30**
සටහන 07 කෙටි කාලීන ආයෝජන		
ජාතික ඉතිරිකිරීමේ බැංකුව - රඳවාගැනීම් ස්ථාවර තැන්පතු	17,411,734.82	-
	17,411,734.82	-
වර්ෂය සඳහා වැඩිවීම/(අඩු වීම).	**(17,411,734.82)**	**-**
සටහන 08 දිගුකාලීන ආයෝජන		
ආරක්ෂක තැන්පතු ආයෝජනය	274,343.10	274,343.10
විවිධ ආයෝජන	15,021,980.54	9,880,207.76
උපකුලපති සුබසාධන අරමුදල	150,000.00	150,000.00
	15,446,323.64	**10,304,550.86**
වර්ෂය සඳහා වැඩිවීම /(අඩු වීම).	**(5,141,772.78)**	**(10,304,550.86)**

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් **2022** දේපල, පිරියත සහ උපකරණ - **2022**

සටහන 09 දේපල, පිරියත සහ උපකරණ - දේපල, පිරියත සහ උපකරණ පිරිවැය

වත්කම්	**2022.01.01** දිනට ආරම්භක ශේෂය	එකතු කිරීම්	තැගි සහ පරිත්‍යාග	නොනිමි වැඩ එකතු කිරීම	පුනරුත්ථාපනය එකතු කිරීම	**2022.12.31** දිනට අවසන් ශේෂය
ඉඩම්	85,500,000.00	-	-	-	-	85,500,000.00
ගොඩනැගිලි	1,722,478,142.88	7,023,420.26	-	-	13,062,012.50	1,742,563,575.64
ක්‍රීඩා උපකරණ	3,230,366.25	-	-	-	-	3,230,366.25
කාර්යාලීය ගෘහභාණ්ඩ	63,455,904.74	9,099,514.48	3,992,531.00	-	-	76,547,950.22
කාර්යාල උපකරණ	79,252,884.04	15,333,056.50	6,252,144.10	-	-	100,838,084.64
රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ	222,521,159.83	55,215,759.58	22,692,785.36	-	-	300,429,704.77
පිරියත සහ යන්ත්‍රෝපකරණ	21,235,450.00	-	-	-	-	21,235,450.00
පොත් සහ වාර ප්‍රකාශන	27,932,919.47	57,236.11	286,705.00	-	-	28,276,860.58
මෝටර් වාහන	26,235,509.98	-		-	-	26,235,509.98
උපාධි ලෝගු, පදක්කම්	154,750.00	-		-	-	154,750.00
තොරතුරු තාක්ෂණ පද්ධතිය/මෘදුකාංග	-	350,000.00	-	-	-	350,000.00
දුරකථන (සන්නිවේදනය)	397,730.00	76,860.00	-	-	-	474,590.00
එකතුව	**2,252,394,817.19**	**87,155,846.93**	**33,224,165.46**	**-**	**13,062,012.50**	**2,385,836,842.08**

දේපල, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය වීම

වත්කම්	ආරම්භක ශේෂය **2022.01.01** දිනට	අතිරේක	ගැලපීම්	අවසන් ශේෂය **2022.12.31** දිනට
ඉඩම්	-	-	-	-
ගොඩනැගිලි	274,080,639.05	81,330,373.31	-	355,411,012.36
ක්‍රීඩා උපකරණ	2,516,764.78	231,423.53	-	2,748,188.31
කාර්යාලීය ගෘහභාණ්ඩ	25,811,487.98	6,838,072.30	-	32,649,560.28
කාර්යාල උපකරණ	52,667,590.72	13,076,929.26	-	65,744,519.98
රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ	120,059,895.91	38,021,176.99	-	158,081,072.90
පිරියත සහ යන්ත්‍රෝපකරණ	9,461,646.94	2,123,545.00	-	11,585,191.94
පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන	21,946,803.34	1,100,144.99	-	23,046,948.33
මෝටර් වාහන	23,962,649.07	536,363.69	-	24,499,012.76
උපාධි ලෝගු, පදක්කම්	20,181.09	30,950.00	-	51,131.09
තොරතුරු තාක්ෂණ පද්ධතිය/මෘදුකාංග	-	-	-	-
දුරකථන (සන්නිවේදනය)	351,939.66	39,605.03	-	391,544.69
එකතුව	**530,879,598.54**	**143,328,584.10**	**-**	**674,208,182.64**

දේපල, පිරියත සහ උපකරණවල ශුද්ධ වටිනාකම

වත්කම්	ආරම්භක ශේෂය **2022.01.01** දිනට	අවසන් ශේෂය **2022.12.31** දිනට
ඉඩම්	85,500,000.00	85,500,000.00
ගොඩනැගිලි	1,448,397,503.83	1,387,152,563.28
ක්‍රීඩා උපකරණ	713,601.47	482,177.94
කාර්යාලීය ගෘහභාණ්ඩ	37,644,416.76	43,898,389.94
පිරියත සහ යන්ත්‍රෝපකරණ	11,773,803.06	9,650,258.06
පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන	5,986,116.13	5,229,912.25
මෝටර් වාහන	2,272,860.91	1,736,497.22
උපාධි ලෝගු	134,568.91	103,618.91
තොරතුරු තාක්ෂණ පද්ධතිය/මෘදුකාංග	-	350,000.00
දුරකථන	45,790.34	83,045.31
එකතුව	**1,721,515,218.65**	**1,711,628,659.44**

සටහන 10 නොනිමි වැඩ		
ආරම්භක ශේෂය	141,644,776.90	141,644,776.90
පුනරුත්ථාපන - නොනිමි වැඩ	15,688,410.60	15,688,410.60
වසර තුළ එකතු කිරීම්	59,085,647.87	-
වර්ෂය තුළ මාරු කිරීම (ගොඩනැගිල්ල)	-	-
	216,418,835.37	**157,333,187.50**
සටහන 11 ගෙවිය යුතු දෑ		
විවිධ ණයහිමියෝ	22,032,048.80	19,486,305.30
වෙනත්	745,948.93	978,489.13
	22,777,997.73	**20,464,794.43**
සටහන 12 උපචිත වියදම්		
උපචිත වියදම්	8,367,599.39	-
උපචිත සඳහා වෙන්කිරීම්	300,000.00	-
	8,667,599.39	-
සටහන 13 ස්වයං මූල්‍යන පාඨමාලා සහ ව්‍යාපෘති (ගෙවිය යුතු)		
ICICVC - ආදායම	1,551,847.82	1,701,601.45
VCARS - ආදායම	16,768.50	16,768.50
M.E.D (Dev.Fund -Batch IV) ආදායම	170,616.06	236,616.09
VCIRS - ආදායම	414,200.79	414,200.79
වන්නි වෘත්තීය පොළ 2018 ආදායම	25,000.00	25,000.00
පර්යේෂණ සම්මන්ත්‍රණය - F/Business Studies (RCBS)	24,160.17	59,670.17
ගුරුවරුන් සඳහා ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ සහතිකපත්‍ර පාඨමාලාව	367,083.00	367,083.00
ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව-UOV 2021	61,495.00	346,500.00
නවක වදය සහ SGBV මර්දනය සඳහා මැදිහත්වීම්	28,900.26	28,900.26
ශිෂ්‍යත්ව වැඩසටහන - UGC	(50,000.00)	-
සුදුසුකම් ඇති සිසුන්ට ශිෂ්‍යත්ව	252,015.00	-
UOV සමගි මධ්‍යස්ථානයේ කුවිතාන්සි	464,820.00	-
වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළුව	233,680.00	-
භූ දර්ශනය සහ හරිත පරිසරය සංවර්ධනය	135,000.00	-
ඔසු සහ ස්වභාවික උද්‍යාන ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම	391,950.00	-
පර්යේෂණ සම්මන්ත්‍රණය - ව්‍යවහාරික විද්‍යා පීඨය (RARS 2022)	7,769.00	37,000.00
ආබාධිතයන් සඳහා උපකාරක මධ්‍යස්ථානය - ලැබීම්	576,000.00	-
M.E.D (Development Fund -Batch VI) ආදායම	1,851,200.00	-
පර්යේෂණ සමුළුව- F/TS (RCAICT-2022) ආදායම	93,600.00	-
රිදී ජුබිලි සැමරුම FAS	(34,190.00)	-
	6,581,915.60	**3,233,340.26**
වර්ෂය සඳහා වැඩිවීම/(අඩුවීම)	**3,348,575.34**	**3,233,340.26**

සටහන 14 ගෙවිය යුතු දෑ		
ආපසු ගෙවිය යුතු තැන්පතු		
ආරක්ෂක තැන්පතු (කාර්ය මණ්ඩලය)	280,993.10	279,993.10
රසායනාගාර තැන්පතු	1,900,500.00	1,458,000.00
ආපසු ගෙවිය යුතු ආපනශාලා තැන්පතු	140,000.00	120,000.00
	2,321,493.10	**1,857,993.10**

සටහන 15 සීමා කළ අරමුදල සහ විශේෂිත අරමුදල		
සංවර්ධන අරමුදල	1,652,062.30	1,584,347.33
ඉතුරුම් ආයෝජන පොලී	1,336,662.64	1,112,366.06
තෑගි සහ පරිත්‍යාග	4,640,911.64	4,640,911.64
උපකුලපති සුබසාධන අරමුදල	588,928.37	534,578.37
සීමා කළ අරමුදල (රඳවා ගැනීම) 15.1	17,411,734.82	-
	25,630,299.77	**7,872,203.40**
වර්ෂය සඳහා වැඩි කිරීම/(අඩු වීම)	**17,758,096.37**	**7,872,203.40**

15.1 - සීමිත අරමුදල (රඳවා ගැනීම)

2021 වර්ෂය දක්වා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් යාපනය විශ්වවිද්‍යාලය විසින් මෙහෙයවන ලදී. ගෙවිය යුතු රඳවාගැනීම් මුදල් යාපනය විශ්වවිද්‍යාලය විසින් චෙක්පතක් මගින් භාර දෙන ලදී. එය 2021 දෙසැම්බර් 31 වන දිනට ශේෂ පත්‍රයට ඇතුළත් කර නොතිබුණි.

සටහන 16 සමුච්චිත අරමුදල (ප්‍රාග්ධන ප්‍රදාන)		
වියදම් දරන ලද ප්‍රාග්ධන ප්‍රදාන	571,212,955.03	571,212,955.03
වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන	-	-
ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය	66,711,175.30	66,711,175.30
ප්‍රාග්ධන ලැබීම්	56,729,167.36	56,729,167.36
	694,653,297.69	**694,653,297.69**
වර්ෂය සඳහා වැඩිවීම් /(අඩු වීම).	**-**	**694,653,297.69**

16A සමුච්චිත අතිරික්තය /(හිඟය)		
ආරම්භක ශේෂය	-	-
ප්‍රවර්තන වසරේ ශේෂය	27,112,150.78	-
ක්ෂයවීම් ගැලපීම සඳහා පෙර වර්ෂයේ ප්‍රතිපාදන		-
සීමා කරන ලද අරමුදලට මාරු කිරීම්	-	-
	27,112,150.78	-

සටහන 17 පොදු සංචිතය	1,253,923,033.48	1,253,923,033.48
ආරම්භක ශේෂය		
ආදායම / වියදම් අතිරික්තය (අතිරික්තය)	-	
පෙර වර්ෂ ගැලපීම්	(1,348,495.99)	
ගැලපීමට පෙර අවසන් ශේෂය	**1,252,574,537.49**	**1,253,923,033.48**

ප්‍රාග්ධන අඩු කිරීම	- 17.2	(115,354,236.97)	(115,354,236.97)
අවසන් ශේෂය		**1,137,220,300.52**	**1,138,568,796.51**

17.2 - ප්‍රාග්ධනය අඩු කිරීම

2015 වර්ෂයේ යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියාව මණ්ඩපය යටතේ සිදු කරන ලද ප්‍රත්‍යාගණනය තක්සේරුවෙන් ප්‍රාග්ධන අඩුකිරීම් හෙළිදරව් කිරීම සඳහා ප්‍රත්‍යාගණන සංචිතයක් නොමැත.

සටහන 18 බැඳුම්කර වගකීම - සංචිතය		
ලැබීම්	14,097,660.81	9,869,208.02
ලැබිය යුතු		
ලද පොලිය	3,988,349.46	3,451,441.21
	18,086,010.27	**13,320,649.23**
වර්ෂය සඳහා වැඩිවීම් /(අඩු වීම).	**4,765,361.04**	**13,320,649.23**
සටහන 18A ප්‍රත්‍යාගණන සංචිතය		
ආරම්භක ප්‍රත්‍යාගණන අතිරික්තය	-	-
ප්‍රත්‍යාගණන ශුද්ධ ඌණතාවය		
	-	-

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සඳහා සටහන්	2022 රු.	2021 රු.
සටහන 19 - පුනරාවර්තන ප්‍රදාන		
භාණ්ඩාගාර ප්‍රදාන	544,000,000.00	-
	544,000,000.00	**-**
සටහන 19 A - ප්‍රාග්ධන ප්‍රදාන		
තත්ත්ව ශක්තිමත් ප්‍රදාන	-	-
තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සඳහා අරමුදල්	-	-
කලා පුස්තකාලයේ හා තොරතුරු තාක්ෂණ තත්ත්වය ශක්තිමත් කිරීම	13,713,913.00	-
අතිරේක සිසුන් බඳවා ගැනීම	54,811,091.20	-
ප්‍රාග්ධන ප්‍රදාන	77,500,000.00	-
	146,025,004.20	**-**
සටහන 19 B - පරිත්‍යාග		
හිතවතුන්ගෙන් ලද පොත් පරිත්‍යාග	286,705.00	-
හිතවතුන්ගෙන් ලද උපකරණ පරිත්‍යාග	50,000.00	-
ඔස්ට්‍රේලියානු වෛද්‍යාධාර පදනම්න් ලද පරිත්‍යාග	1,315,000.00	-
හිතවතුන්ගෙන් ලද විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ පරිත්‍යාග	46,500.00	-
AHEAD වෙතින් ලද පරිත්‍යාග - වත්කම්	30,667,360.46	-
ඔස්ට්‍රේලියානු වෛද්‍යාධාර ආධාර පදනමෙන් ලද ප්‍රාග්ධන වියදම්	2,004,397.50	-
	34,369,962.96	**-**
සටහන 20 - වෙනත් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ ආදායම/(වියදම්).		
	-	**-**
	-	**-**
සටහන 21- වෙනත් ආදායම්		
ආයෝජන පොලී	-	-
ණය සහ අත්තිකාරම් පොලී	635,375.57	-
දේපල කුලි	1,009,840.00	-
නේවාසිකාගාරය කුලි	2,799,800.00	-
ලියාපදිංචි ගාස්තු - උපාධි අපේක්ෂක	455,250.00	-
වෛද්‍ය ගාස්තු	654,650.00	-
විභාග ගාස්තු - උපාධි අපේක්ෂක	821,750.00	-
පුස්තකාලය දඩ	4,510.00	-
විවිධ ලැබීම්	4,320,536.74	-
පැරණි ගබඩා භාණ්ඩ විකිණීම	82,745.00	-
	10,784,457.31	**-**
සටහන 22 සිසුන් සඳහා මූල්‍යාධාර සඳහා ප්‍රදාන		
ශිෂ්‍යාධාර	31,916,000.00	-
මහපොළ භාණ්ඩාගාර සංරචකය	-	-
මහපොළ භාර සංරචකය	-	-
	31,916,000.00	**-**
සටහන 23 මෙහෙයුම් වියදම් (විස්තර 23A හි පෙන්වා ඇත)		-
පුද්ගල වැටුප්	434,332,179.32	-
ගමන් වියදම්	437,005.41	-
සැපයුම්	13,944,141.05	-
නඩත්තු	7,879,707.30	-
කොන්ත්‍රාත් සේවා	69,413,107.76	-
ක්ෂය වීම	143,328,584.10	-
පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම්	15,436,979.11	-
වෙනත් මෙහෙයුම් වියදම්	23,283,642.78	-
	708,055,346.83	**-**

සටහන 24 සිසුන්ට මූල්‍යාධාර ගෙවීම		
ශිෂ්‍යාධාර	31,916,000.00	-
මහපොළ භාණ්ඩාගාර සංරචකය	-	-
මහපොළ භාර සංරචකය	-	-
	31,916,000.00	**-**
සටහන 25 පාඩු හා කපා හැරීම්	11,926.86	-
කපා හැරීම්	**11,926.86**	**-**
	27,112,150.78	-
සටහන 26 අතිරික්තය/(හිඟය)	-	-
අතිරික්තය/(හිඟය)	**27,112,150.78**	**-**

වැය විෂය අනුව සත්‍ය වියදම් - 2022

වැය විෂය අංකය	වැය විෂය විස්තරය	සත්‍ය වියදම් - 2022	සත්‍ය වියදම් - 2021
1	**පුද්ගලික පඩිනඩි**	**434,332,179**	**361,216,018**
1101	(I) වැටුප් සහ වේතන	169,425,401	139,530,199
	(II) විශ්‍රාම වැටුප 08%	18,135,456	16,429,609
	(III) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් දායකත්වය	24,159,948	21,711,428
	(IV) සේවක භාරකාර අරමුදල් දායකත්වය 03%	8,458,330	7,628,209
	(V) පාරිතෝෂික ගෙවීම්	3,475,548	1,334,244
1102	අතිකාල සහ නිවාඩු ගෙවීම්	1,602,935	1,722,907
1103	(I) 20% විශේෂ වැටුප් දීමනාවක	24,182,639	21,763,042
1103	(II) මාසික දීමනාව	12,942,561	-
1106	භාහිර දේශන ගාස්තු (ගමන් වියදම් ඇතුළුව)	1,475,768	639,172
1108	මාසික අවදානම් දීමනාව (MCA)	24,519,560	23,268,784
1109	(I) වෙනත් දීමනා (වැය ශීර්ෂ දීමනා)	868,298	635,695
	(II) සංග්‍රහ දීමනාව	1,657,811	1,264,287
1112	(I) ජීවන වියදම් දීමනාව (CLA)	20,205,492	18,893,929
	(II)වැඩ බලන වැටුප්	357,689	273,532
1115	අධ්‍යයන දීමනාව	94,418,952	81,890,467
1117	35% පර්යේෂණ දීමනාව	22,123,360	19,890,885
1127	දේපල ණය පොලී	-	156,309
1128	ප්‍රවාහන දීමනාව	5,556,875	3,280,143
1131	සන්නිවේදන දීමනාව	765,557	903,177
2	**ගමන් වියදම්**	**437,005**	**198,020**
1201	ගමන් වියදම් (දේශීය)	256,343	32,960
1202	ගමන් වියදම් (විදේශීය)	180,662	165,061
3	**සැපයුම් සහ පරිභෝජන භාණ්ඩ**	**13,944,141**	**12,570,110**
1301	ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	3,589,630	2,991,586
1302	ඉන්ධන සහ ලිහිසි තෙල්	5,597,575	1,787,417
1303	නිල ඇඳුම් (මැහුම් ගාස්තු ඇතුළුව)	266,795	140,986
1304	(I) යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ	1,481,764	3,295,773
	(II)රසායනික සහ වීදුරු භාණ්ඩ	265,555	66,660
1305	වෛද්‍ය සැපයුම්	1,074,266	376,820
1309	වෙනත් සැපයුම්	1,668,557	3,910,867
4	**සුළු අලුත්වැඩියා සහ නඩත්තු**	**7,879,707**	**3,863,427**
1401	සුළු අලුත්වැඩියා සහ නඩත්තු		
	(I) වාහන	1,635,418	1,263,829
	(II) පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	2,467,589	1,625,913
1402	සුළු අලුත්වැඩියා සහ නඩත්තු		
	(I) ගොඩනැගිලි සහ ව්‍යුහය	3,712,750	903,684
	(II) ගෘහ භාණ්ඩ	41,320	70,000
	(III) වෙනත්	22,630	-

වැය විෂය	වැය විෂය විස්තරය		සත්‍ය වියදම් - 2022	සත්‍ය වියදම් - 2021
5	**ගිවිසුම්ගත සේවා**		**69,413,108**	**50,596,483**
	1501	ප්‍රවාහන	-	-
	1502	***සන්නිවේදන***		
		(i) විදුලි සංදේශ	10,811,386	9,127,883
		(ii) තැපැල් ගාස්තු	405,706	225,450
	1503	**උපයෝගිතා**		
		(i) විදුලිය	17,470,397	9,210,540
		(ii) ජලය	40,518	39,542
	1504	**කුලී සහ කුලියට ගැනීම් ගාස්තු**	1,651,588	756,100
	1505	**වරිපණම් සහ දේශීය බදු**	519,829	496,744
	1506	**මුද්‍රණ සහ ප්‍රචාරණ**		
		(i) මුද්‍රණය	2,173,040	628,199
		(ii) දැන්වීම	755,167	1,216,674
	1507	**වෙනත් කොන්ත්‍රාත් සේවා**		
		(i) ආරක්ෂක සේවා	22,120,067	18,546,158
		(ii) පිරිසිදු කිරීමේ සේවා	12,907,960	10,092,393
		(iii) වෙනත් සේවා	557,450	256,800
6	**වෙනත් පුනරාවර්තන වියදම්**		**23,283,643**	**10,070,675**
	1601	දායකත්වය, දායකත්ව සහ සාමාජික. ගාස්තු - දේශීය	100,000	250,000
	1602	දායකත්වය දායකත්වය සහ සාමාජික. ගාස්තු - විදේශ	144,818	85,031
	1607	ශාස්ත්‍රීය පර්යේෂණ සහ ප්‍රකාශන	-	
	1608	කාර්ය මණ්ඩල සංවර්ධන-වැඩමුළු සහ සම්මන්ත්‍රණ	392,000	75,100
		- සම්මන්ත්‍රණ	-	
	1609	වෙනත් ආයතන වලට දී මනා (වෙනත් පුනරාවර්තන දීමනා)	316,965	
	1610	සම්මාන සහ වන්දි	10,000	
	1611	පාඩු සහ කපා හැරීම	-	
	1612	නිවාඩු බලපත්‍ර සහ වාර ප්‍රවේශපත්	293,990	20,600
	1613	විශේෂ සේවා	-	
		(I) විගණන ගාස්තු	300,000	
		(II) සහා සාමාජිකයින්ගේ ගාස්තු ආදිය,	2,215,968	791,500
	1614	(I) උපාධි ප්‍රදානෝත්සවය	-	
	1615	සංග්‍රහ වියදම්	1,813,125	298,126
	1616	(I) වෙනත් පුනරාවර්තන වියදම්	6,087,697	3,785,383
		(II) බැංකු ගාස්තු	-	
	1617	විභාග වියදම්	8,401,835	4,721,185
	1618	පශ්චාත් උපාධි පර්යේෂණ සහ ශිෂ්‍යත්ව	-	
	1619	සිසුන් සඳහා පාඨමාලා ද්‍රව්‍ය සහ ඉගෙනුම් ගුණත්ව වැඩිදියුණු කිරීම	-	
	1620	කර්මාන්ත සීමාවාසික, ප්‍රායෝගික සහ වෘත්තීය මාර්ගෝපදේශ	-	
	1621	කාර්ය මණ්ඩල සංවර්ධනය -ගුරුවරුන්, පරිපාලන සහ අනෙකුත් සේවකයින් සඳහා පුහුණුව	1,857,915	15,000
	1622	ශිෂ්‍ය සංවර්ධන ආරම්භ කිරීම හා ප්‍රජා සබඳතා	-	
	1623	විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතු	1,130,900	28,750
	1624	ශිෂ්‍ය සුභසාධනය, සේවක සුභසාධනය, ශිෂ්‍ය සහා සහ සමාජ සංහිදියාව	-	
		සේවක සුභසාධනය සහ වෛද්‍ය රක්ෂණය	-	
	1625	ආයතනික සැලසුම්කරණය, පාලනය සහ ප්‍රවේශ	-	
		දේපල ණය සඳහා පොලී සහනාධාරය	218,430	
විශ්වවිද්‍යාල උප අග්‍රිම සහ ආදායම් වලින් දරන ලද වියදම්			**548,989,784**	**438,514,732**
		වෙනත් පුනරාවර්තන	**114,657,604**	**77,298,714**

10 විගණකාධිපති වාර්තාව

ලිපි අංක. NPCG/VN/D/UOV/01/22

ලිපියේ දිනය. 04 ඔක්තෝබර් 2023

උප කුලපති,

වවුනියාව විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වේ 154(6) ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළු වවුනියාව විශ්වවිද්‍යාලයේ කටයුතු පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.

ඉහත වාර්තාව 2023 ඔක්තෝබර් 04 වැනි දින භාෂා 03කින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර ඊට අදාළ මෘදු පිටපත් ජාතික විගණන කාර්යාලයේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධියට පත් කර ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති සඳහා

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

වව්නියාව විශ්වවිද්‍යාලයේ(“විශ්වවිද්‍යාලය”) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.5.1 ලැබිය යුතු ගිණුම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වූ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දෙදෙනකු එම වැඩසටහන් නිමවීමෙන් පසු නැවත සේවයට වාර්තා කර නොතිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 22,679,125 ක් වූ බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට විශ්වවිද්‍යාලය නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මෙම හිඟ මුදල් සේවක පාරිතෝෂික දීමනාවලින් හැකි ඉක්මනින් අයකර ගැනීමට පියවර ගෙන ඇත.	බැඳුම්කර ගිවිසුම අනුව අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571(2)	වසර 2 සිට වසර 7 දක්වා කාලපරිච්ඡේදයට අදාලව ආපසු ගෙවිය යුතු රසායනාගාර තැන්පතු, කාර්ය මණ්ඩල ආරක්ෂක තැන්පතු, රදවා ගැනීමේ මුදල් සහ ආපනශාලා ටෙන්ඩර් තැන්පතු එකතුව රු.1,254,831 ක් නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.	ආපසු ගෙවිය යුතු තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය.
(ආ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3 වගන්තිය	විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම තහවුරු කර නොගෙන සමාලෝචිත වර්ෂය තුල දී වැටුප් හා දීමනා ලෙස රු.289,076,447ක් ගෙවා තිබුණි.	ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිවල අධ්‍යයන කාර්ය මණ්ඩලය සාමාන්‍යයෙන් පැමිණීමේ ලේඛනයේ අත්සන් කරනු නොලැබේ.	ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය.

(ඇ)	2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03(X) වගන්තිය	මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට 2022 දෙසැම්බර් 31 දින දක්වා ණය පහසුකම් ලබාදීම අත්හිටුවා තිබියදී අවස්ථා 04කදී එකතුව රු.1,000,000 ක මුදලක් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට ආපදා ණය වශයෙන් ලබා දී තිබුණි.	ආපදා ණය අරමුදල චක්‍රීය අරමුදලක් ලෙස සලකා ණය ආපසු අයකර ගැනීමෙන් සියලුම ආපදා ණය ගෙවා ඇත.	චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය.
(ඈ)	1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	විශ්වවිද්‍යාලය විසින් 2021 සහ 2022 වර්ෂවල පවත්වන ලද විභාග 27කට අදාළ ප්‍රතිඵල නිකුත් කිරීම මාස 01 සිට මාස 08 දක්වා කාලයක් ප්‍රමාද වී තිබූ අතර විභාග 15කට අදාළ ප්‍රතිඵල 2023 මාර්තු 29 දින දක්වාම නිකුත් කර නොතිබුණි.	සෙනෙට් සභාව සහ පාලක සභාව විසින් ප්‍රතිඵල නිකුත් කිරීමේ මාසික ප්‍රගතිය නිරීක්ෂණය කරමින් නියමිත කාල සීමාව තුළ විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කර ඇත.	චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.27,112,151ක අතිරික්තයක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කිසිදු බදු ගිවිසුමකට එළඹීමකින් හෝ කිසිදු ගාස්තුවක් අය කිරීමකින් තොරව රාජ්‍ය බැංකු දෙකක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර දෙකක් 2018 සහ 2019 වර්ෂවල විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ස්ථාපිත කර තිබුණි.	මූලික අදියරේදී බැංකුව විසින් කුලී ඉවත් කරන ලෙස ඉල්ලා සිටින ලදී. එසේ වුවද ඉඩම් තක්සේරු වාර්තා මත පදනම්ව ඉඩම සඳහා බැංකුවෙන් කුලිය අය කිරීමට කටයුතු ආරම්භ කර ඇත.	විශ්වවිද්‍යාලයට ආදායම උත්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	විශ්වවිද්‍යාලය පිහිටා ඇති අක්කර 65 ක ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කළමනාකාරීත්වය අපොහොසත් වී තිබුණි.	ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට වවුනියාව විශ්වවිද්‍යාලය ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත. මෙම ක්‍රියාවලිය සභාව විසින් අධීක්ෂණය කරනු ලබන අතර දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් සහ අදාළ බලධාරීන් සමඟ වරින් වර රැස්වීම් පවත්වනු ලැබේ.	ඉඩමේ අයිතිය විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

10.1 වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් පාලන අධිකාරියේ නිරීක්ෂණය.

දිනය: 2023 අගෝස්තු 28

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය, අංක
306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකාව.

Ref: වවුනියාව විශ්වවිද්‍යාලයේ දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 31 දෙසැම්බර් 2022 සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව වන 12 දරන ජාතික විගණන පනතේ 19 අංක 2018 වගන්තිය ප්‍රකාරවවිගණකාධිපති වාර්තාව

2022 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2023 මැයි 31 දිනැති අංක NPCG/VN/D/UOV/1/22 දරන සවිස්තරාත්මක විගණන වාර්තාවට අදාළ පැහැදිලි කිරීම් පහත පරිදි ඉදිරිපත් කෙරේ. මෙම වාර්තාව විගණන හා කළමනාකරණ කමිටුවේදී සහ කවුන්සිලයේදී දැඩි ලෙස සාකච්ඡා කර තිබුණි. පසු විපරම් ක්‍රියාමාර්ගය නිතිපතා ගනු ලැබේ.

- විගණන මතය.
- මතය සඳහා පදනම

2.2.2 වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

(අ) මූල්‍ය රෙගුලාසි 571

- ආපසු ගෙවිය යුතු විද්‍යාගාර තැන්පතු උපාධි පාඨමාලාව අවසන් කළ සිසුන්ගෙන් ලැබෙන ආදායමක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කර ඇති අතර උපාධි පාඨමාලාව හදාරන සිසුන්ගේ තැන්පතු සඳහා උපාධි පාඨමාලාව හැදෑරීමෙන් පසු පියවර ගැනේ.
- යාපනය විශ්වවිද්‍යාලයට මාරු වූ කාර්ය මණ්ඩලයේ ආපසු ගෙවිය යුතු කාර්ය මණ්ඩල ආරක්ෂක තැන්පතු ඔවුන්ගේ ඉල්ලීම මත ගෙවීම් කිරීමට කටයුතු කර ඇත.
- හිමිකම් නොපෑ ආපසු ගෙවිය යුතු ආපනශාලා තැන්පතු, ආදායම ලෙස හඳුනා ගැනීමට කටයුතු කර තිබේ.

(ආ) අංක 03/2022 හා 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය.

- ආපදා ණය අරමුදල චක්‍රීය අරමුදලක් ලෙස සලකා අයකරගත් ණය මුදලින් සියලුම ආපදා ණය ගෙවා ඇත. මෙම ණය සඳහා මෙම වසරේ භාණ්ඩාගාරයේ පුනරාවර්තන අග්‍රිම කිසිවක් භාවිතා කර නොමැත. එබැවින් ණය අයකර ගැනීම් භාවිතා කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය අවබෝධයෙන් සිටින අතර දැන් අප මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට ආපදා ණය ලබාදීම නවතා දමා ඇත.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 03 වගන්තිය.

- අධ්‍යන කාර්ය මණ්ඩලය පැමිණීමේ ලේඛනයට අත්සන් නොකිරීම රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ සාමාන්‍ය ක්‍රමය වේ. විකල්පයක් ලෙස, අපි දැනටමත් අධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා වැඩ කිරීමේ සම්මතයන් ස්ථාපිත කර ඇති අතර අප වගවීමේ ආකෘතිය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටින බව.

(ඈ) 1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය

- ප්‍රතිඵල නිකුත් කිරීමට Covid 19 සහ ආර්ථික අර්බුදය ආදී කරුණු දැඩි ලෙස බලපෑම හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුකූල වීමට විශ්වවිද්‍යාලයට නොහැකි විය. සෙනෙට් සභාව සහ පාලක සභාව විසින් ප්‍රතිඵල නිකුත් කිරීමේ මාසික ප්‍රගතිය නිරීක්ෂණය කරමින් නියමිත කාල සීමාව තුළ විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කර ඇත.

2.5 වෙනත් කරුණු

- ඉඩම් තක්සේරු වාර්තා මත පදනම්ව ඉඩම සඳහා බැංකුවෙන් කුලිය අය කිරීමට කටයුතු ආරම්භ කර ඇත.
- සේවකයින් දෙදෙනෙකුගෙන් පහත පරිදි බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට කටයුතු කර ඇත.
    - තරණි මහත්මිය (අනධ්‍යන) දැනටමත් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ශේෂය වන රු.495,690.00 වෙතින් අයකර ගැනීමට කැමැත්ත ලබා දී ඇත.
    - දුෂ්‍යන්ති මහත්මිය (අධ්‍යන) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ශේෂය, පාරිතෝෂිකය සහ හිඟ වැටුප් ප්‍රමාණයෙන් අයකරගෙන ඇත. සේවකයා බැඳුම්කරය පියවීමට එකඟ වූ බැවින්, 2023 මැයි 02 වැනි දින සිට සමාන වාරික දොළහකින් වසරක් ඇතුළත ශේෂය රු.22,183,434.90 පියවීමට විශ්වවිද්‍යාලය ඉල්ලීම් කර ඇත.
- ඉඩමේ අයිතිය ඉල්ලා සිටීමට අපොහොසත් වීම
    - අදාළ බලධාරීන් සමඟ ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

මහාචාර්ය ටී.මංගලේශ්වරන්

උප කුලපති,

වවුනියාව විශ්වවිද්‍යාලය